සැඟවුණු බොදු මග යළි පුබුදන

# හෙළ බොදු පියුම

ශ්‍රී බු. ව. 2558ක් වූ බක් මස (ව්‍යවහාරික වර්ෂ 2015 අප්‍රේල්)

42 වෙනි කලාපය




## වාස්තු විද්‍යාවේ හේතු ඵල සම්බන්ධය දහම් ඇසින්...

රු. 20/-

සැඟව ගිය බොදු මග යළි රැගෙන සෑම පුන් පොහෝ දිනකම එළිදකින දහම් සංග්‍රහය

# සක්මන් භාවනා...







සක් නම් මනස පිරිසිදු කර දෙන වේදේ
දැක්මකි නැණින් බුදු හිමියන් දෙසු නාදේ
එක් තැන නොපවතින ලොව බිඳී බිඳී සෑදේ
දුක් දෙන හේතු දුටුවොත් සක්මන සෑදේ

නමට කරන සක්මන් ඇත ලොව ඉන්න
භවට බැඳුණු බැමි ඉන් බැහැ ගලවන්න
කයට නෙවෙයි හිතටත් සුව ගෙන දෙන්න
බිමට තියන පා සක්මන දැන ගන්න

ගෙවමින් දෙපා යන සක්මන් ලොවේ වෙතී
නොවමින් කෙළෙස් පහ සිරුරට සුවේ දෙතී
සෙවණින් දහම් සැනසීමට දෙසා ඇතී
නිවනින් මෙපිට සක්මන් භාවනා නැතී

නිදිමත හැර අහර නිසි ලෙසටද දිරවා
බැඳී සිත සමාධිය දිගු කලකට හරවා
විඳිනට තියෙන දුක දකිනට ඇස ඇරවා
කෙදිනක කොතැන නිවනට මග ඇත කරවා

සක්මන් කළත් තිලකුණ නම් සිතෙහි දරා
ඉක්මන් කරල යා යුතු වෙයි නිවන කරා
නික්මෙන්නට කලින් මේ කුණු සිරුර හැරා
දැක්මෙන් දත යුතුයි සක්මන් අරුත පෙරා

නිවනට සවිය දෙන සක්මන හැඳින ගෙන
භවයට බැඳෙන බැමි බිඳලිය යුතුය දැන
සුවයට කය මනස දෙකටම සහය දෙන
දවසට කළත් එක වරකද වැඩෙති නැණ

ඉරියව් හතර නොව නිවනට මග වන්නේ
හරියට ලොවේ ඇති තතු නැණසට ගන්නේ
සරිලන ලෙසට ගත් ඉරියව් සුව දෙන්නේ
අරි දම් වැඩුන විට නිවනට පිළි පන්නේ

ඝන යන හැඟුම දුරු කරනට දහම සතු
වැනසෙන හැදෙන හේතුවෙ ඵල දැකිය යුතු
තැන තැන තබන ඔසවන පය නියම තතු
දින දින කරන සක්මන දෙයි නිවන මතු

පබැඳුම
නිතිඥ චන්දන සිරිවර්ධන

# රහතුන්ගේ උදම් වැකි

**2 වන කොටස**

සාරාසංඛ්‍ය කල්ප ලක්ෂයකට පෙර ලොව පහල වුන දීපංකර බුදුන් වහන්සේගෙ විවරණයෙන් පසුව, නොවිඳිනා දුක් ඉවසා දරාගෙන සමතිංසත් පාරමී ධර්ම (දස පාරමිතා, දස උප පාරමිතා, දස පරමත්ථ පාරමිතා) පූර්ණ කරගෙන, මේ මහා භද්‍ර කල්පයේ ගෞතම නමින් මහා උත්තමයෙක් ලොව්තුරා සම්මා සම්බුද්ධත්වයට පත් වුනා. උන් වහන්සේ මේ මහා භද්‍ර කල්පයේ ලොව පහළ වූ හතර වෙනි සම්මා සම්බුදුවරයන් වහන්සේ. සාමාන්‍ය මනසකට ගෝචර නොවන, උපමාවකින් පවා කියන්න අමාරු අප්‍රමාණ කාලයක් කරපු උත්සාහයක ප්‍රතිඵලයක් තමයි උන් වහන්සේ ඒ විදියට ලැබුවෙ. රාග ගින්නෙන්, ද්වේශ ගින්නෙන්, මෝහ ගින්නෙන් දැවුණු මනසක් නියත වශයෙන්ම නිවුනු අවස්ථාවකට උන් වහන්සේ පත් වුනේ. උත්සාහයේ උපරිම ප්‍රතිඵලය ලබපු, මහා සැනසීම අත් විඳපු උන් වහන්සේ ඒ සැනසීම, ජයග්‍රහණය සැමරුවෙ උදාන වාක්‍යයක් ලෝකයට දේශනා කරල. මහා ගැඹුරු සර්වඥතා ඥානයෙන් උන් වහන්සේ ඒ ලබපු සැනසීම විස්තර කළේ මේ විදියට.

**අනේක ජාති සංසාරං**
**- සන්ධාවිස්සං අනිබ්බිසං**
**ගහකාරකං ගවේසන්තෝ**
**- දුක්ඛා ජාති පුනප්පුනං**

**ගහකාරක දිට්ඨෝසි**
**- පුන ගේහං න කාහසි**
**සබ්බා තේ ඵාසුකා භග්ගා**
**- ගහකූටං විසංඛිතං**
**විසංඛාරගතං චිත්තං**
**- තණ්හානං ඛය මජ්ඣගා**

(ධම්ම පදය, ජරා වග්ගය)

සරල සිංහල තේරුම,

**භවයෙහි නැවත නැවත ඉපදීම දුකකි. ඒ නිසා මේ අත්බැව නමැති ගෙය සාදන වඩුවා සොයමින් මම ඔහු (තණ්හාව නමැති වඩුවා) දක්නා නුවණ (චතුරාර්ය සත්‍යය දකින නුවණ) නොලබමින් සසර නොයෙක් ජාතිවල ඔබ මොබ දුව ඇවිද්දෙමි.**

අත්බැව් නමැති මේ ගෙය හදන තණ්හාව නමැති වඩුව, මා විසින් දැන් නුඹ දක්නා ලද්දෙහිය. ඒ නිසා නැවත නුඹ මට අත්බැව් නමැති ගෙයක් නොහදන්නෙහිය. ඔබගේ සියලු කෙලෙස් නමැති මුදුන හෙවත් පරාල මා විසින් බිඳ දමන ලදී. එහි අවිද්‍යා නමැති කැණි මඬලද සුනු විසුනු කරන ලදී. දැන් මාගේ සිත නිවනට පිවිසියේය. තණ්හාව නැති කොට රහත් බවට පැමිණියෙමි.



උන් වහන්සේගෙ මහා ප්‍රඥාවෙන්, සිවු පිළිසිඹියා ඥානයෙන් නැගුණ ඒ උදාන වාක්‍ය මහා ගැඹුරු අර්ථයක් දෙනවා. උන් වහන්සේ ඒ මූලික ගාථාවෙන් කිව්වෙ, මේ සසර තුල එක එක ජාතිවල මම ඉපදුනා, ඒ හැම ජාතියක්ම දුකක්, මේ ජාතිය හදන ශක්තිය ගොඩ නගන හේතුව මම හෙව්වා, එතකල් මම සසර පුරා ඇවිද්දා කියන කාරණය. සරලම විදිහට බැලුවොත් ඒ විදියට තමයි තෝර ගන්න පුළුවන් වෙන්නෙ. උන් වහන්සේගෙම දේශනා තුලින් අපි අහල තියෙනවා, මෙච්චර අත්බැව්වල දෙවි වෙලා හිටියා, මෙච්චර අත්බැව්වල බ්‍රහ්ම වෙලා හිටියා, සක්විති රජ වෙලා හිටිය කියල. ඉතින් ඒවා සේරම සුගති ජාති නේ, කොහොමද දුකක් වෙන්නෙ කියල කෙනෙකුට හිතෙන්න පුළුවන්. අනෙක් පැත්තෙන් අපට තියෙන අත් දැකීමෙන් ගන්න කොටත්, දරුවෙක් නැති දෙමව්පියො දරුවෙක් ලබා ගන්න කියල කොච්චර නම් බාර හාර වෙනවද ? එහෙම ඉඳල දරුවෙක් ලැබුනම කොච්චර සතුටු වෙනවද, උපන් දින සාද පවත්වනවද ? ඉතින් ජාතිය දුකක් වෙන්නෙ නෑ කියල හිතෙන්න පුළුවන්. එහෙම නැත්නම් තව කෙනෙකුට හිතෙන්න පුළුවන්, දේව ජාතියේ ඉපදුනොත් සතුටක් එනව මිසක් කොහොමද ඒක දුකක් වෙන්නෙ කියල. එහෙනම් ඇයි බුදුන් වහන්සේ මේ ජාතිය දුකයි කිව්වෙ ? ඒ ජාතිය හදන හේතුව හොයා ගන්න බැරි වුන නිසයි මෙච්චර කාලයක් සසර ගමන් කළේ කියන කාරණය හිතල බලන්න වෙනවා.

ඇත්තටම හිතල බැලුවොත්, මේ හටගත්ත ජාතියකට මොකක්ද වෙන්නෙ ? කුඩා ළදරුවෙක් ඉපදුනා, ළදරුවා කියන ජාතිය හටගත්තා. මේ ළදරුවා හැමදාම එක විදිහට ඉන්නවද? නෑ. එක වෙලාවක සතුටින් ඉන්නවා, හැමෝටම සතුටුයි. අනේ බලන්න හිනා වෙන ලස්සන කොච්චර හුරු බුහුටිද අම්ම වගේමයි, තාත්ත වගේමයි. වටේ බලන් ඉන්න අයත් සතුටින් මෙහෙම කියනවා. දැන් ඒ ළදරුවා කියන ජාතියෙන් ඒ මොහොතෙ තවත් තැනකට පරිවර්තනය වෙලා, සතුටු ජාතියකට පත් වෙලා. ඒක ප්‍රිය මනාපයි. ඒ කිව්වෙ අපි ඒ සතුට දකින්න කැමතියි. ඒකමයි බලාපොරොත්තුව. දැන් ඒ ළදරුවා තව තවත් හිනස්සනවා. එක පාරටම ඉස්මොලේ ගිහින් ඒ ළදරුවගෙ හුස්ම හිර වෙලා ඇඟ නිල් පාට වෙලා යනවා. ඒ වගේම ළදරුවා මහත් උත්සාහයෙන් වේදනාවෙන් විලාප දෙනවා. දැන් මොකද වුනේ? එක පාරටම අර සතුටු ජාතියේ හිටපු ළදරුවා දුක් ජාතියකට පත් වුණා. දැන් බලන් ඉන්න අයට ප්‍රිය මනාපයක් එයිද, කලබල වෙලා මර ලතෝනි දිදී ඒ ළදරුව බේරගන්න දඟලයිද? දැන් ඒ අම්ම තාත්තගෙන් ඇහුවොත් සතුටුද කියල මොකක්

අහගන්න ලැබෙයිද?

මෙතනදි අවස්ථා දෙකක් දැක්කා. මේ තියෙන ජාතිවලින් හැම ජාතියක්ම දුක නෑ. අපිට ප්‍රිය මනාප ජාතිය දුකක් දෙන්නෙ නෑ. ඒත් අප්‍රිය අමනාප ජාතිය මහත් දුකක් ගෙන දෙනවා. මේ තමයි සාමාන්‍ය ලෝකයා දකින හැටි. මෙතනදි ලෝක සම්මතයේ මනුස්සයො දුක සැප වෙන් කරන්නෙ වේදනා චෛතසිකයෙන්. නමුත් ප්‍රඥා චෛතසිකය මුල් කර ගෙන දකින දුක සැපක් තියෙනවා. යම් කිසි දෙයක් මුල් කර ගෙන වර්තමානයේ සැපක් විඳින කොට, අනාගතයේ ඒ හේතුවෙන් දුකක් විඳින්න ඉන්න කෙනෙක් වේදනා චෛතසිකවලින් තීරණ ගැනීමයි, ප්‍රඥා චෛතසිකවලින් තීරණ ගැනීමයි කියන්නෙ කාරණා 2 ක්. උදාහරණ විදියට හෙට එල්ලුම් ගස් ගිහින් මරණයට පත් වෙන්න ඉන්න පුද්ගලයෙක්, අද හොඳින් කාල බීල හෙට ජීවත් වෙන්න කියල ආශිර්වාද ලබා ගන්නව වගේ වැඩක් තමයි, වේදනා චෛතසිකයෙන් තීරණ ගැනීම. එතකොට ඒ මනුස්සයට අද කරන සංග්‍රහයෙන්, ආශිර්වාදයෙන් වැඩක් වෙයිද ? ඒ කාරණය දකින්න ඕන ප්‍රඥාවෙන්.

ඒ වගේ යම් කිසි ජරා, මරණ, සෝක, පරිදේව, දුක්ඛ, දෝමනස්ස, උපායාසයන්ට පත් වෙන පොදියක් ඇසුරු කර ගෙන, යමෙක් දුන් සැපයි කිය කියා සැප වේදනාවක් විඳිනවද, ඒක විඳින්න සුදුසුද කියල ප්‍රඥාවෙන් බලන්න ඕන. ඒක වේදනා චෛතසිකයෙන් බලන්නෙ අවිද්‍යාව නිසා. නමුත් ලෞකිකත්වය තුළ ඉන්න සියලු ලෝක සත්වයින් ඒ කාරණය මනින්නෙ වේදනා චෛතසිකයෙන්. ඒ අනුව බැලුවම තමයි ඒ අය කියන්නෙ, හැම දේම දුක නෑ සැප දේවලුත් තියෙනව කියල. අද ඉන්න ලෝක සම්මත බෞද්ධයො විතරක් නෙවෙයි, අබෞද්ධයොත් බලන්නෙ එහෙමයි. ඒක තමයි අවිද්‍යාවෙ තීරණය. එතකොට මේ හැම තැනම දුක විතරක් නෙවෙයි, සැපත් තියෙනවයි කියන කාරණය බොරු නෙවෙයි. හැබැයි අවිද්‍යාවෙන් ගත්තොත් තමයි ඒක ඒ විදියට තීරණය කරන්නෙ. ප්‍රඥාවෙන් දැක්ක නම් එහෙම තීරණ ගන්න බෑ. ඒක කරන්න පුළුවන් දහම් අවබෝධය ලබපු ආර්යයන්ට විතරයි. ආර්ය නොවන කෙනෙකුට ප්‍රඥාවෙන් ගන්න තීරණයකට බහින්න බෑ.

දැන් නැවතත් හැරිල බැලුවොත්, බුදුන් වහන්සේගෙ දේශනාවෙන් උන් වහන්සේ කිව්වෙ සියලු ජාති දුකයි කියල. ඒකට වෙන් කිරීමක් කළේ නෑ. ඒත් අපිට උඩින් පල්ලෙන් බැලුවම ප්‍රිය මනාපයක්, සතුටක් ගෙන දෙන ජාතියකුත් තියෙනවා. හරියටම නුවණ යොදවල, ඒ ප්‍රිය මනාප ජාතියෙන් වැඩි පුරම ගෙන දෙන්නෙ දුකද සතුටද කියල බැලුවොත් එන උත්තරේ කොහොම වෙයිද?

අර ලස්සන ළදරුවා ප්‍රිය මනාපයි සතුටුයි. හිනා වෙන කොට, ගිරවෙක් වගේ කියවන කොට සතුටුයි. ඒත් ඒ ළදරුවා අසනීප වුනොත්, සනීප කර ගන්න කොච්චර මහන්සි වෙනවද ? වෛද්‍යවරු ළඟට ගෙනියනවා, එතනදි මහ පොලොව නුහුලන ජාතියේ කතාවක් අහන්න ලැබෙනවා. අනේ ඒ දරුවට ලේ පිළිකාවක්, එහෙම නැත්නම් පපුවෙ සිදුරක්. දැන් මොකද වෙන්නෙ ? අර ප්‍රිය මනාපය නිසා මහා දුකකට කර ගහන්න සිද්ධ වෙනවා. හොඳයි, ලෙඩක් නෑ කියල හිතුවොත්, කෙළි සෙල්ලම් කරන වයසක නම් එහෙම, මේ දුවන පනින වෙලාවක ළමයා පාර පැත්තට දුවනවා. දඩාං ගාල වාහනයක් හැප්පෙන සද්දයක් ඇහෙනවා, ළමයෙක් කෑ ගහනව ඇහෙනවා. දැන් නැවතත් ගින්නක් පත්තු වෙනවා. ඉතින් ඒ ළදරුවා කියන ජාතිය හටගත්ත දවසෙ ඉඳන් ලොකු මහත් කරනකල් කොච්චර දුකක්ද විඳින්නෙ ?

ළමය ලොකු වුනාට පස්සෙ නැවතත් ආරංචි වෙනවා, මහා රස්තියාදුකාරයො ටිකකට එකතු වෙලා මත්ද්‍රව්‍යවලට අබ්බැහි වෙලා කියල. ඒක අහපු වෙලාවෙ ඉඳන් නැවතත් ගිනි පත්තු වෙනවා. ඉතින් අර හටගත්ත ජාතිය නිසා කොච්චර දුක් විඳිනවද? මේකව නොඉපදුනා නම් අපිට මේ දුක නැනෙ කියල කියවෙන්න තරමට දුක දරාගන්න බැරි වෙන අවස්ථා එනවා. දැන හෝ නොදැන, අනේ මේකා නොඉපදුනා නම් කියල වටිනා දෙයක් කියවුණා. ඉපදුනා කියන්නෙ ජාතියක් හටගත්ත කියන එක. නොඉපදුනා නම් කිව්වෙ මොකක්ද? ජාතිය හට නොගත්ත නම් කියන එක. ජාතිය නැති තැන ජරාව නෑ. ජරාව කිව්වෙ මේ වෙනස් වීම.

අද කාලෙ ජරාව කිව්වම එක පාරටම මතක් වෙන්නෙ ජරා ගොඩවල්, කසල ගොඩවල්. පද නිරුක්තිය ගත්තොත් ජර + අව තමයි ජරාව කියන්නෙ. ජර මර කියල වචන දෙකක් තියෙනවා. ජ – ජනිත වීම, ර - ක්‍රියාකාරීත්වය. මර - මරණයට ක්‍රියාකාරීත්වය. එහෙමත් නැත්නම් මා + අර - මාර - මා කියන්නා වූ දෙයට අරක් ගන්නවා. ඒ කියන්නෙ විනාසයට අරක් ගත්ත වෙනවා. මේ කොයි විදියට ගත්තත් විනාසය කරා යාමක් තමයි පෙන්වන්නෙ. ඒ නිසා ජර මර කියන්නෙ මරණය කරා ක්‍රියාත්මක වෙන්න ජනිත කරනවා කියන එක. ජර අව කරනවා කියන්නෙ, ජාතියට හෙවත් ජනිත වීමට ක්‍රියාත්මක වීම අවම කිරීම. ජාතිය ක්‍රමානුකූලව ක්‍රියාත්මක කිරීම අව කළාම ඒක දුබල වෙනවා. ජරාව හැදෙන්නෙ එහෙමයි. ජර කියන්නෙ නැගෙන පැත්ත, අව කියන්නෙ බහින පැත්ත. කයේ නැගීම බැහැල ගියාම ජරා වෙනවා. හොඳට ඉන්නවා, එක පාරටම නරක අතට හැරෙනවා. ගහක් ගලක් වගේ ඉන්නවා, එක පාරටම පැත්ත වැටෙනවා. තරුණ වියේ ඉන්නවා, මහලු වියට පත්වෙනවා. එක එක විදිහට ජරාව උරුම වෙනවා. ජරාව උරුම තැන අනිවාර්යෙන් මරණ, සෝක, පරිදේව, දුක්ඛ, දෝමනස්ස, උපායාස උරුමයි. මෙන්න මේ කාරණය නිසා තමයි උන් වහන්සේ මේ දුක් වූ ජාතිය හදන්න හේතුව හොයා ගෙන ගියේ, ඒක නැති කරන්න උත්සාහ කළේ.

ජාතියක් නිකං හටගන්නෙ නෑ. ඒ ජාතිය නිර්මාණය කරන්න ශක්තියක් අවශ්‍යයි. බල්ලෙක් කියන ජාතිය හදන්න ශක්තියක් ඕන. හරියට ගෙයක් නිකං හැදෙන්නෙ නෑ වගේ, කවුරු හරි ඉඳල ශක්තියක් යොදවල අත්තිවාරම දාන්න ඕන, බිත්ති බඳින්න ඕන, වහල ගහන්න ඕන, ඒ සේරම ඉවර කළාමයි ගෙයක් කියල කියන්නෙ. මේ නිර්මාණාත්මක ශක්තියට භවය කියල කියනවා. මේ ශක්තිය නිසා ලැබෙන ජාතියට අත්බැව කියනවා. ඉතින් මේ නිර්මාණාත්මක ශක්තිය කොහොමද ගොඩ නැගෙන්නෙ? ඒකත් නිකං ගොඩ නැගෙන්නෙ නෑ. ඒ ශක්තියම ඇසුරු කර කර ඒකටම ළං වෙලා ඉන්න ඕන. කෙනෙක් හොඳට ඉන්නවා. තරුණ ළමයෙක් කියල හිතුවොත්, ඒ ළමයට හැමෝම හොඳ කොල්ලා, හොඳ ළමයා කියල කියනවා. ඒ ළමය ඒ මොහොතෙ අත් කරගෙන හිටපු ශක්තිය අනුව, ඒ කිව්වෙ කරපු හොඳ වැඩ අනුව දෙමව්පියන්ට සලකනවා, පන්සල් යනවා, හොඳට ඉගෙන ගන්නවා. ඒවම ඇසුරු කර කර ඉන්න නිසා ඒ මොහොත වෙන කොට හොඳ ළමය කියන ජාතියක ඉන්නවා. මේ ඇසුරු කරන දේට, වැඩිපුර ළං වෙලා ඉන්න දේට, ඒ සඳහාම ඇඳී සිටීමට උපාදානය කියල කියනවා. තමන් විසින් ගොඩ නගන හොඳ හෝ නරක ශක්තියට ළං වෙලා ඒකම කර කර ඉන්නවා. ඒ අනුව ඉදිරි භවයත්, ජාතියත් තීරණය වෙනවා.


හරියට හොඳට ඉදුන රඹුටන් වල්ලකින් කෙනෙකුට ගෙඩියක් ගන්න කිව්වොත්, මුලින්ම අත යන්නෙ හොඳම ලොකුම ගෙඩියට. ඒක ස්වභාවයෙන්ම සිද්ධ වෙන දෙයක්. උපාදානය අනුව ජාතිය ගොඩ නැගීමත් ඒ වගේ. ඉතින් උපාදානයක් නිකන් හටගන්නෙ නෑ, තමන් වැඩි පුරම ඇසුරු කරන තැනට භාවෙලා කැමති වෙලා ඉන්නවා. මේකට

# ධම්ම පදය තුළින් නිවන් මග

**9 වන කොටස**

මාරයාගේ වසඟයට පත් ලෝකයක් තුල කෙනෙක් කතා කරන වචන තියෙනවා. අපි මෙහෙම ඉඳිමු, අර විදියට ඉඳිමු, අර ජාතියේ ගෙයක් හදාගෙන ඉඳිමු .... ආදී වශයෙන් කරන කතා බහ එක පැත්තක්. ඒ වගේම, ඔය මිනිහට ඔහොම වෙලා මදි ඔයිට වැඩිය වෙන්න ඕන ! මතකනේ අපිට කරපු කියපු දේවල්.... මේ තව පැත්තක්. අපිට කොහෙන්ද ඉතින් ඔය විදිහට ජීවත් වෙන්න සල්ලි ! උන් කොහොම ඕව කරනවද මන්දා ! ... මේ තවත් පැත්තක්. ඉතින් එක එක විදිහෙ ලෝකෙට බැඳෙන කතා. ඒ වගේම මේ පැති සේරම අයින් කරපු, ලෝකෝත්තර සුවයක් ලබපු උතුමෙක් කරන කතාවක්, සුවපත් වේවා කියල කියන එක වචනයකින් වුනත් ගන්න පුළුවන්. මෙන්න මේ වගේ, වැඩක් නැති කතා දහසක් කතා කළත් ආර්ය උතුමෙක්, එහෙම නැත්නම් ආර්ය පරම්පරාව නියෝජනය කරන සංඝයා වහන්සේ නමක් කියන එක වචනයක් ඊට වඩා වටිනවා කියන, කෙටි ගාථා සහිත සහස්ස වර්ගයේ එන ගාථාවක් ගැන තමයි මේ කියන්නෙ.

අනෙක් අවස්ථාවල වගේම මේ ගාථාවත් ලොව්තුරා බුදු පියාණන් වහන්සේ විසින් දේශනා කරන්න මුල් වුන කාරණයක් තිබුණා. අවුරුදු පනහක් තිස්සේ රාජ අණින් සොරුන්ගෙ හිස ගසා මරා දැමූ අළුගෝසුවෙක්ගෙ කථාවක් තමයි



ඒකට මුල් වුණේ. මේ අළුගෝසුවගෙ නම තම්බදාඨික. එහෙම නමක් තියන්න හේතු වුනේ ඔහුට තිබුන සිහින් තඹ රැවුල. දවසක් මේ අළුගෝසුවා හොරු 499 ක් ඉන්න තැනකට ගිහින් ඒ හොරු රැළේ නායකය හමුවෙලා කිව්වා, ස්වාමීනි මට ඔබලගෙ හොරු රැළට එකතු වෙන්න ඕන කියල. ඉතින් හොරු රැළේ නායකය මේ අළුගෝසුව දිහා බලල, මොහු නම් අපිට ගැලපෙන එකෙක් නෙවෙයි, හිතක් පපුවක් නැති දරුණු එකෙක් කියල හිතුවා. මොහුට ඕන නම් අම්මගෙ පියයුරු වුනත් කපල, තාත්තගෙ බොටුව වුනත් කපල ලේ බොන්න පුළුවන්, එහෙම දරුණු කර්කෂ එකෙක් අපට ගැලපෙන්නෙ නෑ කියල ඒ ඉල්ලීම ප්‍රතික්ෂේප කළා. නමුත් කොහොම හරි මේ සිහින් තඹ රැවුල තියෙන අළුගෝසුව, තවත් අතවැසියෙක්ගෙ මාර්ගයෙන් හොර රැලේ නායකය කැමති කරව ගෙන ඒ රැළට එකතු වුණා.

මේ හොරු පන්සීයම එක දවසක් රාජ පුරුෂයන්ට අහුවෙලා දඬුවම වශයෙන් මරණයට පත් කරන්න තීරණය කළා. නමුත් මරන්න අළුගෝසුවෙක් හිටපු නැති නිසා හොරු රැළේ නායකය අමතල, උඹේ අනෙක් පිරිස රාජ අණ අනුව මැරුවොත් අපි උඹට ජීවිත දානය සහ සම්මාන දෙනව කියල පොරොන්දුවක් දීල ☞

---

තණ්හාව කියල කියනවා. තණ්හාව, කැමැත්ත නැතුව කිසි දෙයක් වෙන්නෙ නෑ. මේ කැමැත්ත තමයි මූලික කාරණය. අනේ මට දෙවියෙක් වෙන්න තිබුන නම්, අනේ මට බ්‍රහ්මයෙක් වෙන්න තිබුණ නම් කියල හිතෙනවා. **නමුත් කෙනෙක් කවදාවත්, අනේ මට බල්ලෙක් වෙන්න තිබුන නම් කියල හිතන්නෙ නෑ. ඒකට අකමැතියි. ඒත් කැමැත්ත තියෙන්නෙ බලු වැඩවලට නම්, හදන ශක්තිය/ භවය බල්ලෙක් ගොඩනගන ශක්තියක් වෙනවා. ඒ නිර්මාණාත්මක ශක්තියෙන් ඒකාන්තයෙන්ම බල්ලෙක් හදනව මිසක් කවදාවත් මනුස්සයෙක්, දෙවියෙක්, බ්‍රහ්මයෙක් හදන්නෙ නෑ.**

ඉතින් දෙවියෙක් වුනත්, බ්‍රහ්මයෙක් වුනත් ඒ ජාතිවලටත් උරුම ලක්ෂණයක් තමයි ඒ ගොඩනගපු ශක්තිය වැය වෙලා යෑම. අප්‍රමාණ කාලයක් ගිහින් හරි ඒක වැය වෙනවා. වෙනත් ජාතියකට යනවා. ඒ ජාතිය සමහර විට සතර අපාගත ජාතියක් වෙන්න පුළුවන්. බුද්ධ දේශනාවට අනුව ලෝකය පවත්නා කාලයෙදි (අන්තඃ කල්ප 20 ක කාලය තුළ) ලෝක සත්වයා වැඩිපුරම ඉන්නෙ මේ සතර අපාගත ජාතිවල. ඒකට හේතුව, කෙනෙකුට හොඳ කරනවට වඩා නරක කරන්න ලෝකයා වැඩිපුර කැමැත්තක් දැක්වීම. අනෙක තලල පෙලල මරල හරි තමන්ගෙ කැමැත්ත ඉෂ්ඨ කර ගන්න උත්සාහ කිරීම. මේ දේ සර්වඥතා ඥානයෙන් දැක්ක නිසා තමයි, උන් වහන්සේ මේ දුක් වූ ජාතිවලින් බේරෙන්න ක්‍රමයක් ලෝකයාට දේශනා කළේ. දුක මොකක්ද කියල නුවණින් දැක්කා. ඒකට හේතුව මොකක්ද කියල තමයි ඊළඟට පැහැදිලි කළේ. ඒක හැම තිස්සෙම ප්‍රිය මනාපයි. එතනටමයි ඇලෙන්නෙ, හාවෙන්නෙ. ඒකයි තණ්හාව නමැති වඩුවා කිව්වෙ. වඩුවෙක් කරන්නෙ නිතරම යමක් නිර්මාණය කරන එක. ඒ නිසා තමයි තණ්හාව වඩුවට උපමා කළේ. වඩුවට ගෙයක් නිකන් නිර්මාණය කරන්න බෑ. ඒ ගේ මුළු බර දරා ගන්න පුළුවන් මූලික ශක්තියක් ඕන. ඒකට කියනවා කැණිමඬල කියල. ඒක නැතුව ගේ දරන්නත් බෑ, වඩුවා නැතුව ගේ හදන්නත් බෑ. ඉතින් මේ කැණිමඬල / බර දරන උපකරණය අවිද්‍යාවට උපමා කළා. ඔය දෙක තියෙන කල් ගේ රඳල තියෙනවා. හරියට අවිද්‍යාවයි තණ්හාවයි නිසා ජාතිය රඳල තියෙනව වගේ.

අවිද්‍යාව සහ තණ්හාව නිසා ලෝකෙට ඇලෙනවා, ඒ ඇලෙන දේට විරුද්ධව එන හැම දේටම ගැටෙනවා. ඒ ඒ මොහොතෙ එක එක ජාති ගොඩ නගනවා. ඇලෙන්න ගිහින්, ගැටෙන්න ගිහින් වැඩිපුරම ලෝක සත්වයා ගොඩනගන්නෙ දුක් ජාති. මේ දුක් ජාති ගොඩනගන්න හේතු වෙච්ච තණ්හාව මේ බුද්ධ සාසනය තුලදි මුලින්ම උදුරා දැම්මෙ ලොව්තුරා බුදුන් වහන්සේ. උන් වහන්සේ ඇලීමක් නැති, ගැටීමක් නැති නිවන් සුවය දැක්කා. ඒ දැකපු සුවය ලබාගත්ත හැටි උන් වහන්සේ උදාන වාක්‍යයකින් ලෝකයාට දේශනා කළා.

*වෑහරක අභයරතනාලංකාර හිමිපාණන් විසින් දේශිත සැඟවුණ දහම් කරුණු සමග ථේර ථේරී ගාථා ඇසුරින් සකස් කළේ:*

**රිෆ්රි ඉස්මයිල්**

**පරිගණක ඉංජිනේරු - ගොතටුව**

ඉල්ලීමක් කළා. හැබැයි මේ හොර රැලේ නායකයා ඒකට කැමති වුනේ නෑ. ඒ විදියට අනෙක් සියලු හොරුන්ගෙන් ඒ කාරණය ඇහුවත් ඒ සියලු දෙනාම ඒ ඉල්ලීම ප්‍රතික්ෂේප කළා. නමුත් අර තඹ රැවුල තියෙන මනුස්සයා ගාවට ගිහින් ඇහුව ගමන්, ප්‍රශ්නයක් නෑ මම ඒක කරන්නම් කියල ඉදිරිපත් වුණා. ඉතින් මේ මනුස්සයා අර තමන්ගෙ රැළේ හිටපු සියලු දෙනාම මරල දැම්මා. ඒ වගේම වෙනත් ගමකත් හොරු 500ක රැලක් ගෙනල්ල ඔය විදියට මරන්න අණ කළාම, කිසිම කෙනෙක් කැමති වුනේ නෑ. පසුව මතක් වුනා, කලින් හොරු රැලේ එකෙක් හිටියා, ඔහුට කිව්ව නම් මේක කරගන්න පුළුවන් කියල. ඉතින් අර මනුස්සයා කිසිම කතාවක් නැතුව ඒ ඉල්ලීමත් ඉෂ්ඨ කළා. ඊට පස්සෙ රාජ අණින් මේ සිහින් තඹ රැවුල තියෙන අළුගෝසුව චෞර ඝාතක කියන තනතුරට පත් කළා. ඔහොම හොරු 500, 100, එකා දෙන්න ආදී වශයෙන් දිනපතාම මේ චෞර ඝාතකයා විසින් අවුරුදු පනහක් තිස්සෙ මැරුවා.

දැන් ඉතින් මේ චෞර ඝාතකයට වයස නිසා එක කඩු පහරින් කෙනෙක් මරන්න ශක්තියක් නෑ. කඩු පහර දෙක තුන ගහන්න වෙනවා. බලන් ඉන්න මිනිස්සුත් කලන්තෙ දාල වැටෙනවා. ඉතින් මේ කාරණය නිසා මේ මනුස්සයා ඒ තනතුරෙන් ඉවත් කළා. ඊට පස්සෙ, අද මට තනතුරත් නැති වුණා, කාලෙකින් හරියට පිරිසිදු වෙන්නත් බැරි වුනා, සමන් මල් මාලයක් දාල සුවඳවත් වෙන්නත් බැරි වුනා, කිරි කැඳක් බොන්නත් බැරි වුනා කියල හිතල, මේ මනුස්සයා ඒ සියලු කාරණා ඉෂ්ඨ කරගන්න ගෙදර ගියා. ගිහින් නාගෙන පිරිසිදු වෙලා අර සමන් මල් මාලයත් දාගෙන කිරි කැඳ එක හදන්න කියල ගෙදර අයට කිව්වා.

ඔහොම කිරි කැඳ එක හැදෙන කොට ගෞතම බුද්ධ ශාසනයේ ශ්‍රාවකයන් වහන්සේලා අතරින් ධර්ම සේනාධිපති වූ, ප්‍රඥාවෙන් බුදුන් වහන්සේට පමණක් දෙවැනි වූ සැරියුත් මහ රහතන් වහන්සේ ඒ ගෙදර ළඟින් පිණ්ඩපාතයේ වැඩියා. දැන් සැරියුත් මහ රහතන් වහසේ අර කිරි කැඳ එක පිසින චෞර ඝාතකයාගෙ ගේ ඉස්සරහ පිණ්ඩ පාතයක් ලැබෙන තුරු වැඩ ඉන්නවා. මේ සිද්ධිය චෞර ඝාතකයා දැක්කා. මොකක් හරි සසර හේතුවක් නිසා ඔහුට සිතිවිල්ලක් පහළ වුනා, මම අවුරුදු පනහක් තිස්සෙ මිනිස්සු මැරුවා, සංඝයා වහන්සේ නමක් ගේ ඉස්සරහ වැඩ ඉන්නවා, ගෙදර කිරි කැඳත් තියෙනවා, මුන් වහන්සේ වඩම්මවල දානයක් දෙන්න ඕන කියල. ඉතින් සැරියුත් මහ රහතන් වහන්සේ ගේ ඇතුලට වඩම්මවල අර කිරි කැඳ එකෙන් කොටසක් උන්වහන්සේගෙ පාත්තරේට පිරිනමල වළඳන්න කියල ආරාධනා කළා.

ඒ අතර ඔහුට තවත් සිතිවිල්ලක් ආවා, අනේ මාත් කාලෙකින් බිව්වෙ නෑ මටත් බොන්න තිබුණ නම් කියල. ඉතින් මේ සිතිවිල්ල සැරියුත් මහ රහතන් වහන්සේ දැක්කා. දැකල ඔහුටත් කැඳ බොන්න කිව්වා. මේ මනුස්සයා කැඳ බීල සැරියුත් මහ රහතන් වහන්සේ කැඳ වළඳන කල් පවන් සලමින් හිටියා. අන්තිමට උන් වහන්සේ පුණ්‍යානුමෝදනාවට ලෑස්ති වෙලා පින් දෙන කොට, මේ මනුස්සයා නිතරම හිතන්නෙ, අනේ මම අවුරුදු පනහක් තිස්සෙ මිනිස්සු මැරුවනෙ කියන එකමයි. මේකත් සැරියුත් මහ රහතන් වහන්සේ දැක්කා. දැකල සම්‍යක් ප්‍රයෝගයක් යෙදුවා. ඊට පස්සෙ අර චෞර ඝාතකයාගෙන් ඇහුවා, ඔබ ඔය අවුරුදු පනහක් තිස්සෙ මරපු මිනිස්සු හිතා මතා මැරුවද, එහෙම නැත්නම් කවුරු හරි කිව්ව නිසා මැරුවද කියල. නෑ ස්වාමීනි, මම හිතා මතා මැරුවෙ නෑ, රාජ අණ නිසයි මැරුවෙ කියල උත්තරයක් දුන්නා. ඉතින් නැවතත් සැරියුත් මහ රහතන් වහන්සේ කියනවා, එහෙනම් ඔබට ප්‍රශ්නයක් නෑ කියල. දැන් මේ මනුස්සයටත් සතුටුයි. ඇත්තනේ මට ප්‍රශ්නයක් නැනෙ කියල හැඟීමක් ආවා. ඊට පස්සෙ අනුමෝදනාව අහන්න පටන් ගත්තා. මේ අනුමෝදනාවෙදි මේ මනුස්සයා චුල්ල සෝතාපන්න තත්වයට පත්වුණා. ඊට ටික වෙලාවකට පස්සෙ යක්ෂණියක් ආවේස වෙච්ච හරකෙක් ඇනල මැරිල තුසිත දෙව් ලොව ගිහින් ඉපදුණා.

දැන් කෙනෙකුට හිතෙන්න පුළුවන්, ඇයි සැරියුත් මහ රහතන් වහන්සේ දැන දැනත් ප්‍රාණ ඝාතය ප්‍රශ්නයක් නෙවෙයි කිව්වෙ කියල. කවුරු කිව්ව හෝ නැතා හෝ තමන් අතින් නම් ඒ ප්‍රාණ ඝාතය සිද්ධ කළේ, ඒක ප්‍රශ්නයක් නෙවෙයි කිව්වෙ ඇයි කියල හිතෙන්න පුළුවන්. උන් වහන්සේ ප්‍රඥාවෙන් දෙවැනි වෙන්නෙ බුදු පියාණන් වහන්සේට පමණයි. ඉතින් උන් වහන්සේ එතන යෙදුවෙ උපායක්, එහෙම නැත්නම් සම්‍යක් ප්‍රයෝගයක්. අපි ප්‍රයෝග කියන වචනය දන්නවා. ඒකෙන් කරන්නෙ කාව හරි රවටන එක. **කෙනෙක්, තව කෙනෙකුට අනතුරක් කරන්න බොරුවෙන් රවටන්න පුළුවන්. ඒ වගේම තවත් කෙනෙක්, කෙනෙකුට හොඳක් කරන අරමුණින් රවටන්නත් පුළුවන්.** නිතරම එහෙ මෙහෙ දුවන, දඟ වැඩ කරන පොඩි ළමයින්ට අම්මල කියන කතාවක් තමයි, පුතේ ඔය පැත්තට යන්න එපා ඔතන බායියෙක් ඉන්නවා ඔයාව අල්ලන් යයි කියල. නමුත් එතන ඇති බායියෙක් නෑ. ඒත් එතනට ගියාම ඒ ළමයට අනතුරක් වෙන්න පුළුවන්. සමහර විට වැටිල තුවාල වෙලා මරණය හෝ ඊට සමාන වේදනාවක් එන්න පුළුවන්. ඒකෙන් ආරක්ෂා කරන්නයි එහෙම කියන්නෙ.

ඉතින් අර මනුස්සයත් කරගෙන තිබ්බ්ච පාප කර්ම සුළු පටු නෑ. අවුරුදු පනහක් තිස්සෙ මිනී මරපු එක ලේසි පහසු දෙයක් නෙවෙයි. ඒත් අර පොඩි ළමයගෙ අම්ම වගේ, සැරියුත් මහ රහතන් වහන්සෙත් මේ මනුස්සයාගෙ මනස හදන්න වටිනා බණ පදයක් දෙකක් තේරුම් කරල දෙන්න සම්‍යක් ප්‍රයෝගයක් යෙදුවා. මනස එහෙ මෙහෙ දුවන කොට කිසිම දෙයක් ඔළුවට යන්නෙ නෑ. අඩු තරමෙ ලෞකික දෙයක්වත් වටහ ගන්න බෑ. ඉතින් ලෝකෝත්තර දහමක් කොහොම නම් අවබෝධ කර ගන්නද ? මේ මනුස්සයා වැටෙන්න ගිය අනන්ත දුක් කන්දරාවෙන් බේර ගන්න තමයි උන් වහන්සේ එහෙම දෙයක් කියල මනස වෙන පැත්තකට හැරෙව්වෙ. ඊට පස්සෙ බණ කිව්වා. ඒ නිසා මේ ගැන වැරදි අවබෝධයක් ගන්න නරකයි, හිතල මැරුවොත් විතරයි පවු සිද්ධ වෙන්නෙ, වෙන කෙනෙක්ගෙ අණින් මැරුවට පවු නෑ කියල. ඒක සම්පූර්ණයෙන්ම වැරදි මතයක්. ප්‍රාණ ඝාතය තමන් අතින් නම් සිද්ධ වුනේ ඒක තමන් හිතල හෝ අනුන්ගෙ අනුබලයකින් හෝ කළා නම් ඒක පාපයක්මයි.


හැබැයි මෙතනදි සැරියුත් මහ රහතන් වහන්සේ, ඔබට ප්‍රශ්නයක් නෑ කියන එකින් අදහස් කළේ, චේතනා බලවත් වීමෙන් කරපු ප්‍රාණ ඝාතයක් එතැන සිද්ධ වුනේ නෑ කියන එක. අනුන්ගෙ නියෝගයක් නැතිව තමන්ම මැරුව නම් එතනදි ප්‍රාණ ඝාත චේතනාව බලවත්. එතකොට මේ මනුස්සයාගෙ හිතේ තිබුණෙ, මම මිනී මැරුවනෙ කියන ඒ ජාතියෙ අදහසක්. නමුත් සැරියුත් හාමුදුරුවො දැන ගත්තා, චේතනාව බලවත් පළවෙනි පාප කර්මය නෙවෙයි මේ සිද්ධ වෙලා තියෙන්නෙ දෙවෙනි පාප කර්මය කියල. නමුත් ඒ පුද්ගලයා හිතන් හිටියෙ පළවෙනි පාප කර්මය තමන් අතින් සිද්ධ වුනා කියල. ඒ පළවෙනි අවස්ථාව සිද්ධ වෙලා නෑ කියන අදහස දෙන්න තමයි උන් වහන්සේ ඒ වගේ සම්‍යක් ප්‍රයෝගයක් යෙදුවෙ. නමුත් ඒ පුද්ගලයා, මම මෙච්චර මිනී මැරුවනෙ, ඒ පාපය මටනෙ කියල අදහස් ගත්තම අර පළවෙනියට එන අවස්ථාව තමයි අහු වෙන්නෙ. ඒ නිසා තමයි උන් වහන්සේ ඇහුවෙ ඔබ හිතල මතල මැරුවද, අනුන් කිව්ව නිසා

මැරුවද කියල. අනුන් කිව්ව නිසා නම් එතන දෙවැනි අවස්ථාවෙ පාපයක් තමයි සිද්ධ වෙලා තියෙන්නෙ. එහෙම නැතිව අනුන් කිව්ව නිසා මැරුවම පවු නැති කතාවක් නෙවෙයි මේ කියන්නෙ. ඒ ජාතියේ පාපයක් නෑ කියන එකයි උන් වහන්සේ අදහස් කළේ. නමුත් කෙලින්ම පවු කියල කිව්ව නම් ඒ පුද්ගලයගෙ හිත වික්ෂිප්ත වෙන නිසයි සම්‍යක් ප්‍රයෝගයක් යොදල, පළවෙනි පාප කර්මය නොවන නිසා ප්‍රශ්නයක් නෑ කියල කිව්වෙ. ඒ කාරණය උන් වහන්සේ දැන ගෙන හිටියා.

හැබැයි මෙතනදි උන් වහන්සේ බොරුවක් කිව්වෙත් නෑ. පළවෙනි පාප කර්මය එතැන සිද්ධ වුනේ නෑ කියන අදහසින් ප්‍රශ්නයක් නෑ කිව්ව මිසක් පවු නැති කතාවක් කිව්වෙ නෑ. නමුත් ඕක සමහර පොත්වල පටලවල තියෙන්න පුළුවන් පවු නෑ කිව්ව කියල. දැන් මේ වගේ කතාවක් ඉස්සර ලංකාවෙත් සිද්ධ වෙලා තියෙනවා. ගැමුණු කුමාරය සහ තිස්ස කුමාරය අතර යුද්ධෙදි තිස්ස කුමාරය ජීවිත දානය පතාගෙන භික්ෂූන් වහන්සේලාගෙ ආරාමයක ඇඳක් යට හැංගුණයි කියනවා. ඒ වෙලාවෙදි ඒ සිද්ධිය එතැන හිටපු භික්ෂූන් වහන්සේලා ඒකාන්තයෙන්ම දැකල තියෙනවා. දැන් ඊළඟට රාජ පුරුෂයො ඇවිත්, තිස්ස ආවද කියල අහන නිසා, උන් වහන්සේලාට නෑ කියන්නත් බෑ. මොකද නෑ කිව්වොත් ලෝක සම්මතයෙ බොරුවක් හෝ කිව්ව වෙනවා.

ඒ නිසා එතැන හිටපු ඥානවන්ත වැඩිහිටි තෙරුන් වහන්සේ නමක් එක්තරා සම්‍යක් ප්‍රයෝගයක් යෙදුවා. උන් වහන්සේ අනික් භික්ෂූන් වහන්සේලාට කිව්වා, දැන් මෙතන ඉඳගෙන හිටපු අය නැගිටින්න, නැගිටල හිටපු අය ඉඳගන්න, තව පොඩ්ඩකින් රාජ පුරුෂයො එනකල් ඔහොම ඉන්න කියල. ඉතින් උන් වහන්සේලා ඒ විදියට කළා. ඊළඟට රාජ පුරුෂයො ඇවිත් තිස්ස ආවද ස්වාමීනි කියල ඇහුවම, අපි මෙතන උන් හිටි වෙලාවෙ නම් ආවෙ නෑ කියල ඒ භික්ෂූන් වහන්සේලා උත්තර දුන්නා. උන් කිව්වෙ ඉඳ ගත්තා, හිටි කිව්වෙ හිට ගත්තා කියන එක. එතකොට උන් වහන්සේලා බොරුවක් නෙවෙයි කිව්වෙ. ඉඳ ගත්ත හිට ගත්ත වෙලාවෙ නම් ආවෙ නෑ. ඒ කාරණය රාජ පුරුෂයන්ට ඇඟෙව්වා. නමුත් තිස්ස කුමාරය ආව බවත් උන් වහන්සේලා දන්නවා. හැබැයි බොරුවක් නෙවෙයි කිව්වෙ.

මේ වගේ සම්‍යක් ප්‍රයෝගයක් තමයි මේ කතා වස්තුවෙදිත් සිද්ධ වුණේ. සම්‍යක් ප්‍රයෝගයක් කියන්නෙ බොරුවක් නෙවෙයි. උන් වහන්සේලා ඇත්තක් තුළින්මයි සම්‍යක් ප්‍රයෝගයක් වුනත් පෙන්වන්නෙ. ඒකට බොරුවක් ගාව ගන්නෙ නෑ. රහතන් වහන්සේ නමක් නම් කොහොමටවත් ලෝක සම්මතයේ බොරුවකින්වත් පුද්ගලයෙක් රවට්ටන්නෙ නෑ. මොකද බුදුන් වහන්සේගෙ දේශනාව අනුව කාරණා 4 ක් තියෙනවා. **යමක් බොරු නම්, ඒකෙන් යහපතක් වුනත් ඒ බොරුව කියන්නෙ නෑ. ඒ වගේම යමක් සත්‍ය නම්, ඒත් ඒකෙන් යහපතක් වෙන්නෙ නැත්නම් ඒක කියන්නෙත් නෑ. ඊළඟට යමක් සත්‍ය නම් යහපතක් වෙනව නම් සුදුසුසාට සුදුසු තැනදි කියනවා. ඒ වගේම යමක් බොරු නම් ඒකෙන් යහපතක් නොවෙනව නම් කොහොමත් කියන්නෙ නෑ.** මේ විදියට බුදුන්



වහන්සේගෙ දේශනාව හතර ආකාරයි. ඉතින් රහතන් වහන්සේත් බුදුන් වහන්සේ අනුගමනය කරන නිසා කවදාවත් ඒ වගේ දෙයක් කෙරෙන්නෙ නෑ. ඒ නිසා රහතන් වහන්සේ නමක් වුනත් යමක් කියන්නෙ මේ හතරට අනුව. එහෙම කියන ක්‍රම තියෙනවා. ඒව තමයි සම්‍යක් ප්‍රයෝග කියන්නෙ. ලෝක සම්මත ප්‍රයෝග වෙනයි, සම්‍යක් ප්‍රයෝග වෙනයි. මෙතනදි වුනේ ඒ වගේ දෙයක්. පළවෙනි බලවත් පාප කර්මය සිද්ධ වෙලා නැති නිසා, එහෙනම් ප්‍රශ්නයක් නෑ කිව්වා.

ඒ වගේම රහතන් වහන්සේගෙන් කොහෙත්ම සිද්ධ වෙන්නෙ නැති අභව්‍ය කාරණා 5 ක් ධර්මයේ පෙන්වා තියෙනවා. දැන දැන ප්‍රාණ ඝාතයක් කරන්නෙ නෑ, දැන දැන හොරකමක් කරන්නෙ නෑ, දැන දැන කාම මෛථුනයක යෙදෙන්නෙ නෑ, දැන දැන බොරුවක් කියන්නෙ නෑ, දැන දැන සන්නිධිකාරක පරිභෝග වළඳන්නෙ නෑ. (ඒ කියන්නෙ සන්තානයේ හෙවත් හිතේ කෙළෙස් සහිතව මොනම දෙයක්වත් එකතු කර ගන්නෙ නෑ, නිදන් කරගන්නෙ නෑ.) එතකොට දැන දැන බොරුවක් කියන්නෙ නෑ කිව්වම ලෝක සම්මතයෙ බොරුවක් වුනත් දැන දැන කියන්නෙ නෑ. නමුත් නොදැන කියවෙන්න පුළුවන්. උදාහරණ විදියට තවත් කෙනෙක් කියපු දෙයක් ගැන විශ්වාසය තියල උන් වහන්සේ ඒ දේ තවත් කෙනෙක් එක්ක කියන්න පුළුවන්. හැබැයි පස්සෙ බලන කොට ඒ කියපු දේ බොරුවක් වෙන්න පුළුවන්. නමුත් උන් වහන්සේ ඒක දැන ගෙන කිව්ව නෙවෙයි.

ඉතින් මේ චෞර ඝාතකයට වෙච්ච සිද්ධිය භික්ෂූන් වහන්සේලා අතර කතා බහට ලක් වුණා. අවුරුදු පනහක් තිස්සෙ මිනී මරපු චෞර ඝාතකයා, එක දවසින් ඒකෙන් මිදිල, ඒ දවසෙම සැරියුත් මහ රහතන් වහන්සේට දන් දීල එදාම මැරුණා. ඊළඟට දැන් කොහේ ඉපදිලා ඇත්ද කියල කතාවක් ඇති වුණා. බුදුන් වහන්සේ මේ කතාව ගැන භික්ෂූන් වහන්සේලාගෙන් අහල, ඒ මනුස්සය තුසිත දෙව් ලොව ඉපදුනා කියල දේශනාවක් කළා. දැන් භික්ෂූන් වහන්සේලා උඩ බිම බලනවා, එහෙම කොහොමද වෙන්නෙ, මේ අවුරුදු පනහක් තිස්සෙ මිනී මරපු කෙනෙක් කොහොමද තුසිත දෙව් ලොව උපදින්නෙ කියල. ඉතින් බුදුන් වහන්සේ මහා කරුණාවෙන් ඒ කාරණය මෙහෙම පහදල දුන්නා.

ඒ මනුස්සයට අවසාන මොහොතෙ මහා කල්‍යාණ මිත්‍රයෙක් හමු වුණා. ඒ අනුව අනුලෝම ඥානය ලබල තුසිත දෙව් ලොව ඉපදුණා. ඉතින් නැවතත් අර භික්ෂූන් වහන්සේලා අතුරු ප්‍රශ්නයක් අහනවා. ස්වාමීනි, මේ පින් අනුමෝදනා වීම එහෙම ඥානයක් ලබන්න තරම් බලවත් නෑ, ඊට වඩා ඒ මනුස්සය අවුරුදු පනහක් තිස්සෙ කරපු පවු කන්දරාව වැඩියි. එහෙම එකේ කොහොමද අර වගේ උපතක් ලබන්නෙ? ඒකත් බුදු පියාණන් වහන්සේ පහත ගාථාවෙන් පහදල විස්තර කරල දුන්නා.

සහස්සම්පි චේ වාචා
- අනත්ථපද සංහිතා
ඒකං අත්ථපදං සෙයියෝ
- යං සුත්වා උපසම්මතී.

සරල සිංහල තේරුම,

**අනර්ථ සිදු කරන පදවලින් යුත් වචන දාහක් නමුත් උතුම් නොවෙයි. යම් වචනයක් ඇසීමෙන් කෙලෙස් සන්සිඳීමට පැමිණේ නම් එසේ වූ අර්ථවත් එක වචනය පවා ඉතා උතුම්ය.**

දැන් මේ ගාථාව අනුව, අනර්ථ පද දාහක් කිව්වත් ඒක උතුම් නෑ කියල තමයි බුදුන් වහන්සේ දේශනා කළේ. මුලින්ම තෝර ගන්න ඕන කාරණය තමයි මොකක්ද මේ අර්ථය සහ අනර්ථය කියල. ලෝක සම්මතයෙ අර්ථයක් තියෙනවා, අනර්ථයක් තියෙනවා. පොදුවේ කෙනෙක් කියන්න පුළුවන්, හොඳට ඉගෙන ගන්න හොඳට විභාග සමත් වෙන්න හොඳ රස්සාවක් කරන්න ඊට පස්සෙ හොඳින් ජීවත් වෙන්න පුළුවන් කියල. මේක ලෝක සම්මතයෙන් බැලුවම වටින කතාවක්, හොඳ උපදෙසක්. ඒක පිළිපදින කෙනාට අර්ථයක් හෙවත් හොඳක් සිද්ධ වෙන්න පුළුවන්. ඒක බොරු නෙවෙයි. ඒ වගේම අනෙක් පැත්ත අනර්ථය. ඒකත් ලෝක සම්මතයෙන් බැලුවොත්, ගහල හරි අසාධාරණයෙන් හරි උඹේ වැඩේ කර ගනින්, ආයෙ මොකට දෙපාරක් හිතනවද, දුන්නෙ නැත්නම් බලෙන් හරි ගනින්, එක්කො හොරකම් කරපන්.... ආදී වශයෙන් කියන මේව කළාම රටක නීතියක් අනුව දඬුවම් විඳින්න සිද්ධ වෙන දේවල්. ඒ අනුව මරණය පවා සිද්ධ වෙන්න පුළුවන්. එතකොට ඒවා ලෝකෙ පැත්තෙන් බැලුවොත්, ඒ උපදෙස් පිළිගත්ත කෙනාට අනර්ථයක් හෙවත් ජීවිතය දුක්ඛිත තත්වයකට පත්වෙන්න පුළුවන්. ඒ නිසා ලෝක සම්මතයෙ වුනත් අනර්ථය නම් කෙලින්ම අයින් කරන්න ඕන දෙයක්. මනස යොදවල කල්පනා කරල බැලුවම නැවත ඒ ගැන හිතන්නවත් දෙයක් නෑ.

දැන් හොඳ පැත්ත අරගෙන බැලුවොත්, ලෝක සම්මතයේ අර්ථයක් වෙනව කියන්නෙ, හොඳට ඉගෙන ගෙන හොඳ රස්සාවක් කරල හොඳ තැනකට එන්න හදන ලෝක සම්මතයේ අර්ථවත් වැඩ පිළිවෙල. මේ කිව්ව හොඳ ඇත්තටම හොඳද? හොඳට ඉගෙන ගන්න කොච්චර මහන්සි වෙන්න ඕනද? රෑ දවල් වෙනසක් නැතුව මහන්සි වෙන්න ඕන. එහෙම නැත්නම් විභාගය සමත් වෙනව කියන ඉලක්කයට යන්න බෑ. ඉතින් ඒ මහන්සිය සැපක්ද දුකක්ද කියල හිතල බැලුවොත්, මොන පිස්සුද රෑ නිදි මරන එක සැපක්ද කියල හිතෙනවා. හදිස්සියේ විභාගය අසමත් වුනොත් කියල එන සිතිවිල්ල සැපක්ද? මම සමත් වුනත්, දෙවැනියා වුනොත් කියල එන සිතිවිල්ල සැපක්ද? දූන් අර විභාගය සමත් වෙන්න ඕන කියන ඉලක්කයට යන්න ක්‍රියාවෙන්, මනසින් අවුරුදු ගානක් දුක් විඳිනවා. නමුත් එහෙම දුකක් විඳිනව කියල පෙනෙයිද? ඉහළම ලකුණු එක්ක ලංකාවෙ පළමු වෙනිය වෙලා විභාගය සමත් වුනොත්, එදාට සතුටක් සැපක් එනවා. ඒක නෑ කියන්න බෑ. ඒ සතුට සැප ගන්න තමයි අර අවුරුදු ගානක් කට්ට කෑවෙ, එහෙම නැත්නම් මහන්සි වුණේ.

දූන් ඇහුවොත් කියන්නෙ මොකක්ද? ''අම්මේ විභාගය සමත් කර ගන්න මම විඳපු දුකක්. මම විතරක්ද අම්ම තාත්ත ඒ අයත් නිදි මැරුවනෙ මට තේ කෝපි හදල දෙන්න. ඒ මදිවට තාත්ත ණයක් අරගෙනයි මගේ පන්තිවලට සල්ලි ගෙව්වෙ. පොඩි ගානක්ද ඒකට ගෙවන්න වුණේ!" තාත්ත එහෙන් ණය ගෙවන්න දවස ගානෙ දුක් වින්දා. ඒත් ගානක් නෑ සතුටුයි, පුතා දුව විභාගෙන් ඉහලින්ම සමත් වෙලා. දූන් ඇයි අර කට්ට කෑව කියල එහෙම වචනයක් කෙනෙකුට ඉබේටම වුනත් කියවෙන්නෙ? ''පුදුම කට්ටක් කෑවෙ මේක කරගන්න, දැන්නම් සතුටුයි!" බල්ලෙක් අරගෙන බැලුවොත්, උෟට මස් කටුවක් දුන්නොත් උෟ මොනව කරයිද? තව එකෙකුට ඒක ළඟටවත් එන්න දෙයිද? උෟ ඒක කොච්චර නම් ආරක්ෂා කරනවද? ඒ වගේම ඒ මස් කටුව කෑව කියල උගේ බඩ පිරෙයිද? කටුව කන වාරයක් පාසා ඒ කටුව උගේම කටේ ඇනිල විදුරුමහ තුවාල වෙලා එන ලේ රහට තව තවත් ඒ කටුව හපනවා, හංගනවා, අනෙක් බල්ලොත් එක්ක රණ්ඩු කර ගන්නවා. ඒ වගේම තමයි ඒ විභාගෙට පාඩම් කරපු කෙනත් කටු කනවා, අර මහන්සිය වෙනවා. එතකොට අර බල්ලට දැනුණ වගේ ඒ පුද්ගලයට දැනෙන ලේ රහ මොකක්ද? ඒ තමයි ලංකාවෙන් පළමු වැනියා වෙලා විභාගය සමත් වීම. අන්න ඒ රහ වැටිල තමයි අවුරුදු ගානක් තිස්සෙ රෑ දවල් මහන්සි වෙලා කටු කෑවෙ.

දූන් කෙනෙකුට හිතෙන්න පුළුවන්, ඉතින් හොඳයිනෙ එයා කැමති විදිහට විභාගෙ සමත් වුනානෙ, එයාගෙ කැමැත්තට ඒක ඒ විදිහටම සිද්ධ වුනානෙ, ඒක කැමති විදියට තියෙනවනෙ කියල. එහෙම තර්කයක් කෙනෙකුට ගේන්න පුළුවන්. ඇත්තටම ඒක එහෙමමද? කැමති සේ තියෙනව කිව්වත්, කැමති සේ තම වසඟයේ පවත්වන්න බෑ කිව්වත්, අර ලංකාවෙන්ම පළමු වැනියා වීම තමන්ගෙ වසඟයේ පවත්වන්න පුළුවන්ද? මේ අවුරුද්දෙ ඒ පුද්ගලය පළමු වැනිය කියල සතුටු වෙවී ඉන්නවා. ලබන අවුරුද්දෙ වෙන කෙනෙක් එතනට එනවා. ඒකද ඒ පුද්ගලයගෙ කැමැත්ත වුණේ? නෑ, ඒක නෙවෙයි. හැමදාම තමන් පළමු වෙනියා වෙලා ඉන්න. එහෙම කැමැත්තක් තිබුණත් ඒක පවත්වන්න බෑ. අනිවාර්යෙන්ම වෙන කෙනෙක් එතනට එනවා. ඒකයි කිව්වෙ කැමති සේ පවත්වන්න බෑ, කැමති සේ නෑ කියල. ලෝකය හැම තිස්සෙම එක විදිහට තියෙන්නෙ නෑ, වෙනස් වෙනවා. වෙනස දරා ගන්න බෑ, ඒ වෙනස අපට ඕන විදිහට වෙන්නෙ නෑ. සැප එනවා, ආපු සැප තියෙන්නෙ නෑ ගෙවිල යනවා. දුක එන කොට කොහොමත් දුකයි. ඒත් ආපු සැප යවන්න කැමති නෑ. ඒක තියා ගන්නමයි උත්සාහය. ඒකෙන් දුකක්මයි එන්නෙ.

දැන් ලංකාවෙන්ම පළමු වැනිය වුනා. ඊට පස්සෙ ඒ පුද්ගලයට නිකන් ඉන්න පුළුවන්ද? මම පළමු වැනියා කියල සතුටු වෙවී ඉන්න පුළුවන්ද? බෑ, ඒ පුද්ගලයට තවත් අර ලෝක සම්මතයෙ හොඳයි කියපු ඉලක්ක තියෙනවා. හොඳ රස්සාවක් හොයා ගන්න ඕන. දැන් ඒ පුද්ගලයත් එක්ක තරඟ කරන්න ඊට කලින් පළමු වැනියා වෙච්ච අයත් ඉන්නවා. ලේසි නෑ, ඒ තරඟයට කලින්ට වඩා වෙහෙසෙන්න වෙනවා. හොඳ රස්සාව කියන ලේ රහට රහ වැටිල තව කටු කන්න මහන්සි වෙන්න වෙනවා. නැවතත් පොර පිටියට බහින්න වෙනවා. ඒකෙන් පැරදුනොත් එන දුක වගේම, ඒකෙන් දිනුවොත් ඒ දිනපු දේ ඒ විදියටම තියා ගන්නත් දුකක් විඳින්න ඕන. අන්තිමට කොහෙන් ගියත් දුකමයි.

මී පැණි රසයි. ඒත් දිගටම කන කොට මොකද වෙන්නෙ? එපා වෙනවා, ඒකෙනුත් දුකක් එනවා. කොච්චර රස වුනත් වැඩක් නෑ, පොඩි සැපයයි එන්නෙ. වැඩිපුර කන්න කන්න එපා වෙනවා. නමුත් තිත්ත කසායක් බොන කොට ඒක මුල ඉඳන්ම දුකයි. දිගටම බිව්වොත් අර මී පැණි දිගටම බොන කොට එපා වෙනව වගේ, කසාය දිගටම බිව්වොත් මුලදී සැප එනවද, පැණි රස එනවද? නෑ. ඒක දිගටම දුකයි. ඒ නිසා තමයි බුදුන් වහන්සේ සැප දුක කියන ගොඩවල් දෙක පොදුවේ අරගෙන සියල්ල දුකයි කියල කිව්වෙ.

යමක් කැමති සේ නෑ කියන කොට මේ කයත් කැමති සේ නෑ. හැබැයි කැමති සේ තියෙනව වගේ පිටින් පේන්න දේකුත් තියෙනවා. දුකින් හට ගත් යමක් ඇත්නම් ඒක කැමති සේ තියෙනවද කියල ඇහුවොත්, ඒකාන්තයෙන්ම උත්තරය නෑ කියන එක. සංඛාර දුක්ඛ, දුක්ඛෙ දුක්ඛ, විපරිනාම දුක්ඛ කියන මේ තුනෙන් අහක් වෙච්ච කිසිම දෙයක් ලෝකයේ විද්‍යමාන නෑ. හැම දෙයක්ම මේ තුනේ සම්පිණ්ඩනයක්. හැබැයි මෙතනදි දුකයි, දුක විඳීමයි කියන කාරණා දෙක පටලවා ගන්න හොඳ නෑ. දුක කියන්නෙ ඒකෙ ස්වභාවය. දුක විඳීම කියන්නෙ ඒ ☞

ස්වභාවයට පත් වුනාම දැනෙන ආකාරය. නමුත් මේ දෙවැනි අවස්ථාවට තමයි අද දුක කියන්න පුරුදු වෙලා ඉන්නෙ. ඒ නිසා ලෝකෙ දුකයි කිව්වම, විඳින කොටනෙ දුක කියල තර්කයක් දානවා. උදාහරණ විදියට සීනි පැණි රසයි කියනවා. හැබැයි සීනි කන කොට තමයි පැණි රස දැනෙන්නෙ. පැත්තකින් සීනි තිබුණත් පැණි රසයි කියනවා. නමුත් පැත්තක තියෙන සීනිවලින් කාටවත් රස දැනෙන්නෙ නෑ. හැබැයි සීනි මොන රසද ඇහුවොත් පැණි රසයි කියනවා. ඒ පැණි රස එන්නෙ කෑවම. එතකොට සීනි කෑවම පැණි රසයි කියන කාරණය, ඒක නිකං තියෙන කොට ඒකටත් ආදේස කරල කියනවා. නමුත් පැණි රසයි, පැණි රස දැනීමයි කියන්නෙ කාරණා 2 ක්. පැණි රස දැනෙනවයි කියන්නෙ වේදනා චෛතසිකය. පැණි රසයි කියන්නෙ ඒකෙ ස්වභාවය. ඒ ස්වභාවය ඒක කෑවත් නැතත් ඒකාන්තයෙන්ම තියෙනවා.

මේ වගේ ලෝකය දුකයි කිව්වම මිනිස්සු පුරුදු වෙලා ඉන්නෙ, විඳින දුකේ ස්වභාවයට ආදේශ කරල කතා කරන්නෙ. නමුත් වින්දත් නැතත් දුකයි කියන්නෙ ලෝකෙ ස්වභාවය. එතකොට දුකයි කියල කියන්නෙ යමක ස්වභාවය. අර දුක් කරුණු තුනෙන් යුක්ත ස්වභාවයක් ලෝකයේ සියලු දේට තියෙනවා. ඒක ඇසුරු කරන්න ගියොත් ඒ දුක විඳින්න වෙනවා. නමුත් දැන් ලෝක සත්වයා දුකයි කියල කියන්න පුරුදු වෙලා ඉන්නෙ විඳින දුකට. විඳින්නාට දුක පනවමියි කියල බුදුන් වහන්සේ දුක පැනෙව්වෙත් ඒකයි. එතකොට දුකයි, දුක පැනවීමයි කියන්නෙත් කාරණා 2 ක්. හරියට දඬුවමයි, දඬුවම් පැනවීමයි වගේ. මෙහෙම වරදක් කළාට දඬුවම මරණීය දණ්ඩනයයි කියල නීති පොතේ සටහන් කරල තියෙනවා. ඒ තමයි දඬුවම. එහෙම වරදක් කරපු කෙනාට ඒ දඬුවම පනවනවා. පැනෙව්වොත් ඒක විඳින්න වෙනවා. ඒ නිසා විඳින්න ගියොත් තමයි දුක පනවන්නෙ. පැනෙව්වත් නැතත් දුක කියන එක ස්වභාවයෙන්ම ඒකෙ තියෙනවා.

ඒ නිසා දුක කියන කාරණය වෙනම තේරුම් ගන්න ඕන. දුක කියන්නෙ යමක ස්වභාවය. හැබැයි ඒක ඥානයෙන් දකින්න ඕන දෙයක්. ලෝකෙ දුකයි කිව්වම පෙළක් අය අහනවා, සියල්ලම දුක වෙන්නෙ කොහොමද, වින්දොත්නෙ දුක කියල. ඒ අය එහෙම කතා කරන්නෙ, විඳීම දුකයි කියන තැන ඉඳගෙන. නමුත් යථාර්ථය ඒක නෙවෙයි. දුක එකක්, දුක් වේදනාව තව එකක්. දුක කියන යමක් ඇත්ද, ඒක ඵස්ස පච්චයා වේදනා කියල ඒකට අනුකූල වුනොත් වින්දනය එනවා. ගින්දර පිච්චෙනවයි කියන්නෙ ඒකෙ ස්වභාවයක්. ගින්දරට අත දැම්මොත් පිච්චීමට ගොදුරු වෙනවා, විඳීමට ලක් වෙනවා. නමුත් ලෝකයා ගින්දරට පිච්චෙනවයි කියල අදහස් කරන්නෙ, ගින්දරට ගොදුරු වීම නිසා හට ගත් දුක් වේදනාවට. ගින්දරට පිච්චීම කියන්නෙ ඒකෙ ස්වභාවයක්, ධර්මතාවයක්. පිච්චීම දැනීම කියන්නෙ වේදනා චෛතසිකයක්. එතකොට ලෝකෙ හැම දෙයක්ම දැවෙනවා, පිච්චෙනවා. දැවෙන පිච්චෙන එක දුකද කියල ඇහුවොත්, ඒ දැවීමට පිච්චීමට ගෝචර වුනොත් තමයි දුක දැනෙන්නෙ. දුකයි, දුක දැනීමයි කියන්නෙ මේ වගේ කාරණා 2 ක්. නමුත් අද දුක දැනෙනවයි කියන එකටම දුක කියන අදහස ගන්න පුරුදු වෙලා ඉන්නවා. ඒ නිසා සියල්ල දුකයි කිව්වම තර්කවාද කරනවා. එතනදී සියල්ලේම ස්වභාවය තමයි දුක කියන්නෙ. ඒක ඇසුරට ගියොත් ඒකෙන් මිදෙන්නෙ නෑ, දුක විඳින්න වෙනවා.

එතකොට සියල්ල දුකයි කියන්නෙ ප්‍රඥා චෛතසිකයේ නිගමනය. සියල්ලෙම සැපයි, දුකයි දෙකම තියෙනව කියන්නෙ වේදනා චෛතසිකයේ නිගමනය. මේ දෙකේ වෙනසක් තියෙනවා. ප්‍රඥාවෙන් යථාවබෝධය ලබපු අය ප්‍රඥා චෛතසිකය ප්‍රධාන කරල යමක් දකිනවා. සැපේ තියෙන දුක් ස්වභාවයත් මේකයි කියල ප්‍රඥාවෙන් දැකල සියල්ල දුකයි කියල නිගමනය කරනවා. ඒ විදියට ප්‍රඥාවෙන් තීරණය කරන්න බැරි අය, වේදනා චෛතසිකයට බැහැල සියල්ල දුක නෑ, දුක සැප දෙකම තියෙනව කියනවා. වේදනා චෛතසිකයට අනුව ඒක ඇත්ත, බොරුවක් නෙවෙයි. නමුත් ප්‍රඥා චෛතසිකයට සාපේක්ෂව බැලුවොත් සියල්ල දුකයි. මේ ක්‍රම දෙකට ගත්තම කතා දෙකම හරි.

ඒ වගේම පංචස්කන්ධය දුක්ඛ ලක්ෂණයෙන් යුක්තයි. සියලු වේදනාවන් දුකයි කියන්න හේතුවත් ඒකයි. ඒකාන්තයෙන්ම වේදනාවක් ගොඩ නැගෙන්න නම් පංචස්කන්ධයක් තියෙන්නම ඕන. පංචස්කන්ධයක් නැතිව වේදනාවක් විඳින්න බෑ. දුකෙන් තොර සැපක් විඳින්න බෑ කියන්නෙත් ඒකයි. මොනම සැපක් හෝ විඳිනව කිව්වොත් ඒකාන්තයෙන්ම ඒක දුකෙන් තොර නෑ. මොකද පංචස්කන්ධය තියෙන නිසා. ඒක දුක් කඳක්. ඒ දුක් කඳෙන් හට ගන්න අසහනය සමනය කරන ප්‍රතිකාරවල දැනෙන ස්වභාවයට තමයි ලෝක සත්වයා සැප කියල රැවටෙන්නෙ. පංචස්කන්ධය කියන මහා දුක් කඳ දෙවෙනි කරල ඒ සැප මාත්‍රයට රැවටෙනවා. නමුත් සැපයි කියල වෙන් කරල ගන්න එකක් නෑ. මොකද පංචස්කන්ධය අහක් කරන්න බැරි නිසා. ඒකට මූල හේතුව අවිද්‍යාව.

දැන් මෙහෙම දුකක්ම ගෙන දෙන වැඩපිළිවෙලක් කරන මනුස්සයෙක් ගැන, ඒ දුකින් මිදුන උතුමෙකුට එන සිතිවිල්ල මොන වගේද? අනේ මේ මනුස්සය කරන වැඩේ තේරුමක් තියෙනවද, මේ අනර්ථයක්ම නේද කරගන්නෙ කියල හිතෙනවා. ඒ නිසා ලෝක සම්මතයේ අර්ථයක්, හොඳක් කියන දේ ආර්යන් දකින්නෙ අනර්ථයක්, තේරුමක් නැති කිසි හරයක් නැති දෙයක් විදිහට. උපමාවක් කියනව නම්, කෙහෙල් කඳක් අරගෙන කෙනෙක් ඒකෙ අරටුව හොයන්න පතුරු ගහන කොට, ඒක දකින කෙහෙල් කඳ ගැන හොඳට දන්න කෙනෙක් මොකක් කියයිද? උඹ ඔය කරන වැඩෙන් හරයක් (අරටුවක්) නම් හොයන්න හම්බ වෙන්නෙ නෑ, නිකන් මහන්සිය විතරයි. එක පතුරක් ගැලවෙන කොට අනෙක් පතුර තියෙන තැන දැකල, මෙන්න අරටුව හමුවුණා කියල එන තාවකාලික සතුට විතරයි. ඒක ගැලෙව්වට පස්සෙ තව එකක් එනවා. අන්තිමට හරයක් නම් හොයා ගන්න ලැබෙන්නෙ නෑ. ඉතින් මේ අරුතින් තමයි ලෝක සම්මතයේ අර්ථයට සහ අනර්ථයට එහා ගිය ලෝකෝත්තර අර්ථය සහ අනර්ථය කියන්නෙ.

ලෝක සම්මතයේ හොඳයි කියල ගන්න වැඩ පිළිවෙලට කොච්චර උල්පන්දම් දුන්නත්, කොච්චර වැඩමුළු කළත්, වචන දාහක් නෙවෙයි ලක්ෂයක් නෙවෙයි දස ලක්ෂයක් කිව්වත්, අර්ථයක් නෑ කිව්වෙ මෙන්න මේ හේතුවෙන්. ඉතින් මේ මහා දුකින් මිදෙන්න ''සෝවාන් ඵලයෙන් නිදුක් වෙත්වා'' කියල වචන කිහිපයක් කිව්වත්, ඒ වචන ටික මහා අර්ථයක් ගෙන දෙනවා. එහෙම නැත්නම් ''සුවපත් වේවා'' කියල කියන වචන දෙකත් ඇති. ඒකට සාදු සාදු සාදු කියල දොහොත් මුදුන් තියල අනුමත කළත් ඒකෙන් අර්ථයක්මයි වෙන්නෙ, සැනසීමක්මයි එන්නෙ.

*වහරක අභයරතනාලංකාර හිමිපාණන් විසින් දේශිත සැඟවුණ දහම් කරුණු සමග ධම්මපද පාලිය - සහස්ස වග්ගය ඇසුරින් සකස් කළේ:*

**ෆික්රි ඉස්මයිල්**
**පරිගණක ඉංජිනේරු - ගොතටුව**

# පසේ බුදු වර්ණනාව



ලොව්තුරා බුද්ධ සාසනයේ බෝධි වන්දනා ක්‍රම දෙකක් තියෙනවා. එක ක්‍රමයක් තමයි බෝසතාණන් වහන්සේ නමක් සාරාසංඛ්‍ය, අටාසංඛ්‍ය සහ සොළොසාසංඛ්‍ය කල්ප ලක්ෂ වශයෙන් අප්‍රමාණ කාලයක් පුරා දස පාරමිතා ධර්මයන් පූර්ණ කිරීමෙන් ගොඩ නැගුන මහා ශක්තියෙන්, උන් වහන්සේලාගෙ අවසන් අත්බැවේදි සහජාතයෙන් බිහිවෙන මහා වෘක්ෂයට වන්දනාමාන සත්කාර කිරීම. අනෙක් ක්‍රමය තමයි තුන්තරා බෝධිය වෙනුවෙන් ප්‍රතිපත්ති පිරීම, ඒ බෝධියක් පතාගෙන කුසල් වැඩීම සහ පූර්ණ කිරීම. සම්මා සම්බෝධිය හෙවත් ලොව්තුරා බුද්ධත්වය ප්‍රාර්ථනා කරමින් ඒ අනුව කටයුතු කිරීමෙන් ලොව්තුරා බුද්ධත්වයට පත්වීම එක බෝධියක්. දෙවන බෝධිය තමයි බුදු කෙනෙක් ලොව පහළ වෙලා නැති කාලයකදි, තමන්ගෙම ඥානයෙන් චතුරාර්ය සත්‍යය අවබෝධ කර ගැනීමෙන් පච්චේක බෝධිය හෙවත් පසේ බුදු බව සම්පූර්ණ කිරීම. ඒ කියන්නෙ තමන් විසින්ම ප්‍රත්‍ය කරනවා, තව කෙනෙක්ගෙ ආධාර ඕන නෑ. ප්‍රත්‍යයන් බොහෝ තිබුණත් තමන් තුලින්මයි ප්‍රත්‍ය කර ගන්නෙ. තමන්ගෙ අදහස් දහමට අනුව ප්‍රත්‍ය වෙනවා, පැහෙනවා. තුන්වෙනි බෝධිය තමයි ශ්‍රාවක බෝධිය. ඒ කියන්නෙ සම්මා සම්බුදුවරයන් වහන්සේ නමක් ලොව පහල වෙලා ඉන්න කාලයකදි උන් වහන්සේගෙන් හෝ උන්වහන්සේගෙ ශ්‍රාවක පරම්පරාවකින් පැවත එන ආර්යන් වහන්සේ නමකගෙන් හෝ චතුරාර්ය සත්‍ය ධර්මය කැටි වූ සද්ධර්මය අහල අරිහත් ඵලයට පත්වෙලා සම්පූර්ණ කිරීම. ඒ විදියට බණ අහල ඊට පස්සෙ උත්සාහයෙන් වීර්යෙන් කටයුතු කිරීමෙන් අරිහත් ඵලය අවබෝධ කරගන්න නිසා ශ්‍රාවක බෝධිය කියල කියනවා.

ඒ නිසා සත්ධර්මය තියෙන කාලයක ආර්ය ශ්‍රාවක පරම්පරාවෙන් හෝ බුදුන් වහන්සේ වැඩ සිටින කාලයක උන් වහන්සේගෙන් හෝ බණ අහල දහම් අවබෝධ කරගන්නවට වඩා අමාරු කාර්යක් තමයි, බුද්ධ කියන නමවත් අහන්න නැති කාලෙක තනියම දහම් අවබෝධ කරගැනීම. ඒ නිසා තමයි පිළිවෙලින් එන කොටත් තුන්තරා බෝධියට මුලින්ම සම්මා සම්බෝධියත්, දෙවනුව පච්චේක බෝධියත්, තුන්වෙනුව ශ්‍රාවක බෝධියත් එන්නෙ. ඉතින් කෙනෙකුට හිතෙන්න පුළුවන්, උන් වහන්සේලා කොහොමද කිසිම උදව්වක් නැතුව එහෙම තනියම බෝධිය සම්පූර්ණ කරගන්නෙ කියල. මේ ප්‍රශ්නයම ආනන්ද හාමුදුරුවන්ටත් තිබුණා.

දවසක් ආනන්ද හාමුදුරුවො බුදුන් වහන්සේ හමු වෙලා වැඳ නමස්කාර කරල ප්‍රශ්නයක් ඇහුවා. ''වීරයන් වහන්ස පසේ බුදුවරු ලොව පහල වෙත්. ඒ බුදුවරු කිනම් හේතුවකින් ලොව පහල වෙත්ද?'' (අපදාන පාලිය 1 - පච්චේක බුද්ධාපදානය). ඉතින් උන් වහන්සේ දුන්න උත්තරය තමයි මේ. ''පෙර බුදුවරයන් වෙත කරන ලද පුණ්‍ය සම්භාර ඇති, ඒ බුදු සසුන්හි නොලබන ලද නිවන් ඇති, ඉතා සියුම් නුවණින් යුතු ඒ ප්‍රාඥයෝ එම සංවේගයම මුල් කොට බුදුවරුන්ගේ අවවාදානුශාසනාවන් රහිත ස්වල්ප මාත්‍ර වූ ද අරමුණක් හේතු කොට ගෙන පසේ බුදු බවට පැමිණෙත්''. (අපදාන පාලිය 1 - පච්චේක බුද්ධාපදානය).

ඉතින් ඒ බුද්ධ දේශනාවට අනුව පසේ බුදුවරයෙක් වෙන්නත් අමුතු මාර්ගයක් නෙවෙයි තියෙන්නෙ, පෙර බුදුවරු බුද්ධ සාසනය වෙනුවෙන් කරපු දානමාන ආදී පින්කම් කටයුතු. ඒ වගේම පැතුවා විතරක් නෙවෙයි, ඒ සඳහා උත්සාහ වීර්ය කරලත් තියෙන්න ඕන. ඒ කාරණය උන් වහන්සේ පැහැදිලිවම දේශනා කරල තියෙනවා. මෙතනදි බැලුවොත් ''ඒ බුදු සසුන්හි නොලබන ලද නිවන් ඇති'', ඒ කිව්වෙ නිවන් ලැබෙන්න හේතු තියෙනවා, නමුත් මොකක් හෝ හේතුවක් උඩ ඒ බුද්ධ සාසනයේ නිවන් දකින්න බැරි වෙනවා. සමහර විට ඊටත් පෙර බුදු වරයෙකුගෙ විවරණයක් නිසා වෙන්නත් පුළුවන්. ඒත් උත්සාහ කරනවා, නමුත් නිවන් ලබන්න විදිහක් නෑ. හේතුව අර කලින් බුදුන් වහන්සේගෙ විවරණය.

ධර්මයේ එහෙම සඳහන් වෙන තැන් තියෙනවා. එකක් තමයි දේවදත්ත තෙරුන්ගෙ අවසාන මොහොත. දේවදත්තට උවමනා වුනේ බුදුන් මරා බුදු වෙන්න. මොන දෘෂ්ඨියක හිටියත් අවශ්‍යතාවය වුනේ බුදු වෙන්න. ඒ සඳහා බුදුන් මරන්නයි උවමනාව තිබුණෙ. ඉතින් දේවදත්ත තෙරුන් සංඝ භේදය සිද්ධ කරල, සංඝයා වහන්සේ පන්සීයක් ගෙන ගියාට පස්සෙ, බුදුන් වහන්සේ ආනන්ද හාමුදුරුවන්ට කියපු කාරණයක් තිබුණා. ඒ තමයි දේවදත්තට මොනම හේතුවක් උඩවත් මාව දකින්න ලැබෙන්නෙ නෑ කියල. නැවතත් දේවදත්ත බුදුන් වහන්සේ බැහැදකින්න එන මොහොතෙත් උන් වහන්සේ කියා සිටියෙ, ඒ කාරණය එහෙම්මමයි දේවදත්තට නැවතත් ☞

මාව දකින්න ලැබෙන්නෙ නෑ කියල. ඉතින් බුදුන් වහන්සේ හමුවෙන්න කලින් දේවදත්ත අපාගත වුන හැටිත්, බුදුන් සරණ ගිය හැටිත් අහල තියෙන කාරණා. ඊට පස්සෙ බුදුන් වහන්සේගෙන් අහපු පැණයක් තිබුණා. ඒ කියන්නෙ දේවදත්ත මේ තරම් ආනන්තරීය පාප කර්ම දෙකක්, ඒ වගේම ඉතාම භයානක පාප කර්ම කරගනියි කියල දැන දැනත් ඔබ වහන්සේ ඇයි දේවදත්තව පැවිදි කළේ කියල.

ඒකට ඉතින් උන් වහන්සේ දුන්න පිළිතුර තමයි, කොච්චර දේවල් කළත් දේවදත්ත අවසාන මොහොතෙ හෝ මා කෙරෙහි පැහැදෙනවා, ඒ පැහැදීම හේතු කොට ගෙන මතු පසේ බුදුවරයෙක් වෙනවා, දේවදත්ත ගිහිව හිටිය නම් එහෙම සරණක්වත් ලැබෙන්නෙ නෑ කියන කාරණය. ඉතින් මෙහෙම කෙනෙක් මතු බුද්ධ සාසනවලත් කොච්චර උත්සාහ කළත්, අර බුද්ධ වචනයට පිටින් නොයා අවශ්‍ය කාලයෙදි තනිව හෝ මාර්ග ඵල අවබෝධ කරගන්නවා. ඒකයි එතනදි බුදුන් වහන්සේ දේශනා කළේ ''ඒ බුදු සසුන්හි නොලබන ලද නිවන් ඇති'' කියල.

අනෙක් අවස්ථාව තමයි සුමන කියන මල් කරුවා. මේ සුමන මල්කරුවා බිම්බිසාර රජතුමාට මල් මාලා හදල ගෙනියන කෙනෙක්. දවසක් ගෞතම බුදුන් වහන්සේ දැකල පැහැදුනු සිතින් මල් පූජාවක් කරන්න හිතුනා. නමුත් රජතුමාට ගෙනියන මල්, රජතුමාට නොලැබුනොත් මරණය හෝ ඊට සමාන වේදනා ගෙන දෙන දඬුවමකට ලක්වෙන්න ඉඩ තියෙනවා. ඒ වුනත් අර පැහැදීම බලවත් වුණා. ඒත් එක්කම තව සිතිවිල්ලක් ආවා. ''මේ මල් රජතුමාට දුන්නොත් මට දවසකට දෙකකට කාල බීල ඉන්න පුළුවන් ගානක් තමයි ලැබෙන්නෙ. නමුත් බුදුවරයකුට මේ මල් පූජා කළොත් මට කල්ප ගානකට සැප සම්පත් එක්ක මේ ලෝකයේ ගත කරන්න පුළුවන්. එහෙම ලැබෙනව කියල මම අහලත් තියෙනවා. රජතුමා මොන දඬුවමකට මාව ලක් කළත් මට කමක් නෑ, මම මේ මල් බුදුන් වහන්සේට පූජා කරනවා'' මෙහෙම හිතල බුදුන් වහන්සේට මහා මල් පූජාවක් කළා. ඊට පස්සෙ ආනන්ද හාමුදුරුවන්ට බුදුන් වහන්සේ ඒ පූජාවෙ වටිනාකමත්, තම දිවි පරදුවට තියල බුද්ධ සාසනයට පිදීමේ වටිනාකමත්, ඒ නිසා එන ලැබීමත් විස්තර කළා. අවසානයේ සුමන මල්කරුවා, මතු කල්පයක සුමන නමින් පසේ බුදුවරයෙක් වෙන බවත් දේශනා කළා.

මේ පරස්පර කාරණා දෙකක් නමුත් දෙන්නම පසේ බුදුවරු වෙලා තමයි නවතිනව කිව්වෙ. නමුත් දේවදත්ත තෙරුන් කොච්චර අකටයුතුකම් කළත්, පැතුම වුනේ බුදු වෙන්න. හරි ක්‍රමය දැනගන්න කොට ප්‍රමාද වැඩියි. ඒත් අවසානයේ ආපු පැහැදීම ඒකට උදව් වුණා. හැබැයි මෙතනදි පැහැදුනා කිව්වෙ මගඵල ලාභීන්ට ඇති වන පැහැදීම නෙවෙයි. අන්තිම අසරණ වෙලා මරණ භය මුල් කර ගෙන ඇති වෙච්ච පැහැදීමක්. ඒ වගේම ඒ අවස්ථාවෙදි සුමන මල්කරුවගෙ පැතුම වුණෙත් ලෞකික සැප සම්පත් මිසක් නිවනක් නෙවෙයි. ඒත් ප්‍රතිඵලය එකමයි. නමුත් ලොව්තුරා බුදු කෙනෙක්ගෙ ආශිර්වාදය එන්නෙ සියලු දුකින් මිදෙන්න. බුදු වෙන්නත් ඕන නැත්නම්, උන් වහන්සේලාගෙ ශ්‍රාවකයෙක් වෙන්නත් ඕන නැත්නම්, ඒත් උන් වහන්සේලා කෙරෙහි පැහැදීමක් තියෙනව නම්, ඒ පැහැදුන අප්‍රමාණ ගුණස්කන්ධයේ ආශිර්වාදයත් නිවන නම්, බොහෝ විට සසර කෙලවර කරගන්නෙ මේ පසේ බුදු කියන අවස්ථාවෙන්. ඉහත අපදාන පාළියෙන් උපුටා ගත් මේ කොටසෙන් ඒ කාරණය ඔප්පු වෙනවා. ''ඉතා සියුම් නුවණින් යුතු ඒ ප්‍රාඥයෝ එම සංවේගයම මුල් කොට බුදුවරුන්ගේ අවවාද අනුශාසනාවන් රහිත ස්වල්ප මාත්‍ර වූ ද අරමුණක් හේතු කොට ගෙන පසේ බුදු බවට පැමිණෙත්'' මෙතනදි එම සංවේගයෙන්ම කියල කිව්වෙ, මට අවස්ථාව තිබිලත් නිවන් දකින්න බැරි වුනානෙ කියන හැඟීම.

ඊළඟට ''ස්වල්ප මාත්‍ර වූ ද අරමුණක් හේතු කොට ගෙන'' කිව්වෙ මොකක්ද ? ඒ කිව්වෙ පොඩි හෝ අරමුණක් වෙන්න පුළුවන්. බුදු කෙනෙක්ගෙ අවවාද අනුසාසනා දේශනා නැතුව කොහොමද එහෙම ස්වල්ප මාත්‍ර අරමුණකින් තනිව නිවන් දකින්නෙ ? ඒකට සසර පුරුද්දත් උදව් වෙනවා. කලින් කිව්ව වගේ බුද්ධ සාසනවල කරපු පුද සත්කාර උත්සාහ වීර්ය කිරීම් මේ සේරම උදව් වෙනවා. හරියට දාරුචේරිය පද පේළි දෙකෙන් තුනෙන් අරිහත් වුණා වගේ. මෙතනදිත් බාහිර අරමුණක් ඇවිත් උන් වහන්සේලාට එක පාරටම අවබෝධ වෙනවා. උපමාවක් කියනව නම්, කෙනෙක් පොරවකින් මහ විසාල ගහක් කපනවා. ගහ වැටෙන තැනට එන්න නම් අන්තිමට ගහන්න ඕන එක පොරෝ පාරයි. නමුත් එතනට එන්න පොරෝ පාරවල් දහස් ගණන් කලින් ගහල තියෙන්න ඕන. ඒ වගේ දෙයක් තමයි උන් වහන්සේලාට වෙන්නෙත්. දහම් අවබෝධ වෙන්න සුළු කාරණයක් ඇති.

ධර්මයේම තියෙන උදාහරණයක් පෙන්නුවොත්, උප්පලවණ්ණා අරිහත් තෙරණියගෙ අපදානයේ මෙහෙම විස්තරයක් තියෙනවා. එතුමිය එක්තරා අත්බැවක බමුණු කුලයක ඉපදිලා හිටපු අවස්ථාවක පසේ බුදුවරයන් වහන්සේ නමක් දැකල පැහැදිලා පන්සීයක් මල්වලින් වැසුනු විලඳ පූජා කරල පැතුමක් පැතුවා. ඒ වගේම ඒ කාලෙ ඇගේ සැමියාත් උන් වහන්සේට මී පැණි දන් දීල ඒ පැතුමම පැතුවා. ඉතින් ඒ අත්බැවෙන් චුත වෙලා ඊළඟ අත්බැවේ රජ මෙහෙසියක වෙලා පන්සීයක් පුතුන් වැදුවා. මේ රාජ කුමාරවරු පන්සීයම ජල ක්‍රීඩා කරන අවස්ථාවක, පෙති ගිලිහුණු නෙළුම් මලක් දැකල, ඒ වෙලාවෙම ඒ පන්සිය දෙනාම පසේ බුද්ධත්වයට පත් වුණා. එතකොට කලින් බුද්ධ දේශනයට අනුව, සියුම් නුවණක් තියෙන ප්‍රඥාවන්තයො තමයි පසේ බුදුවරු වෙන්නෙ. ඒ වගේම උන් වහන්සේලාට පසේ බුද්ධත්වයට පත්වෙන්න ඉතාම සුළු කාරණයක් ඇති. අර පෙති ගිලිහුණු නෙළුම් මල වගේ. ඉතින් ඒ මොහොතෙ උන් වහන්සේලාගෙ විදර්ශනා ඥානයට ඒ කාරණය අහුවෙනවා. ''දැන් පෙතිවලින් වට වෙච්ච මලක් කොච්චර ලස්සනට පියකරුව තියෙනවද ? දැන් ඒකෙ පෙති හැලිල, කෝ ඒකෙ කලින් තිබිච්ච පියකරු බව මෙලෙක් බව ? කලින් ලස්සනට රොනින් පිරිල තිබුන මල ! බඹරු මීමැස්සො ඇදුන මල ! දැන් පෙති හැලිල රොනුත් නෑ, මී මැස්සොත් නෑ, බඹරුත් නෑ. අපිත් දැන් නෙළුම් මල් වගේ ලස්සනට ඉන්නවා, පෙනුමට ඉන්නවා. අපිටත් කවද හරි මේ පෙති හැලිච්ච මල් වගේ තත්වෙට පත් වෙලා නැසෙන්න නේද වෙන්නෙ ?'' මේ විදියට පොඩි කාරණයකින් පවා උන් වහන්සේලාගෙ සසර වඩපු වීර්යත් එක්ක නිවන් අවබෝධ කරගන්න පුළුවන්. ධර්මයේ විවිධ අවස්ථා මේ විදිහට සඳහන් වෙනවා. උන් වහන්සේලාට ගහකින් කොලයක් වැටුනත්, ඒකත් ඇති අවශ්‍ය කොටස කරගන්න.

උන් වහන්සේලා බුද්ධත්වයට පත්වෙන ආකාරය පැහැදිලියි. ඒ වගේම උන් වහන්සේලා ගැන නිතර විමසන පැණයක් තමයි, උන් වහන්සේලා ධර්ම දේශනා කරන්නෙ නැත්ද කියල. සමහරු කියන කතාවක් තමයි, ඒ කාලෙට ☞

උන් වහන්සේලා කරන ධර්ම දේශනා අහන්න කෙනෙක් නැති නිසා නිශ්ශබ්දව වැඩ වාසය කරනව කියල. තවත් පැත්තකින් කියන කතාවක් තමයි, උන් වහන්සේලාට ඒ හැකියාව නෑ කියල. සමහරු, උන් වහන්සේලා ශුෂ්ක විදර්ශක අරිහතුන් වහන්සේලාගෙ කොටසටත් දානවා. නමුත් ධර්මයේ සඳහන් වෙන ආකාරයට උන් වහන්සේලාව එහෙම ශුෂ්ක විදර්ශක කොටසට දාන්න බෑ. මොකද උන් වහන්සේලා අහසින් වැඩපු අවස්ථා ඕන තරම් පෙන්වල තියෙනවා. ඒ වගේම උන් වහන්සේලා කරපු දේශනා තියෙනවා. ඒ දේශනා අහල පිට කෙනෙකුට දහම් අවබෝධ වෙන්න හැකියාව නැති වුනාට, උන් වහන්සේලා ලෝකෙට දීපු දහම් තියෙනවා. අනෙක ශුෂ්ක විදර්ශක රහතන් වහන්සේලා කියන්නෙ පසේ බුදුවරු වගේ තනියෙන්ම නිවන් අවබෝධ කරන අය නෙවෙයි, ලොව්තුරා බුදුවරයන් වහන්සේ නමකගෙ සාසනයක් තුළ ඒ බණ අහල තමයි රහත් ඵලයට පත් වෙන්නෙ. ශුෂ්ක විදර්ශක අය රහත් වෙන්නෙ ප්‍රඥාව මුල් වෙලා තනිකරම විදර්ශනා වඩල. සමථ වැඩීමක් ඒ අයට නෑ. ඒ වගේ අයට අත් හදා බැලීම්, අත්දැකීම් අවශ්‍ය නෑ, ප්‍රඥාවෙන්ම නිගමනයට බහිනවා.

නමුත් අනික් ශ්‍රාවකයන් වහන්සේලා සමථය වඩල තමයි විදර්ශනා වඩන්නෙ. නැත්නම් හිත එහෙ මෙහෙ දුවනවා. ශුෂ්ක විදර්ශනා වඩන අයගෙ ප්‍රඥාව පළවෙනි නිසා සමාධිය දෙවෙනි වෙනවා. එතකොට ඒ අයට ඍද්ධි ප්‍රාතිහාර්ය හැකියාව, අභිඥා බල ආදිය නැත්තෙ, සසරෙදි ඒ වගේ හුරු පුරුදු කරපු දේවල්, ප්‍රාර්ථනාවන් නැති නිසා. මල් පහන් පූජා කිරීම් ආදිය ඕන නෑ, කෙලින්ම විදර්ශනා වැඩුවම ඇති කියන ඒ වගේ අදහස් මුල් කර ගෙන තමයි ඒ අය විදර්ශනා වඩන්නෙ. එහෙම අදහස් ගත්තු අයට සමාධි වඩන්න හිතෙන්නෙ නෑ. නමුත් සියලු ගස් අතරින් සඳුන් ගස අග්‍රයි කියනව වගේ, සියලු ශ්‍රාවකයන් අතරින් ප්‍රඥා අධිකයො අග්‍රයි. ඒ නිසා ඒ අයට අනෙක් ඒවා කර කර ඉන්න හිතෙන්නෙ නෑ. උදාහරණයක් විදියට ගත්තොත්, හොඳට ඇස් පේන කෙනෙකුට කණ්ණාඩියක් ඕන නෑ වගේ. පෙනීමේ උපරිම තත්ත්වය නිසා යමක් බලා ගන්න තවත් දෙයක් ඕන නෑ.

ඒ වගේම යම් යම් තැන්වල දේශනා කරන්න ගියාම විවිධ පුද්ගලයන්ගෙන් එන ගැහැට නිසා, මම මොකටද මේ වගේ කාලකණ්ණි එවුන්ට බණ කියන්න මහන්සි වෙන්නෙ, මම මොකටද මෙච්චර උත්සාහ කරල බැනුම් අහ ගන්නෙ, මගේ නිවන මම බලා ගන්නවා කියන අදහසින් රහත් වෙන්න විදර්ශනා වඩන අයත් ඉන්නවා. හැබැයි එහෙම අදහස් ගත්තම ඒ අයගෙ දයානුකම්පාවෙ (කරුණා ගුණය) අඩුවක් තියෙනවා. දයානුකම්පාව බලවත් නම් ඒ වෙලාවෙදි ඒ වෙහෙස මහන්සිය, ගැහැට විඳ දරාගෙන ඒ සඳහා ඉදිරිපත් වෙනවා. බැන්නත් කමක් නෑ මම බැනුම් අහගෙන හරි මුන්ට බණ පදයක් කියල දෙනවා කියන දයානුකම්පාව නිසා ඒ සඳහා ඉදිරිපත් වෙනවා. එතකොට ප්‍රඥාවෙන් අග්‍ර පුද්ගලයයි, කරුණා ගුණයෙන් අග්‍ර පුද්ගලයයි කියන්නෙ දෙන්නෙක්. කරුණා ගුණයෙන් උපරිමයට යන මහා කරුණා ගුණය වඩන අය තමයි ලොව්තුරා බුද්ධත්වයට පත් වෙන්නෙ. බුදුන් වහන්සේට වඩා දෙවෙනි මට්ටමින් ප්‍රඥා ගුණය අග්‍ර වෙලා, කරුණා ගුණය දෙවෙනි වෙච්ච අය පසේ බුදු වෙනවා. ඊළඟ මට්ටමින් ප්‍රඥා ගුණය අග්‍ර අය ශ්‍රාවක බුද්ධ (මහ රහත්) වෙනවා. ඒ අය අතරින් කොටසක් තමයි ශුෂ්ක විදර්ශක කියන්නෙ. ඒ අය අතරින් සමහර අයට අනිත් අයට වැටහෙන්න දහම් කියා දෙන්න හැකියාවක් ලැබෙන්නෙ නැත්තෙ, ඒ සඳහා සසර පුරුදු පුහුණු කිරීම්, බලාපොරොත්තු නැති නිසා.

බුද්ධ දේශනාවට අනුවම බැලුවොත්, සකල ලෝකයේ සම්මා සම්බුද්ධ වූ මා හැර පසේ බුදුවරයන් හා සමාන වූ අනෙකෙක් නැත්තේමය. ඒ පසේ බුදුවරයන්ගෙ ගුණයන් පිළිබඳ කොටසක් පමණක් මම මැනවින් දේශනා කරමි. පරෝපදේශ රහිතව තමන්ම අවබෝධ කරගත් පසේ බුදුවරයන්ගෙ මිහිරි වූ උදාන වාක්‍යයෝ දඬුවෙල් බෑ මී වදයක් මෙන් මිහිරි වෙති. අනුත්තර වූ නිර්වාණ සංඛ්‍යාත ඖෂධය පතන සියල්ලෝම, මනා කොට පහන් සිත් ඇත්තෝ අසව්. එහි රැස් වූ පසේ බුදු බවට පත් උතුමන් පිළිවෙළින් කරපු යම් යම් ප්‍රකාශයෝ වෙත් නම්, කාමයන් පිළිබඳ ආදීනවද, නොඇල්මේ කරුණු ද උන්වහන්සේලා පච්චේක සම්බෝධියට පත්වූ පරිදි ද පවසන ඒ ප්‍රකාශයන් අසව්. (අපදාන පාලිය 1 - පච්චේක බුද්ධාපදානය)''

ඉතින් බුද්ධ දේශනාවෙන්ම පැහැදිලියි, උන් වහන්සේලා ධර්ම දේශනා කරනවට වඩා උදාන වාක්‍ය, ඒ බෝධියට පත් වෙච්ච ආකාරය, ලැබුන සැනසීම ගැන දේශනා කරල තියෙන බව. උන් වහන්සේලාගෙ උදාන වාක්‍ය අරගෙන බැලුවොත්, බොහෝ විට පැහැදිලිව පේන කාරණයක් තමයි, උන් වහන්සේලා තනිව හුදෙකලාව වාසය කිරීමට ඇති ප්‍රියතාවය. ඒ වගේම පිරිසක් එක්ක ඉන්න කොට ඇතිවෙන ඇලීම ගැටීම, ඒ පිරිසෙන් වෙන් වුනාම ඇති වෙන සැනසීම වර්ණනා කිරීම. ඉතින් මේ උදාන වාක්‍ය දෙක අරගෙන බැලුවත් ඒ කාරණය පැහැදිලියි.

1. සුහද මිතුරන්ට අනුකම්පා කරන්නේ මිත්‍රයා හා පිළිබඳ සිත් ඇති බව හේතු කොට ගෙන තමාගේ දෙලෝ අභිවෘද්ධිය පිරිහෙළා ගනී. සන්ථවයෙහි (එකතු වී ජීවත්වීමේ) ඇති මේ භය දක්නේ කඟවෙහෙණකුගේ අඟ මෙන් හුදකලාවම හැසිරෙන්නේය.

2. යම් සේ එකට ගෙතුනා වූ විශාල හුණ පඳුරක් මෙන් පුත්‍ර දාරාවන් කෙරෙහි යම් ස්නේහයක් වී නම්, එය ඒ ඒ වස්තූන් හෝ උදව්ය ගොතා ගෙන සිටී, එහි ආදීනව දක්නේ හුණ කිළිලක් මෙන් නො ඇලෙන්නේ, කඟවෙහෙණෙකුගේ අඟ මෙන් හුදකලාවම හැසිරෙන්නේය.(අපදාන පාලිය 1 - පච්චේක බුද්ධාපදානය)

ඉතින් උන් වහන්සේලා අයිති වෙන්නෙත් බුද්ධ සාසනයට. පුද්ගලික දාන අතින් බැලුවත් සම්මා සම්බුදුවරයෙකුට දෙන දානයට විතරයි පසේ බුදුවරුන්ට දෙන දානය දෙවෙනි වෙන්නෙ. ඒ වගේ පුද්ගලික දානයක් දෙන්නත් පුළුවන් මහෝත්තමයෙක්. දන් දීල මොන පැතුමක් පැතුවත් නිවනින් කෙළවර කරගන්න පුළුවන් අනුත්තර පින් කෙතක්. අබුද්දෝත්පාද කාලයකදි ලැබෙන මහා වස්තුවක්. උන් වහන්සේලා ගැන, උන් වහන්සේලාගේ උදාන වාක්‍ය ගැන තවත් දැන ගන්න කැමති පින්වතුන්ට අපදාන පාලිය 1 - පච්චේක බුද්ධාපදානය හෝ මජ්ජිම නිකාය 3 ඉසිගිලි සූත්‍රය, ධම්මපදට්ඨ කතාව කියවල බැලීමෙන් බොහෝ විස්තර දැන ගන්න පුළුවන්.

*වහරක අභයරතනාලංකාර හිමිපාණන් විසින් දේශිත සැඟවුණ දහම් කරුණු සමග පච්චේක බුද්ධාපදානය ඇසුරින් සකස් කළේ:*

**ෆික්රි ඉස්මයිල්**
**පරිගණක ඉංජිනේරු - ගොතටුව**

**අභයරතනාලංකාරය - 42**

# අද්භූත වූ අමනුස්ස කරදර නව ගුණ බලෙන් දුරු කළ හැටි...



*(පසුගිය කලාපයෙන් - උපාදානය බලවත් වුනාම මරණින් පසුවත් එන දාහ ගින්න ....)*

**- වහරක අභයරතනාලංකාර හිමි**

යම් කිසි හේතුවක් නිසා බෙල්ලෙ වැළලාගෙන මියගිය කෙනෙක් ගන්ධබ්බ ලෝකෙ ඉඳන් විවිධ ලියුම් කඩදහි මගින් තමන් පෙර හිටපු ගෙදර උදවිය පාලනය කරපු සිද්ධියක් පසුගිය කලාපයේ අභයරතනාලංකාරය තුළින් ඉදිරිපත් කළා. අන්තිමට වහරක අභයරතනාලංකාර හිමියන් ගිහි වතක ඉන්න කොට ඒ සඳහා ඉදිරිපත් වෙලා නව ගුණ බලෙන් ඒ ගෙදර උදවියට තිබිච්ච කරදර දෝස ඉවත් කරල දීපු හැටිත් කෙටියෙන් සඳහන් කළා. දැන් ඒ කාරණයත් එක්ක බැඳිච්ච තවත් සිද්ධි ගණනාවක් තියෙනවා. ඒ පිළිබඳ වැඩිදුර විස්තර තමයි මේ ඉදිරිපත් කරන්නෙ.

මේ කියපු සිද්ධියට මම ඉදිරිපත් වෙන්න පෙර ඒ ගෙදර උදවිය විවිධ දේවාල ගානෙ, කට්ටඩියො පිටිපස්සෙ ගිහින් සෑහෙන කාලයක් තිස්සෙ වියදම් කරල අන්තිමට කර කියා ගන්න දෙයක් නැතිව හිටියෙ. ඒ අතර අවසන් වතාවට මේ සිද්ධිය ගැන ආරංචි වෙලා හාමුදුරු නමකුත් ඉදිරිපත් වෙලා තිබුණා. හැබැයි ඒ හාමුදුරුවො ඉස්සෙල්ලම තමන්ගෙ ගිහි ගෝලයෙක් තමයි මේ ගෙදරට යැව්වෙ. හාමුදුරුවො එන්න ඉස්සර වෙලා, ගිහින් බලල තත්ත්වය කියන්න කියල තමයි ඒ විදියට යැව්වෙ. ඒ ගෝලය ඒ ගෙදරට ගිහින්, ඕව අපිට ලොකු දේවල් නෙවෙයි .... ආදී වශයෙන් කතා කරන කොට, ඒ ගෙදර කුස්සියේ තිබිච්ච මිරිස් අත් ගල වේගයෙන් ඇවිත් ඒ ගෝලය වාඩි වෙලා හිටපු පුටු කකුලෙ වැදිල කැඩුනා. මේ මනුස්සය ඒක දැකල බය වෙලා පැනල දුවල, මට කරදර කරන්න එපා මං දන්නෙ නෑ එච්චර දෙයක් කරන්න කියල යන්න ගියා.

ඒක මහ පුදුම දෙයක්. මිරිස් අත් ගලක් කියන්නෙ කිලෝ කීයක් නම් බරද? ඒක කුස්සියේ තිබිල ගේ ඇතුලට වේගයෙන් ඇදිල ඇවිත් පුටු කකුලක වදින්න නිකම්ම පුළුවන්ද ? කවුරුහරි මෙහෙයවන්නම වෙනවා. ඊට පස්සෙ ඒ ගෝලය මේ කතාව හාමුදුරුවොත් එක්ක ගිහින් කිව්වම, හරි හරි මාත් ඒක බලන්න ඕන කියල මමත් එන්නම් කිව්වලු. එහෙම කියල ඒ ගෙදර අයට, එන දවස කියල පණිවිඩයක් යැව්වා. ඉතින් ගෙදර උදවියත් මේ හාමුදුරුවො වැඩියම ගිලන් පස ආදියෙන් සංග්‍රහ කරන්න ඕන නිසා බිස්කට් කේක් වගේ දේකුත් එක්ක සිසිල් බීම වර්ගයක් වේල පහින්ම ගෙදර ගෙනත් වෙනම පෙට්ටගමක අරන් තිව්වා. හාමුදුරුවො වැඩියට පස්සෙ උන් වහන්සේට ගිලන් පස දෙන්න බලන කොට අර ගෙනාපු කේක්, බිස්කට්, සිසිල් බීම මුකුත්ම නෑ. ඒවට වෙච්ච දෙයක් නෑ. පස්සෙ ඒ ගෙදර හිටපු මියගිය අයගෙ බිරිඳ ගෙට ඇවිත්, ගෙදර අනිත් අයගෙන් හයියෙන් ඇහුවා, අර අපි හාමුදුරුවන්ට දෙන්න ගෙනාපුවට මොකද වුනේ කියල. අහන කොටම උඩින් ලියුමක් වැටුනා, ඒව මම කෑව කියල. කොහොම හරි ඉතින් මේ හාමුදුරුවො වැඩක් නැතිව ආපහු යන්න ගියා, උන් වහන්සේ ඒ වැඩේ කරන්න ආයෙත් ඇවිත් නෑ.

ඉතින් මේ අයට වෙච්ච කරදර පත්තරෙත් පළ වෙලා, මේ අයගෙ අසරණ භාවය ගැන සලකල පිනට යමක් කරල දෙන්න පුළුවන් කෙනෙක් ඉන්නව නම් ඉදිරිපත් වෙන්න කියල ඉල්ලීමක් කරල තිබුනා. ඒ කාලෙ මම පොල්ගහවෙල ගිජිදාගම කියන ගම් ප්‍රදේශයේ නැවතිලා පුද පූජා සෙත් ශාන්ති ආදී කටයුතු කරමින් හිටියෙ. ඔය අතර දවසක් මේ සිද්ධිය වෙච්ච නිවසට අල්ලපු ගෙදරක දොස් අරින්න කියල කට්ටල් දාන්න යන්න මට අවස්ථාවක් ලැබුණා. ඒ කියන්නෙ ගෙවල්වල දොස් අරින්න සමාධියට අහුවෙච්ච එක්තරා ගුප්ත ක්‍රමයක්. හැබැයි ඒ යනකල්ම මම දැන ගෙන හිටියෙ නෑ අර සිද්ධිය වුනේ මේ ගෙදරට අල්ලපු ගෙදර කියල. දැන් මේ ගෙදරට අල්ලපු අවට ගෙවල්වල වැසිකිළිවල සමහර දවස්වලට කාන්තාවන්ගෙ ඇඳුම් ගෙනත් දාල තියෙනවලු. ඒ කියන්නෙ ඒ ගෙවල්වල ඉන්න කාන්තාවන්ගෙ නෙවෙයි, වෙනත් කොහේ හරි තිබිල පිටින් ගෙනත් දාන ඒවා. කවුරු ගෙනත් දානවද කියල දන්නෙත් නෑ. හැබැයි ඒ හැර ඒ අවට ගෙවල්වලට වෙන මුකුත් කරදර තිබිල නෑ. ඉතින් කට්ටල් දාන්න ගිය ගෙදරින් මම අහල බලන කොට ඒ අය තමයි කිව්වෙ, ආං අර පේන ගෙදර තමයි ඔය සිද්ධිය තියෙන්නෙ කියල. ඒ කාරණය ඒ වෙන කොටත් පත්තරෙන් ප්‍රසිද්ධ වෙලා තිබුණෙ.

ඊට පස්සෙ ඒ කට්ටල් දාන ගෙදර ඉඳන් මම හොඳට යොමු කරල බලාගෙන හිටියා, මොකක්ද මේ සිද්ධිය කියල. ඒ දවස්වල මම මේ වගේ වැඩවලට ගිහින් සෙත් ශාන්තියක් එහෙම කරල සමාධි ගත වෙලා ඉන්න සිරිතක් තිබුණා. අන්න ඒ වගේ වෙලාවක තමයි මම ඔය කාරණය සමාධියට යොමු කළේ. අල්ලපු වැටේ නිසා නිකමට බලන්න හිතුණා. බලන කොට අර ලියුම් කඩදහි ගෙනත් දාන අමනුස්සය ඒ ස්ථානයේ ඉන්නවා. මේ අමනුස්සය බෙල්ල වැළලා ගෙන මියයන්න පෙර මේසන් බාස් කෙනෙක්. දැනුත් ඒ විදියටම මනුස්ස ගන්ධබ්බයෙක් වෙලා, සරමක් ඇඳගෙන උඩු කයට ඇඳුමක් නැතිව සාමාන්‍යයෙන් හිටපු විදියටම තමයි ඉන්නෙ. අමනුස්සයෙක් කිව්වට මේ මනුස්ස ගන්ධබ්බයෙක්. මොකද වෙලා තියෙන්නෙ කියල යොමු කරල බලන කොට, ඒ අය ජීවත් වෙලා ඉන්න කාලෙ ගෙයක් හදන්න දාපු අත්තිවාරමක් තිබුණා. ඒ අත්තිවාරම පොඩ්ඩක් උසින් තියෙන්නෙ. ඒක උඩ ඉඳගෙන මේ අමනුස්සය ඔළුවට අත් දෙක තියාගෙන වැළ මිටි දෙක දණහිස් දෙකට තියාගෙන පහත් වෙලා කල්පනා කර කර ☞

ඉන්නවා.

ඔහොම ඉන්න වෙලාවෙදි මම ඇවිත් ඉන්නව කියල ආරංචි වෙලා ඒ ගෙදර වටේ පිටේ ගෙවල්වලින් ඒ අයට කියල තිබුණා, මෙන්න මෙහෙම මහත්තයෙක් ඇවිත් ඉන්නවා, පොඩ්ඩක් ඇවිත් සාකච්ඡා කරල මොනව හරි කතා කර ගන්න බලන්න කියල. ඉතින් මම කිව්වා, වෙච්ච විස්තරය දැන ගන්න ගෙදර ඉන්න කාට හරි එන්න කියන්න කියල. ඕව කරල වැඩක් නෑ, මම නම් යන්නෙ නෑ කියල එතකොට ඒ ගෙදර අම්ම (මියගිය කෙනාගෙ බිරිඳ) කියල තිබුණා. ඕව නෙවෙයි, මම ඕකව අල්ල ගෙන කොහොම හරි මුහුදෙ දානවා, ඕකට නිකං වියදම් කරල වැඩක් නෑ, අපි ඕව කරන්නෙත් නෑ, අපිට එපා ඕව .... ආදී වශයෙන් මේ කාන්තාව අර ගෙදර ඉඳගෙනම දොස් කියන්න පටන් ගත්තා. නමුත් ඇයගෙ දුවට මේ කාරණය කිව්වම, ඇය මේකෙ ඇත්ත නැත්ත දැන ගන්න ආවා. ඒ දුව විවාහ වෙලා ඒ ළඟ පාත තැනකමයි පදිංචි වෙලා හිටියෙ. ඒ අයගෙ දුව ඇවිත්, අපටත් මියගිය තාත්තගෙන් හරි කරදරයි කියල ඔය වෙච්ච සිද්ධි ඔක්කොම කිව්වා. එතකොට ඒ විවාහ වෙච්ච අය පස්සෙ කාලෙක අළුතින් වෙනම ගෙයක් දොරක් හදල, ඒ ගෙදර ප්‍රධාන දොරත් සවි කරල තිබුණා. හැබැයි ඒ කාලෙ වෙන කොට ගේ වැඩ ඉවර වෙලා තිබුණෙ නැති නිසා පදිංචියට ගිහින් තිබුනෙ නෑ. එතකල් මහ ගෙදර තමයි නැවතිලා ඉඳල තිබුණෙ.

දවසක් එහෙම ඉන්න වෙලාවක එක පාරටම සලාං ගාල සරණේරු වගයක් ඒ මහ ගෙදර අම්ම ළඟට විසි වුනා. බලන කොට ඉස්කුරුප්පු ඇණයි, අලුත් සරණේරුයි හැම තැනම විසිරිලා. මේ බලපං ඉස්කුරුප්පු ඇණයි සරණේරුයි මේ කොහෙන්ද බං කියල අර අම්ම දුවත් එක්ක කියනකොට, දුව බලල කිව්වා, අපේ දොරේ අල්ලපු ඒව වෙන්න ඕන කියල. අලුත හදාගෙන යන ගෙදරට ගිහින් බලන කොට ගේ ප්‍රධාන දොරයි, සරණේරුයි නෑ. ඔක්කොම ගලව ගෙන ගිහින්. සෝදිසි කරල බලන කොට, දොර ඌරු ළිඳක් ඇතුලට දාලා. ඌරු ළිං කියන්නෙ බඹ 4 -5 ක් විතර ගැඹුර, අඩි 5 - 6 ක් විතර විෂ්කම්භය තියෙන වතුර බාන මහ ළිං වර්ගයක්. මේක මහ පුදුම සිද්ධියක්. තනි මිනිහෙක් නෙවෙයි, දෙන්නෙක්වත් ඕන මේ වගේ වැඩක් කරන්න. ඒ වගේ දොරක් ගලවල ගිහින් දාන්න නම්, ඒ ඇණත් ඉස්කුරුප්පු නියන්වලින් ගලවන්න ඕන. එතකොට සරණේරු වෙනම ගලවන්න ඕන. ඒ ඔක්කොම ගලවල ඒ දොර උස්සගෙන ගිහින් කොහොම හරි ළිඳටත් දාල තිබුණා. කොයි මොහොතෙ කළාද කියල කවුරුවත් දන්නෙ නෑ. ඉතින් මේ වගේ අත්භූත සිද්ධි ඒ ගෙදර ඉස්සරත් සිද්ධ වෙලා තිබුණා. මෙන්න මෙහෙම ප්‍රශ්න අපට වෙලා තියෙන්නෙ, හිතා ගන්නත් බැරි දේවල්, කාටවත් කිව්වට පිළිගන්නෙත් නෑ, පිළිගන්නත් බැරි දේවල් කියල ඒ ගෙදර දුව මාත් එක්ක ඒ විස්තර කිව්වා.

දැන් ඉතින් මේ සිද්ධිය කිව්වට පස්සෙ මම ඇහුවා, ඔය ගොල්ලො මේ මියගිය තාත්ත වෙනුවෙන් මොනවද කළේ කියල. අපි ඉතින් බලි තොවිල් කළා, දාන මාන දුන්නා, කරන්න තියෙන සේරම කළා කිව්වා. පස්සෙ මම ඇහුවා, මොනවද දුන්න දාන කියල. සාංඝික දාන, දුගී මගී යාචක දාන ඔය වගේ හුඟක් දේවල් කිව්වා. මම ඇහුවා, මොනව හිතාගෙනද ඔයගොල්ලො දානෙ දුන්නෙ කියල. ඉතින් මේ මියගිය කෙනා යවල අපට කරදරයක්



නැතිව ඉන්නනෙ කියල උත්තර දුන්නා. මම කිව්වා ඔන්න ඕක තමයි වැරැද්ද, ප්‍රශ්නය තියෙන්නෙ ඔතනයි කියල. ඔයගොල්ලො හදන්නෙ මේ මියගිය තාත්තව පන්නන්න. නිකං හිතන්නකො මෙහෙම දෙයක්. තාත්ත තවමත් ජීවත් වෙලා ඉන්නව කියල හිතුවොත්, සමහර වෙලාවට තාත්ත නිකං ඉන්න කොට ඔයගොල්ලන්ට බනිනවා. ඒ වෙලාවට ඔයගොල්ලන්ට ඕන කමක් තියෙනවා, තාත්තව මේ ස්ථානයෙන් ඉවත් කරන්න. දැන් ඔයගොල්ලො තාත්ත වෙනුවෙන් සංග්‍රහයක් ලෑස්ති කරනවා. දැන් තාත්ත අහනවා, මොකක්ද මේ කරන්න යන වැඩේ කියල. තාත්ත වෙනුවෙන් සංග්‍රහයක් කරනව කියනවා. ඉතින් ඒ මොකටද අද මං වෙනුවෙන් සංග්‍රහයක් කියල ඇහුවම, ඒක දුන්නට පස්සෙ තාත්ත මේ ගෙදරින් යන්න ඕන, ආයෙ මෙහේ ඉන්න බෑ, තාත්ත පන්න ගන්නයි අපි මේ සංග්‍රහය දෙන්නෙ කියල කිව්වොත්, දැන් තාත්ත මොකක් හිතයිද ? ඊට පස්සෙ මම තවත් උදාහරණයකින් පැහැදිලි කළා. දැන් ඔබගෙ දුව ඉන්නවා, ඔබ තමන්ගෙ දුවටත් ආදරෙයි. හැබැයි ඉතින් දුව ඔබත් එක්ක තරහයි, නිතරම රණ්ඩු සරුවල් කරනවා. දැන් ඒ දුව ඔබ වෙනුවෙන් මොනව හරි දානයක් / සංග්‍රහයක් දෙනවා. මං වෙනුවෙන් මොකටද මේ දානයක් / සංග්‍රහයක් කියල ඇහුවම, මේ සංග්‍රහය භුක්ති විඳල ඒක ඉවර වුනාට පස්සෙ ඔබ මේ ගෙදරින් යන්න ඕන කියල කිව්වොත් ඔබ මොකක්ද ගන්න තීරණය ? දුව පිනක් කළා කියල සන්තෝස වෙනවද ? ඒ වගේ ඔයගොල්ලො ඔය වගේ දේවල් කළාම තාත්ත ඒක පිනක් කියල පිළිගනීද ?

ඉතින් මං ඔය විදියට සරලව විස්තර කරල කිව්වා, ඔයගොල්ලො තමන් සුඛිත මුදිත වෙන්න මිසක් මියගිය කෙනාට යහපතක් කරන්න මොකවත් කරල නෑ කියල. එහෙනම් මේ මියගිය තාත්ත වෙනුවෙන් ඔයගොල්ලො කරල තියෙන තරමක් කරල තියෙන්නෙ හිංගි හිංසා. දැන් එහෙම කරල ඉවර වෙලා, අන්තිමට ඔයගොල්ලන්ට තාත්ත කරදර කරනව කියල නේද මේ කියන්නෙ ? ඔයගොල්ලො මියගිය තාත්තට කරපු කරදර දැක්කෙ නැද්ද ? මං මෙහෙම අහන කොට ඒ අය බිම බලාගෙන හිටියා. මේ ටික අහගෙන ඉඳල අර අමනුස්සය ඉකි ගගහ පුදුම විදියට අඬන්න ගත්තා. ඒ සිද්ධිය මට සමාධියට ඇහෙනවා, පේනවා. නමුත් එතන ඉන්න අනිත් අයට ඇහෙන්නෙ, පේන්නෙ නෑ. මම එතන ඉඳන් යොමු කරන කොට මේ මියගිය කෙනා බිම අල්ලගෙන ඉකි ගහනවා. ඒ කියන්නෙ බොහොම බැගෑපත් වෙලා අන්තිම අසරණ තත්ත්වයේ ඉන්න කෙනෙක්. ඉතින් ඒ වගේ කෙනෙක් කොහොමද සතුටු වෙන්නෙ ? මේ මියගිය කෙනා ඒ ගන්ධබ්බ තත්ත්වයෙ ඉඳගෙන, අර මම කියපු විස්තරය අහගෙන ඉඳල, ඇත්ත වශයෙන්ම ඒකනේ වෙලා තියෙන්නෙ කියල ඒ කාරණය අනුමත කරනවා. එතකොට ලොකු වේදනාවක් එනවා. මොකද මේ අපි කතා බහ කරන හැම දෙයක්ම ඒ අයටත් ඇහෙනවා.

පස්සෙ මම ගෙදර අයට කාරණය මේ විදියට පැහැදිලි කරල කිව්වා. මේ කාරණය තේරුම් ගන්න, මීට පස්සෙ ඔය වගේ වැඩ කරන්න එපා. ඔය විදියට දානෙ දෙන්නත් බෑ. තාත්තව පන්නන්න නෙවෙයි, තාත්තට යම්කිසි දුකක් කරදරයක් තියෙනව නම් ඒ සියලු දුක් කරදරවලින් මිදිල සුඛිත මුදිත වෙන්න, යහපතම උදා වෙන්න කියල මේ දානෙ දෙන්න ඕන. එහෙම නැතිව අපිට කරදර නොකර මෙතනින් යන්න කියල දානය දෙන්න එපා. ඒ වගේ යන එන ☞

කතාවල් මුකුත් ඕන නෑ. දුක් කරදරයක වැටිල ඉන්නව නම් ඒකෙන් මුදව ගන්නයි ඕන වෙන්නෙ. අන්න ඒ ටික කරන්න. ඒ විදියට කරන්න කැමති නම්, දානයක් හදාගෙන එන්න පුළුවන් නම්, එහෙම එන්න කියල මම ඒ අයට කිව්වා. ඒ අය ඒකට කැමති වුණා.

මේ කතාව කිව්ව විතරයි, ඒ ගෙදර අම්ම දුවගෙන ඇවිත් මෙහෙම කිව්වා. ''ඔය මළ යකා එක්ක මොන පිං දහම්ද ? ඕව වැඩක් නෑ ඕකව අල්ලල දාන්න මම දැන් මේ දේවාලයකට යන්න ලෑස්ති වෙන්නෙ. තව පොඩ්ඩෙන් මම යනවා. ඕකට දැන් දෙන එක නෙවෙයි කරන්න ඕන, දේවාලෙට කතා කරල ඔක්කොම වැඩ සූදානම් කරල තියෙන්නෙ.'' මේ විදියට මහ හැල්ලක් කියාගෙන උන්දෑ කොහේ හරි දේවාලයකට යන්න ලෑස්ති වුණා. එතකොට මේ ගෙදර තියෙන ගිනි පෙට්ටියක්වත් එළියෙ නිකං තිව්වොත්, ගෙදර තියෙන රෙදි ආදිය මේ අමනුස්සය පුච්චනවා. ඒ නිසා ගෙදර පාවිච්චියට ගන්න ගිනි පෙට්ටිය, ලයිටරය කොච්චරවත් ඉනේ ගහගෙන තමයි ඉන්නෙ. මොකද ඉනේ ගහ ගෙන තිබුණොත් අමනුස්සය ඒක ගන්න එන්නෙ නෑ. දැන් ඉතින් දේවාලයට යන්න ලෑස්ති වෙන්න නාල පිරිසිදු වෙන්න ඕන නිසා, ඉනේ තිබ්බ ලයිටරය රෙද්දක තිබ්බ සාක්කුවක් වගේ දේකට යට කරල, රෙදි ටික වැලට දාල උන්දෑ නාන්න ගියා. ටික වෙලාවක් ගිහින් දිය රෙද්ද පිටින්ම දුව ගෙන ඇවිත් කියනවා, අන්න අර මළ යකා මගේ රෙදි ටික පුච්චනව කියල. මම ඇහුව මොකද වුනේ කියල. රෙදි ටික තියල නාන්න බැස්ස විතරයි ඒක ගිනි අරගෙන. බලන කොට අර රෙදි ටික අස්සෙ තිබ්බ ලයිටරය අරගෙන මේ අමනුස්සය ඒකට ගිනි තියල.

දැන් මේ ගෑණු මනුස්සය ආයෙමත් කෑ ගහන්න ගත්තා. ඕක හිතාගෙන ඇති මේ රෙදි ටික නැත්නම් මම යන්නෙ නෑ කියල, මං ඔය නාන්න ඇඳ ගත්තු රෙද්ද පිටින්ම යනව කියල ඒ ඇඳුම පිටින්ම දේවාලයට ගියා. යන කොට ඒ දේවාලෙ කපු නෝන කෙනෙක් තමයි ඉඳල තියෙන්නෙ. ඒ දේවාලෙ මැද කොටස් 2 ක් තියෙනවා. ඉස්සරහ එක කාමරයක්. දේවාලෙ තියෙන්නෙ ඇතුල් කාමරයෙ. අපි බලමු ඕකට හොඳ වැඩක් කරන්න කියල, කපු නෝනත් ඇතුලට ගිහින් යාතිකාව පටන් ගත්ත විතරයි, දඩස් ගාල මොනව හරි දෙයක් ඒ දෙන්න ළඟට සද්දෙට වැටුණා. බලන කොට පොල් ගෙඩියක් විතර ලොකු කළු ගලක්. ඒක දැක්ක විතරයි මේ කපු නෝනත් බය වුණා. දේවාලෙ ඇතුලටත් ගල් ගහන්න පුළුවන් නම්, මේකව අල්ල ගත්තොත් මොනව කරයිද කියල බය වෙලා, අපි ඔබට කරදර කරන්නෙ නෑ, අපිට මුකුත් කරන්න බෑ, මට කරන්න බැරි දේවල් මම කරන්නෙ නෑ, වෙච්ච දේට කමා වෙන්න කියල විගහට කමා කර ගෙන වැඩේ අත ඇරල දාල නිකං හිටියා. ඊට පස්සෙ මේ ගෑණු මනුස්සය දුවගෙන ඇවිත් දුවට කිව්වා, දුවේ උඹට ඕන දෙයක් කර ගනින් කියල.

එතකොට දුව හිටියෙ වෙනම ගෙදරක. ඒ නිසා ඒ අය මම අර කලින් කියපු විදියට දානයක් හදාගෙන අට පිරිකරක් අරගෙන අපි ඒ සෙත් ශාන්ති වැඩ කටයුතු කරන තැනට ආවා. ඒ දවස්වල මම ඒ වැඩ කටයුතු කරද්දි ඒ සඳහා එන පිරිස්වලට දාන දෙකක් ගේන්න කියනවා. ඒකෙන් පළවෙනි දාන පූජාව තමයි බුද්ධ පූජාව. ඊට පස්සෙ දෙවෙනි පූජාව කියල දෙයක් තියෙනවා. ඒ කියන්නෙ බුද්ධ පූජාව ප්‍රමුඛ මහා සංඝ රත්නයට තියන පූජාව අග්‍ර කරල වෙන් කරල, ඒ එන පිරිසට ආශිර්වාද කරන්න මට වෙනම දානෙ කොටසක් ගේනවා. බුද්ධ පූජාව පළවෙනියට තියල ඉවර වුනාම, අර දෙවෙනි පූජාව භාරගෙන පුණ්‍යානුමෝදනාව කළාට පස්සෙ, මම ඒක ඉඳුල් කරල ඉතිරිය එතන ඉන්න අනික් පිරිසට බෙදල දෙනවා. ඉතින් හැම කෙනෙක්ම එනකොට බත් මුල් 3 - 4 ක්, 5-6 ක් වගේ ගේනවා. ගෙනත් දෙවෙනි පූජාවට තිව්වම ඒ හැම එකකින්ම හැන්ද බැගින් අරගෙන තමයි මගේ දානෙ කොටස හදන්නෙ. එහෙම තමයි ඒ කාලෙ දානෙ දුන්නෙ.

ඉතින් ඒ විදියට බුද්ධ පූජාව තියල දානෙ දීල පුණ්‍යානුමෝදනාව කරල සෙත් පතල ඒ කටයුතු සියල්ල කළා. ඊට පස්සෙ නව ගුණ ශාන්තියෙන් ජීවම් කරපු පොල් තෙල් ඒ අයට දුන්නා, ගිහින් පහන් පත්තු කරන්න කියල. ඒ අය ගෙදර ගිහින් ඒ වැඩේ කළාට පස්සෙ ඒ දුවගෙ ගෙදර තිබ්බ ප්‍රශ්න මුකුත් නැතිව ගියා. නමුත් අර මහ ගෙදර අම්ම ඉන්න තැන ප්‍රශ්න ඒ විදියටම තිබුණා. පස්සෙ දුව අම්මට කිව්වා, අපිට නම් ඉතින් දැන් කරදරයක් නෑ කියල. එහෙනම් අර මහත්තය උඹට දීපු තෙල් ටිකක් මටත් දියන් කියල, මගෙන් ඉල්ලන්නෙ නැතිව ඒ දුවගෙන්ම ඉල්ල ගෙන තිබුණා. ඒවායින් මහ ගෙදර පහන් පත්තු කළා. දවස් 2 - 3 ක් විතර පත්තු කරන කොට මුකුත් කරදරයක් නැතිව ගියා. බලන කොට ඒ මහ ගෙදර පිළිකන්නෙ අඹ ගහ යට තමයි මොනව හරි කරපු කොඩි විනයක් යට කරල තිබුණෙ. භූතියම් දේවතා බන්ධනයකින් තමයි ඒක කරල තිබුණෙ. දැන් ඒ බන්ධනය කැපිල. කැපුනට පස්සෙ අර අමනුස්සය නිදහස් වෙලා යන්න ගිහින්, අර තිබ්බ්ච කරදර ඔක්කොම නැති වුණා. මොකද බන්ධනය කැපුන ගමන් අර බල සියල්ල ඉවරයි. මෙච්චර කලක් කැපෙන්නෙ නැතිව තිබ්බ්ච ඒ බන්ධනය නව ගුණවලින් තමයි කැපුනෙ. බන්ධනය කැපිල, දීපු දානෙන් පින් අනුමෝදන් වෙලා ඒ අමනුස්සය නිදහස් වුණා. ඒ ගෙවල් දෙකේම තිබ්බ්ච කරදර නැති වුණා. අමනුස්සය පන්න ගත්තෙත් නෑ, කිසිම හිංගි හිංසාවක් කළෙත් නෑ, ඉබේටම යන්න ගියා.


ඉතින් මේ අමනුස්සය මැරෙන්න පෙර මනුස්සයෙක් වශයෙන් ජීවත් වෙලා ඉඳෙද්දි, කවුරු හරි පළිගන්න කරපු බන්ධනයක් නිසා ගෙදර අයත් එක්ක රණ්ඩු දබර වෙලා තමයි බෙල්ලෙ වැළලා ගෙන මැරිල තිබුණෙ. මළාට පස්සෙ දැන් ඒ පළිය ඉවරයි. නමුත් කවුරු හරි ඊට පස්සෙ මේ අයට ඒ ගෙදර ඉන්න බැරි වෙන්න කොඩි විනයක් කරල තිබුණා. ඊට පස්සෙ මේ බෙල්ල වැළලාගෙන මැරිච්ච මනුස්සය ඒ බන්ධනයට හිර වෙලා. මෙතනදි මෙහෙම දෙයක් වෙන්නත් පුළුවන්. සමහර අය මැරෙන්න ඉස්සෙල්ල බන්ධනයකට හිර වෙලා ඉඳල පස්සෙ මළොත්, ඒ බන්ධනයත් එක්කම හිර වෙලා තමයි ගන්ධබ්බ ලෝකෙ ඉන්න වෙන්නෙත්. ගෙවල්වල ඒ විදියට වින බන්ධන කරල තිබුණ නම්, ගෙල වැළලා ගෙන මළත් ඒ බන්ධනයට හිර වෙනවා.

ඒ වගේම මෙතනදි මේ භූතියම් දේවතාවා කිව්වම එක්කෙනෙක් නෙවෙයි, මණ්ඩලයක්. ඒකට සම්බන්ධ කවුරු හරි එක්කෙනෙක් තමයි මේ බන්ධනයට සම්බන්ධ කරල තියෙන්නෙ. ඒ අය සතර අපාගත නෙවෙයි. චාතුර් මහා රාජික දිව්‍ය ලෝකයෙන් පාලනය වන කොටසක්. ප්‍රේත බන්ධන, අමනුස්ස බන්ධන කියල සතර අපායට සම්බන්ධ බන්ධනත් තියෙනවා, නැත්තෙ නෑ. නමුත් ඒව වෙනම ඒවා. මළ ප්‍රේත වගේ කොටස් අල්ලල කරන බන්ධන ඒ වගෙයි. ඒ අය බොහොම දුක සේ දිවි ගෙවන, යන්න එන්න බැරි මහා දුක්ඛිත කොටසක්. ඒ වගේම සා පිපාසිත කියල තවත් කොටසක් ඉන්නවා. ඒ කියන්නෙ බඩ ගින්න දැවිල්ල වැඩි වෙලා ඉන්න අය. ඒ වගේම සුදා පිපාසිත කියන්නෙ කාම පිපාසය තියෙන අමනුස්සයින්ට. එතකොට සා පිපාසයයි, සුදා පිපාසයයි කියන්නෙ දෙකක්. හැබැයි සමහර අය සුදා පිපාසා කියන කොට සා පිපාසයෙන්, බඩගින්නෙන් ඉන්න අය තමයි පෙන්වන්නෙ. නමුත් ඒක නෙවෙයි මේ කියන්නෙ. ඒ අය කාම පිපාසයෙන් ඉන්නෙ. ඒ නිසා ඒ අය හරියට කැමතියි ස්ත්‍රීන් ඇසුරට යන්න, ඒ අයව බලන්න, කෙළ හල හලා ඉන්න. කටවල් ☞

ඇරිච්ච ගමන් කෙළ හැලි හැලී වට පිට බල බලා ඉන්න අමනුස්ස කොටස් ඉන්නවා. ඒ වගේ අය සමහර විට අන්තිම නීච තත්ත්වයක තමයි ඉන්නෙ. නමුත් තවමත් සතර අපාගත වෙලා නෑ. ඒ විදියට සතර අපාගත නොවන මට්ටමේ ප්‍රේත කොටසකුත් ඉන්නවා. ඒ අය තමයි වැඩි හරියක් පරලොව, ගන්ධබ්බ / අන්තරාභවික කියන්නෙ. අද අන්තරාභවික කියන වචනය පිළිගත්තෙ නැතිවට, ගන්ධබ්බයො අතර ඒ වගේ අයත් ඉන්නවා. ඒ වගේ කොටස් තමයි ඇදල බන්ධනවලට හිර කරන්නෙ. නමුත් සතර අපාගත වුනාම අර විදියට භාණ්ඩ උස්සන්න, ලියුම් ලියන්න වගේ දේවල් කරන්න පුළුවන්කමක් නෑ. ඒ වගේ අයට නැගිට ගන්න පණ නෑ, ගිය ගිය තැන ඔහේ නිකං වැටිල ඉන්නවා.

ඒ නිසා මේ කතාවට සම්බන්ධ ප්‍රේත / යක්‍ෂ ආදී වශයෙන් කියන්නෙ චාතුර් මහා රාජිකය යටතේ පාලනය වන කොටසක්. උදාහරණ විදියට සක්‍ර දෙවියන්ටත් යක්‍ෂ කියල කියන අවස්ථා තියෙනවා. ඒක වෙනම පැත්තක්. ඒ වගේ, ප්‍රේත කිව්වම සියල්ලම සතර අපාගත ප්‍රේත නෙවෙයි. අනුන් දෙන ආහාරයකින් හෝ අනුන් දෙන පිනකින් හෝ යමක් ලබාගෙන ජීවත් වෙන අයටත් ප්‍රේත කියල කියනවා. අනුන් ලබාදෙන ආහාරවලින් තමයි ඒ අය පෝෂණය වෙන්නෙ. මොකද ඒ අයට ඒ අත්බැව රැකෙන්න බලය තියෙනව මිසක්, බලවත් ආහාරයක් තනියෙන් ලබා ගන්න බෑ. කරපු පිනකුත් නෑ. ඒත් ඒ අත්බැව තවම ගන්ධබ්බ තත්ත්වයෙන් ඉන්නවා. අන්න ඒ වගේ වෙලාවට කවුරු හරි දානයක් දීල පින් දීල පින් අනුමෝදනාවක් කළොත්, එහෙම නැත්නම් කැප කරපු දානයක් දුන්නොත්, හේතු තියේ නම් ඒ දෙකම ඒ අයට ලබන්න පුළුවන්. නමුත් අද සමහර හාමුදුරුවො පවා මේ කතාවට විරුද්ධයි. මනුස්ස ලෝකෙ කැප කරල දෙන භෞතික ආහාර පාන කන්න බොන්න ඒ අය එන්නෙ නෑ කියන මතයෙ තමයි සමහරු ඉන්නෙ. ඒ කාරණය ධර්මානුකූලව තේරුම් ගන්න බැරි වුනාමත්, ගුප්ත ලෝකය දකින්න පුළුවන් සමාධියක් වගේ දෙයක් නැති වුනාමත් එහෙම වැරදි මතවල එල්බ ගන්නවා. නමුත් ඒ කතාව ඔප්පු කරන්න හොඳ සාධකයක් ත්‍රිපිටකයේම තියෙනවා.

පෙරුම් පුරන එක් අත්බැවක සිදුහත් බෝසතාණන් වහන්සේ එක්තරා රටක රජෙක් වෙලා, ඒ රටේ ඒ වෙන කොට තිබ්බ සත්ව හිංසාවන් ඇතුළු සියලු ප්‍රාණ ඝාතයන් තහනම් කළා. ඒ කියන්නෙ, ඒ වෙන කොටත් ඒ රටේ මිනිස්සු සත්තු මරල පුව්වල අමනුස්සයින්ට දොල පිදේනි කැප කරන ක්‍රමයක් තිබුණා. නමුත් මේ තහනමෙන් පස්සෙ ඒ අමනුස්සයින්ට ආහාර නැතිව ගියා. ඒ නිසා ඒ ප්‍රබල අමනුස්සයො සියල්ල එකතු වෙලා කතා වුනාලු, කවුද මේ තහනම කළේ කියල. මේ රටේ රජ්ජුරුවො මෙහෙම නීතියක් පනවල කියල දැන ගත්තම, ඒ අමනුස්සයො මණ්ඩලයක් විදියට එකතු වෙලා ප්‍රධානියෙක් පත් කරල ඇහුවලු, උඹට පුළුවන්ද අපිට කරපු අපරාදෙට ඕකව මරන්න කියල. පුළුවන් කියල ඒ අමනුස්සය ඒ ලෝකෙ තිබිච්ච පොල්ලක් අරගෙන ගිහින් රජතුමාට ගහන්න උස්ස ගෙන හිටියලු. හැබැයි උස්ස ගෙන හිටිය විතරයි ගහන්න බැරි වුණා. රජතුමා මේ සිද්ධිය දැකල ඇහුවලු, කවුද මේ පොල්ලක් උස්ස ගෙන ඉන්නෙ, උඹ ඉන්නෙ මගේ ආරක්‍ෂාවටද, නැත්නම් මාව මරන්නද කියල. උඹව මරන්න තමයි ඉන්නෙ කිව්වම, හේතුව මොකක්ද කියල ඇහුවලු. උඹ මේ විදියට අපට ලැබෙන්න තිබිච්ච



ආහාර නැති කළා, වහාම ඒ නීතිය ඉවත් කරපන් කිව්වලු. මගේ ජීවිතය නැති කළත් මම ඒ නීතිය ඉවත් කරන්නෙ නෑ, උඹට ඕන දෙයක් කරපන් කියල මේ බෝසත් රජතුමා කිව්වලු. ඉතින් මේ අමනුස්සය පොල්ල උස්සගෙන රජතුමාට ගහන්නෙ නැතිව බලාගෙන ඉන්න කොට, ඇයි ඉතින් ගහන්නෙ නැතිව බලාගෙන ඉන්නෙ කියල ඇහුවලු. මට කරන්න දෙයක් නෑ, උඹට ගැහුවොත් මගේ හිස හත් කඩකට පලන්න තව එකෙක් එහා පැත්තෙ උඩ ඉඳගෙන බලාගෙන ඉන්නව කිව්වලු. එතකොට සක්‍ර දෙවියො තමයි මේ යක්‍ෂ වෙසක් මවාගෙන රජතුමාට ආරක්‍ෂාව දෙන්න ඇවිත් හිටියෙ. එහෙම ඇවිත්, රජතුමාට ගැහුවොත් තොගේ හිස හත් කඩකට පලනවයි කිව්වම තමයි මේ අමනුස්සය බයේ පැනල ගියේ.

දැන් මෙතනදි වැදගත් කාරණයක් තියෙනවා. සමහර හාමුදුරුවරුත් කියනවා, මැරිල ගිහින් අමනුස්සයො වෙච්ච එවුන් මේ ලෝකෙ මනුස්සයො දෙන ආහාර, කන්න බොන්න එන්නෙ නෑ කියල. නමුත් **පෙළ දහමෙ තියෙන මේ කතාවෙන් ඔප්පු වෙනවා, ඒ ලෝකවල ඉන්න අමනුස්සයො මේ ලෝකෙ මිනිස්සු කැප කරල දෙන මොනව හරි භෞතික ආහාර ලබා ගන්නව කියල.** ඉතින් ඒ වගේ සත්තු මරල නෙවෙයි, තමන්ගෙ මියගිය ඥාතීන්ට ධර්මානුකූලව කැප කරල දෙන ඥාති බත ආදී මේ ලෝකෙ තියෙන විවිධ භෞතික දේවල් ඒ අය ලබාගන්න බවත් මේ කාරණයෙන් ඔප්පු වෙනවා. එතකොට අපිට අත් දකින්න ලැබිච්ච මේ මියගිය පුද්ගලයත් අමනුස්සයෙක් වෙලා අර විදියට ගත්තෙ ඒ භෞතික ආහාරමයි. ඒ විදියට ජීවත් වෙලා ඉන්න උදවිය දෙන පිනත් හේතු තියේ නම් ඒ අයට ගන්න පුළුවන්. ඒ පින ගන්න හැකියාව තියෙන අය ඒක අරගෙන අනුමෝදන් වෙනවා.

ඒ වගේම මෙතනදි තවත් කාරණයක් පැහැදිලි වෙනවා. සක්‍ර දෙවියො කියන්නෙ මිනිස් ලෝක පාලක දේව මණ්ඩලයෙ ප්‍රධානියා. ප්‍රධාන වශයෙන්ම පංච දුෂ්චරිතයෙන් වැළකිලා ලෝකයට යහපත කරන පිරිසට විශේෂයෙන් රැකවරණ සලසන සිරිතක් සක්‍ර දෙවියන්ට තියෙනවා. ඒක සක්‍ර දෙවියන්ගෙ ගතිය. සක්‍ර දෙවියො, සතර වරම් දෙවියො ආදී පිරිස සුදම් සභාවට එකතු වෙලා ඒ ගැන කතා බහ වෙන ක්‍රමයක් තියෙනවා. පසළොස්වක, අමාවක, පුර අටවක, අව අටවක කියන පෝය හතරටම ඒ පිරිස මනුස්ස ලෝකෙට දූතයො එවල පංච දුෂ්චරිතයෙන් වෙන් වෙලා යහපත් දේවල්, පිං දහම් කටයුතු කරන මනුස්සයො ඉන්නව නම්, ඒ අය ගැන වහාම හොයල බලල දැනුම් දුන්නට පස්සෙ, සක්‍ර දෙවියො ප්‍රධාන වෙලා දේවතාවො මාර්ගයෙන් ඒ අය ආරක්‍ෂා කරන ක්‍රමයක් තියෙන බව ධර්මයේ පෙන්වා තියෙනවා. එදා විතරක් නෙවෙයි, අදත් හෙටත් ඒ කාරණය ඒ විදියටම සිද්ධ වෙනවා. ඒ නිසා මේ කාරණය අද ඉන්න අයටත් වැදගත්. (මේ පිළිබඳ විශේෂ විග්‍රහයක් 25, 26 කලාපවල අභයරත-නාලංකාරය තුළින් දැනටමත් ඉදිරිපත් කරල තියෙනවා.)

ඒ වගේම අමනුස්සයො භෞතික භාණ්ඩ, ආහාර ආදිය නොපෙනෙන්න අතුරුදන් කරන්නෙ කොහොමද කියලත් කෙනෙකුට කුතුහලයක් එන්න පුළුවන්. මෙතනදි ඒ සමහර අමනුස්සයින්ට කර්ම විපාකජ සෘද්ධි තියෙනවා. ඒ අය තමන්ගෙ සියුම් කයින් ඒ භෞතික වස්තුවලට අත තිව්වම ඒකෙ අංශු පරිවර්තනයක් වෙනවා. උදාහරණ විදියට දැන් තියෙන නවීන විද්‍යාවෙන් ඕන නම්, යම් කිසි කිරණ වර්ගයක් එල්ල කරල මොනව හරි

# කේන්ද්‍රයෙන් පෙන්වන හේතු ඵල දහම ....

**2 වන කොටස**

ලෝකයේ සමහර ලෞකික පැති අතැඹුලක් සේ දැකපු මහ ඍෂිවරුන්ට යම් කිසි විපාකයක් ඵල දෙන්නෙ මෙන්න මේ වගේ කර්මයක් කළාමයි කියල පෙන්වා දෙන්න පුළුවන්කමක් තිබුණා. ඒක හේතුඵල දහම අනුව ගොඩනැගිච්ච ලෞකික පටිච්ච සමුප්පාද ක්‍රමයක්. ලෞකික හෝ ලෝකෝත්තර පටිච්ච සමුප්පාදය දේශනා කරන්න ඍෂිවරුන්ට බැරි වුනත්, ලොවුතුරා බුදුන් වහන්සේ නමක් පහළ වෙච්ච කාලයක උන් වහන්සේ විසින් මතු කරන පටිච්ච සමුප්පාද ධර්මයේ තියෙන ලෞකික කොටස ඒ අයට ගෝචර වෙනවා. ඒකෙ ලෝකෝත්තර පැත්ත තමයි කාලයක් යන කොට තේරුම් ගන්න බැරිව යටපත් වෙන්නෙ. ඒ කියන්නෙ පටිච්ච සමුප්පාද නිරෝධය යට ගිහින් සමුදය විද්‍යමාන වෙනවා. අන්න ඒ ලෞකික කොටස තමයි ඍෂිවරු නුවණට ගෝචර කර ගන්නෙ. එතකොට බුදුන්



වහන්සේ පෙන්වා දුන්න පටිච්ච සමුප්පාදයේ විද්‍යමාන වෙන ලෞකික අදහසකුත් තියෙන නිසා ඒ අනුසාරයෙන් හේතු වාසනා තියෙන ඍෂිවරු වගේ අයට ඒ කාරණා ගෝචර කර ගන්න පුළුවන්. ඒ නිසා පරම්පරාවෙන් පරම්පරාවට කාලයක් යන කොට ලෝකෝත්තර අදහස් යටපත් වෙලා අබුද්ධෝත්පාද කාලයකදි ඒ ලෞකික අදහස් ටික විතරක් විද්‍යමාන වෙනවා. ඒ විදියට විද්‍යමාන වෙන පටිච්ච සමුප්පාද සමුදය චක්‍රය ලෞකික නුවණට ගෝචර නිසා, ඒවා ප්‍රයෝජනයට අරගෙන මනුස්ස වර්ගයාගේ යහපතට හේතු වන ලෞකික විද්‍යාවන් විග්‍රහ කරල දෙන්න ඍෂිවරුන්ට හැකියාව ලැබෙනවා.

ඊට පස්සෙ යට ගිහින් තියෙන ලෝකෝත්තර පටිච්ච සමුප්පාදය නැවතත් කෙස් ගහටම විග්‍රහ කරන්නෙ පළමුවෙන්ම ලොව්තුරා බුදුන් වහන්සේ පහළ වෙලා. ඒ පටිච්ච සමුප්පාදයේ අවිද්‍යා, සංඛාර, ☞

---

ආහාර වර්ගයක් අංශු බවට පත් කරන්න පුළුවන්. ඒ වගේ දෙයක් තමයි මෙතනදි වෙන්නෙත්. අමනුස්සය ඒ භෞතික වස්තුවලට අත තියල ගත්තම, ඒ අයගෙ මට්ටමට අංශු කොටස් යනවා. මහ ප්‍රබල අමනුස්සයින්ට ඒ වස්තු / ආහාරය පිටින්ම ගන්න පුළුවන් වුනාට, සාමාන්‍ය අයට එහෙම එකපාරටම ආහාරයක් අතුරුදන් කරන්න බෑ. ඒකෙ තියෙන රසය, ශක්තිය, ද්‍රව්‍යමය අගය ක්‍රමයෙන් තමයි අඩු වෙන්නෙ. එහෙම අඩු වෙලා තමයි අන්තිමට අතුරුදන් වෙන්නෙ.

උදාහරණයක් විදියට යම්කිසි හාල් ඇටයක් තියෙන තැනක, ඇත් දළවලින් හාල් වගේම හදපු ඒ ප්‍රමාණයේම ආකෘතියකුත් තිච්චොත්, මේ දෙක අල්ලල බලල පොඩි කරන කල් කෝකද නියම හාල් ඇටය කියල පිටින් බලල අඳුන ගන්න බෑ. බැලුවම දෙකම එක වගෙයි. දෙකම එක වගේ නම් අපිට ඒකෙ වෙනසක් පේන්න නෑ. පෙනීමට බාහිරින් සනීභවන වුනාට එකක් සාපේක්ෂව මෘදුයි. අනෙක තදයි. ඒ වගේ, අමනුස්සයො ආහාර ගන්න කොට සාමාන්‍ය මනුස්සයෙක් ගන්නව වගේ එක පාරක් ගත්තොත් ඒකෙන් දාහෙන් එකයි අඩු වෙන්නෙ. ඒ ප්‍රමාණයක අංශු කොටස් ඒකෙන් අහක් වෙනවා. හැබැයි ඒ අහක්වීම පිටින් බැලුවට පේන්නෙ නෑ. ඊළඟට තව මට්ටමක් ගන්න කොට ඒ මට්ටමින් අංශු කොටස් ඉවත් වෙලා යනවා. ඒ වගේ දහස් වාරයක් ගත්තම බත් ඇටයකට තියෙන සියලුම අංශු අර ගෙන ඉවරයි. එතකොට තමයි ඒ බත් ඇටය අතුරුදන් වෙන්නෙ.

මේකට සම්බන්ධ තවත් උපමාවක් තියෙනවා. අපේ පැරැන්නො අතර තිබ්ච්ච කතාවක් තමයි, ගම්මිරිස් වේලන කොට යකඩ කැල්ලක් දාල වේලන්න කියල. ඒකෙදි පෙන්වන්නෙ නිකම්ම වේලුවොත් ඒ ගම්මිරිස් යක්කු ගෙනියනව කියල. මේක පරීක්ෂා කරල බලන්න මම දන්න කියන මහත්තයෙක් ඒ කාලෙ එක්තරා පරීක්ෂණයක් කළා. එකම ගොඩකින් සේරු 2 ගානෙ ඇට ගැනල ගම්මිරිස් ගොඩවල් 2 ක් අරගෙන සමාන බරක් එන්න තිච්චා. එක ගොඩකට යකඩ කැල්ලක් දාල වේලුවා. අනෙක නිකම්ම වේලුවා. වේලල ඉවර වෙලා බර කිරල බැලුවම, අර යකඩ කැල්ල දාපු ගොඩේ බරට වඩා අනික් ගොඩේ බර සාපේක්ෂව අඩුයි. හැබැයි ගැනල බැලුවම ගොඩවල් දෙකේම දාපු ඇට ගණන එහෙම්ම තියෙනවා. ඒක අඩු වෙලා නෑ. නමුත් එක ගොඩක බර අනෙක් ගොඩට වඩා අඩු වෙලා. එතකොට ඒ පැරැන්නන්ගෙ කියමනේ යම් කිසි සත්‍යතාවයක් තියෙන බව ඒකෙන් පේනවා. දැන් මෙතනදි ගම්මිරිස් ඇට පිටින් නෙවෙයි, අංශු වශයෙන් තමයි අරගෙන තියෙන්නෙ. ඒ අංශු අඩු වුනාට පිටින් පේන්නෙ නෑ.

හැබැයි මනුස්සයො වශයෙන් අපි දානයක් දෙන කොට, මදි නොවේවා කියල අධිෂ්ඨානයක් කරල දුන්නොත් සමහර විට ඒ අයගෙ ලෝකයට ගැලපෙන විදියට ඒක තව තවත් මදි නොවෙන්න මැවෙන්න පුළුවන්. එතකොට කොච්චර ගත්තත් අඩු වෙන්නෙ නෑ. බුදු දහමෙ පෙන්වා තියෙන කාරණා අනුවත් ඒ තිබ්ච්ච දේ කොච්චර ගත්තත්, ඒක තිබුන වගේම අඩුවක් නැතිව භෞතික වශයෙන් තියෙනවා.

**සටහන**

**නීතිඥ චන්දන සිරිවර්ධන**

විඤ්ඤාණ, නාම රූප, සලායතන, ස්පර්ශ, වේදනා, තණ්හා, උපාදාන, භව, ජාති, ජරා මරණ... ආදී වශයෙන් එන කාරණා 12 තමයි කේන්දරයක ලෞකික වශයෙන් ලග්නස්ථානය, ධනස්ථානය, වික්‍රම-ස්ථානය, ආරම්භක ස්ථානය, පුත්‍රස්ථානය, රෝගස්ථානය, කුටුම්භස්ථානය, මාරක-ස්ථානය, පුණ්‍යස්ථානය, කර්මස්ථානය, අයස්ථානය, වැයස්ථානය ආදී වශයෙන් හඳුන්වන කොටු 12 න් පෙන්වන්නෙ. අද ලෞකික වශයෙන් කියන මේ ස්ථාන 12 පටිච්ච සමුප්පාදයේ අංග 12 ට අනුරූපයි. ඒ අංග දොළහේ ලෝකෝත්තර අර්ථය තමයි ලොව්තුරා බුදුන් වහන්සේ හෙළි කළේ. අන්න ඒ ලෞකික ලෝකෝත්තර අංගයන් දෙක තමයි දැන් මේ පහදන්නෙ.

ලොව්තුරා බුදුන් වහන්සේ ලෝකයට පහළ වෙන්න පෙරත්, පටිච්ච සමුප්පාදය කියන වචනය ලෝකයේ භාවිතයේ තිබුණා. නමුත් ඒ ලෞකික වශයෙන්. ඒක ඊට වඩා ගැඹුරු දෙයක් බව පෙන්වා දීල, ඒ ගැඹුරු අර්ථයෙන් පටිච්ච සමුප්පාදය පෙන්වා දුන්නෙ ලොව්තුරා බුදුන් වහන්සේ. සසර ගමන දුකට බලපාන හැටි, සසරින් නිදහස් වෙන හැටි ... ආදී වශයෙන් ලෝකෝත්තර කරුණු බුදුන් වහන්සේ පෙන්වා දුන්නා. ලෞකික වශයෙන් තියෙන දුක මේකයි, ඒ දුකට හේතුව මේකයි, ලෞකික වශයෙන් ඒ දුකෙන් නිදහස් වෙන්නෙ මෙහෙමයි ... ආදී වශයෙන් කියන ලෞකික අර්ථය තමයි ඒ ලෞකික පටිච්ච සමුප්පාදයෙන් ඍෂිවරු පෙන්නුවෙ. ලෞකික වශයෙන් තෝර ගන්න කොට ඒ අය අවිද්‍යාව හැටියට දැක්කෙ ලෝක සම්මතයේ තියෙන පවු. විද්‍යාව හැටියට දැක්කෙ පින්. සසර ගමන කෙළවර කිරීම විද්‍යාව හැටියට දැක්කෙ නෑ.

වෙනත් විදියකින් කියනව නම්, ලොව්තුරා බුදුන් වහන්සේ පහළ වෙන්න පෙර ලෝකයේ පටිච්ච සමුප්පාදය අර්ථ දැක්වුවෙ පින් පවු දෙක මුල් කර ගෙන. අවිද්‍යා පච්චයා සංඛාරා කියන කොට අර්ථ දැක්වුවෙ, පවු කරන අයට පාප සංඛාර වැඩෙනවයි කියන අර්ථය. නමුත් ඒ කාරණය ලෝකෝත්තර වශයෙන් විග්‍රහ කරන කොට ''තත්ථ කථමා අවිද්‍යා පච්චයා සංඛාරා පුඤ්ඤාභි සංඛාරා අපුඤ්ඤාභි සංඛාරා ආනෙඤ්ජාභි සංඛාරා කාය වචී මනෝ සංඛාරා අයං වුච්චති අවිද්‍යා පච්චයා සංඛාරා ....'' කියල විග්‍රහ කළේ ලොව්තුරා බුදුන් වහන්සේ. ඒ නිසා බෞද්ධයො යථාර්ථය දැන ගෙන පුඤ්ඤාභි සංඛාර හැටියට ගන්න ඒවත් අවිද්‍යාවෙ කොටසක් විදියට සැලකුවා. කුසල මූල පච්චයා සංඛාර කියල ගන්න කොට නිවන් මගට හේතුවන වැඩ පිළිවෙල කියල වෙන් කළා.

කේන්දරයක් ගත්තම කොටු 12 ක් තියෙනවා. ඒ 12 ස්ථාන 12 ක් වශයෙන් එක පැත්තකින් පෙන්වනවා. මෙතනදි 1, 2, 3, 4... ආදී ස්ථාන වශයෙන් 12 දක්වා යන ක්‍රමයක් තියෙනවා. පළවෙනි එක තමයි ලග්නස්ථානයෙන් පෙන්වන්නෙ. මෙතනදි ලග්නය කියල ලැගපු තැන පෙන්වන න්‍යාය කියන්නෙ අවිද්‍යාව නිසා උපාදානය කරපු දේ. පෙර අත් බැවේ උපාදාන කළේ මොකක්ද ඒකෙ තමයි ලැගල තියෙන්නෙ. යම් තැනක උපදින්න නම් අවිද්‍යාව මූලික වෙන්න ඕන. ලැග්ගෙ අවිද්‍යාවෙන් නිසා අවිද්‍යාව ලග්නයට සම්බන්ධයි. අවිද්‍යාව පහළ නොවී විද්‍යාව පහළ වුනා නම් ඒක දුකක් විදියට දකිනවා. එතකොට ලගින බලාපොරොත්තු නැතිව යනවා. ඒ නිසා ඒ පුද්ගලය අතීතයත්, වර්තමානයත්, අනාගතයත් අල්ල ගෙන නෑ. මොකද මේ තුන් කාලයටම තියෙන ඡන්ද රාගයෙන් මිදුන නිසා. මේ තුන් තැනින් මිදුන නම් ඒ රහතන් වහන්සේ. අනෙක් අය අතීතය මුල් කර ගෙන ඡන්ද රාගයෙන් බැඳිල අනාගතය හදනවා. එහෙම නැත්නම් වර්තමානයේ ඡන්ද රාගයෙන් බැඳිල ඒ ජාතියෙම එකක් බලාපොරොත්තුවෙන් අනාගතය හදනවා. අනාගත බලාපොරොත්තුවට ඇති ඡන්ද රාගය තියෙන කල්ම කොහේ හරි ලගිනවා. එතකොට මේ ඡන්ද රාගය තියෙන්නෙ අවිද්‍යාවත් එක්ක. අවිද්‍යාව නිසා තමයි අතීතයේ හෝ වර්තමානයේ හෝ භුක්ති විදින ජාතියෙම එකක් මතු බලාපොරොත්තු වෙන්නෙ. දැන් මොනව තිබුණත් මතු බලාපොරොත්තුවක් නැත්නම් මතු අවිද්‍යාවත් නෑ. ඒ නිසා මතු ලගින්නෙත් නෑ. ජන්ම පත්‍රයේ කොටු 12 න් ලග්නය තමයි පළවෙනි ස්ථානය. ඒ කියන්නෙ පෙර අත්බැවේ ලැගපු තැන. ඒ ගති ලක්ෂණයෙන් තමයි උපන්නෙ. ඒ ලක්ෂණ තමයි ලග්නයෙන් පෙන්වන්නෙත්. 1 වැන්නේ පිහිටි ග්‍රහයගෙන් ඒ ගති ලක්ෂණ පෙන්වනවා. අතීතයේ අවිද්‍යාවෙන් උපාදාන කර ගෙන හිටපු ලක්ෂණය තමයි ලග්නයට සම්බන්ධ වෙන්නෙ.

ඊළඟට 2 වැන්නෙන් පෙන්ව-න්නෙ ධනස්ථානය, රැස් කරන තැන. ලෝකෝත්තර අර්ථයෙන් බැලුවොත් සංඛාර ගොඩ නගන තැන. ධන කියන්නෙ එකතු කරනවා. යම් කිසි කෙනෙක් සංඛාර කරන්නෙ මම, මගෙ කියල ගොඩගහ ගන්න. අවිද්‍යාවෙන් ගත්තු නිගමනය නිසා, යම් තැනක උපන් නිසා හැම වෙලේම බලාපොරොත්තු වෙන්නෙ ඒ අවිද්‍යා ප්‍රත්‍යයෙන්ම එකතු කරල රැස් කර ගන්න. ඒ නිසා කාය, වචී, මනෝ සංඛාර ගොඩ නගනවා. එතකොට පුද්ගලය ඒ ජීවිතයෙදි එකතු කරන ඒව ධනස්ථානයට සම්බන්ධ වෙනවා. ලෞකික වශයෙන් ගත්තම ඒ පුද්ගලයා ධනය හොයන ක්‍රම, ධනය හොයන වේගය, ඒ සඳහා භාවිතා කරන සාධාරණ අසාධාරණකම් ආදිය ධනස්ථානයෙන් පෙන්නුම් කරනවා.

3 වැන්න වික්‍රමස්ථානය. සංඛාර කරන්නෙ අනාගත බලාපොරොත්තුව නිසා. ඒ අනාගත බලාපොරොත්තුව තමයි විඤ්ඤාණය කියන්නෙ. එතකොට බලාපොරොත්තු සඵල හෝ අපල නම් විඤ්ඤාණය විද්‍යමානයි. ඒකෙන් තමයි වික්‍රමයක් බලාපොරොත්තු වෙන්නෙ. හම්බ කරගත්තු දේවල්වලින් ජයග්‍රහණයක් බලාපොරොත්තු වෙනවා. උපන් කෙනා ධනයක් හරි හම්බ කර ගෙන ඒකෙන් වැජඹෙන එක තමයි මේ පෙන්වන්නෙ. ඒ කියන්නෙ සංඛාර පච්චයා විඤ්ඤාණං කියන එක.

4 වැන්නෙන් පෙන්වන්නෙ ආරම්භක ස්ථානය. එකතු කරගත්තට පස්සෙ පුද්ගලය මතු මතුත් තව ගොඩක් හදන්න බලාපොරොත්තු වෙනවා. එහෙම හදල තවත් ප්‍රියමනාප දේවල් ලෝකෙ තියේ නම් ඒවත් එකතු කර ගන්නවා. ඒ කියන්නෙ ගොඩ නගා ගත්තු විඤ්ඤාණයෙන් අලුතින් නාම රූප ගොඩ නගා ගන්නවා. තමන්ට ප්‍රිය මනාප දේවල් එකතු කර ගෙන ඒවාට හිත බැඳ ගන්නවා. ඒ කියන්නෙ යමක් කමක් හරි හම්බ කරන්න, ආරම්භ කරන්න සිද්ධ කරන මොනව හරි අළුත් වැඩ. විවාහයට පත් වීම, ගෙවල් දොරවල් හැදීම, රස්සාවක් කිරීම ආදිය මේ ස්ථානයට වැටෙනවා. මේකට බන්ධුස්ථානය, ගෘහස්ථානය, සුඛස්ථානය කියලත් කියනවා. අනෙක් ස්ථානත් එක නමකින් විතරක් නෙවෙයි, සමහර අවස්ථාවල විවිධාකාරයේ නම්වලින් හඳුන්වනවා. ඒ කියන්නෙ අද වෙන කොට ඒ සම්බන්ධයෙන් විවිධ මත තියෙනවා. ඒ නිසා මේ ලිපි පෙළින් කිසිසේත්ම ජ්‍යොතිෂ විද්‍යාව ඉගැන්වීමක් කරන්නෙ නෑ. **මේ ජ්‍යොතිෂ විද්‍යාව ඇතුලෙ සැඟවිලා තියෙන හේතුඵල දහම් රටාවට අනුව යන සසර ගමනේ ස්වභාවය යම් ආකාරයකට පෙන්වා දීල, කර්ම ඵලවල ස්වභාවය තේරුම් ගන්න මග පාදා දීල, මෙලොව වශයෙන් යහපතින් අභිවෘද්ධියෙන් ජීවත් වෙලා සසර ගමනින් මිදෙන්න යම් කිසි ආකාරයකට උපනිශ්‍රයක් වෙන්න කියල තමයි මේ ලිපි පෙළ ඉදිරිපත් කරන්නෙ.**


ඊළඟට 5 වැන්න පුත්‍රස්ථානය. ඒකට සහජස්ථානය, බුද්ධි ස්ථානය කියලත් කියනවා. පුත්‍රස්ථානය කිව්වෙ දරුවො විතරක් නෙවෙයි, යම් කිසි

ප්‍රසූත කරන අර්ථයෙන් තමයි පුත්‍ර කියන්නෙ. ප්‍රසූත කරන්නෙ, යමක් හදන්නෙ යම් කිසි ප්‍රතිඵලයක් බලාපොරොත්තුවෙන්. ඒ ප්‍රසූත කරන දේවල් යමකින් බලාපොරොත්තු වෙනව නම්, ඒවායින් තමයි රස්සාවක් කරල, හරි හම්බ කරල සියල්ල එකතු කරල සකස් කරල ලාභයක් ගන්න බලාපොරොත්තු වෙන්නෙ. ඒ ලාභය තමයි පුත්‍ර කියන්නෙ. ඒ කියන්නෙ ඒ පුද්ගලයගෙන් උපන් දේවල්. රැකියාක් කරනව නම් ඒකෙන් උපන්නෙ වැටුප. ඒක තමයි ප්‍රසූත කර ගත්ත දේ. ගොවිතැන් කළා නම් ඒකෙන් ප්‍රසූත කරන්නෙ අස්වැන්න. එතකොට මේ ප්‍රසූත කරන්න ආයතන අවශ්‍ය වෙනවා. ඒ විදියට හය ආකාරයකින් ප්‍රසූත කරන්නා වූ ස්ථාන තමයි සලායතන කියන්නෙ. ඒ හයෙන් තමයි අවශ්‍ය දේවල් ප්‍රසූත කර ගන්නෙ. ඒ කියන්නෙ කලින් හදාගත්තු නාම රූපවලින් දැන් ආයතන හදා ගන්නවා. ඒ ආයතන පාවිච්චි කරල හදන දරුවො, මිල මුදල්, දේපල, වත්කම්, අලුතින් කරන නිෂ්පාදන ආදිය මේ ස්ථානයට අයිති වෙනවා. ඒ වගේම පාසල් අධ්‍යාපනයත් මේ ස්ථානයෙන් දැක්වෙනවා.

6 වැන්න රෝග-ස්ථානය. ඒකටම සතුරු ස්ථානය කියලත් කියනවා. මේකෙන් කියන්නෙ සලායතනවලින් ලබාගන්න ස්පර්ශය. ඒ ස්පර්ශය කටුකයි, වෙහෙසයි. සලායතනවලින් හොඳ ස්පර්ශ විතරක් බලාපොරොත්තු වුනත් කවදාවත් ඒක වෙන්නෙ නෑ. බලාපොරොත්තු වෙන්නෙ සතුටක් සැනසීමක්. ඒත් අන්තිමට ලැබෙන්නෙ දුක් ගොඩක්. බලාපොරොත්තු දේට විරුද්ධ දෙයක්මයි ලැබෙන්නෙ. ඒක තමයි අනිච්ච කියන්නෙ. ලැබෙන්නෙ අනිච්ච දෙයක් නම් ඒ සතුරු දෙයක් මිසක් මිතුරු දෙයක් නෙවෙයි. ඒ නිසා තමයි සතුරු ස්ථානය කියන්නෙ. ඒ කියන්නෙ මේ සියල්ලම කරල ඉවර වුනාම ඊළඟට එන්නෙ වෙහෙස මහන්සිය, රෝග කාරක භාවය. ඒ වගේම ජීවත් වෙලා ඉඳෙද්දි එන ලෙඩ රෝග, කර්මජ රෝග, සතුරන් ආදියත් මේ ස්ථානයෙන් පෙන්නුම් කරනවා.

ඊළඟට 7 වැන්න කුටුම්භස්ථානය හෙවත් කලත්‍ර ස්ථානය, විවාහස්ථානය ආදී නම්වලින් හඳුන්වනවා. දැන් බලාපොරොත්තු දේට විරුද්ධ දෙයක්, කරදරයක් එන කොට ලෝකයෙන් ප්‍රතිකර්ම හොයනවා. උදාහරණ විදියට සතුරු කරදර දුකයි, කටුකයි. ඊට පස්සෙ කල්පනා කරනව මේකට මොකද කරන්න ඕන කියල. දැන් ඒකට අවශ්‍ය කරන නව ප්‍රතිකර්ම ගොඩක් එකතු කරනවා. එකතු කළේ සතුටු වෙන්න දේවල්. දැන් සතුටු වෙලා ඒවා රකින්න දේවල් එකතු කරනවා.

උදාහරණ විදියට කය හදාගත්තා, රස්සාවක් හදා ගත්තා. විවිධ වත්කම් වස්තු එකතු කර ගත්තා. දැන් ඒ එකතු කරගත්තු ඒව රැක ගෙන ඉතිරි කර ගන්න තව කොටසක් හොයා ගන්නවා. ඒව තමයි පරපුර ඉදිරියට ගෙනියන්න ආධාර වෙන්නෙ. කුටුම්භස්ථානයෙන් පෙන්ව-න්නෙ ඒ ටික. ඒ කියන්නෙ පවුල් ජීවිතයෙදි සියලු දෙනාම එකතු වෙලා කටයුතු කිරීමට අදාල ස්ථානය. කිට්ටු වෙලා ඉඹ ගන්නවා කියන එක තමයි කුට්ටුම්භ කියන්නෙ. වෙනත් විදියකින් කියනව නම් වේදනාව හෙවත් වින්දනය කරන ස්ථානය. ඒ කියන්නෙ භාර්යාව, ස්වාමි පුරුෂයා, දූ දරුවො, දෙමව්පියො, මුණුබුරු මිණිබිරියො, දේපල වස්තුවල එකතුවක් පෙන්වනවා. පොඩි එකාට ළං වුණා ඉඹ



1. ලග්නස්ථානය - අවිද්‍යා
2. ධනස්ථානය - සංඛාර
3. වික්‍රමස්ථානය - විඤ්ඤාණ
4. ආරම්භකස්ථානය - නාමරූප
5. පුත්‍රස්ථානය - සලායතන
6. රෝගස්ථානය - ස්පර්ශ
7. කුටුම්භස්ථානය - වේදනා
8. මාරකස්ථානය - තණ්හා
9. පුණ්‍යස්ථානය - උපාදාන
10. කර්මස්ථානය - භව
11. අයස්ථානය - ජාති
12. වැයස්ථානය - ජරා, මරණ

ගත්තා. මේ ආදී වශයෙන් භාර්යාව, දෙමව්පියො, දරු මුණුබුරෝ, දේපල වස්තුව කියන තමන්ගෙ අය සහ තමන්ගෙ දේවල් කිට්ටු කර ගෙන ඉඹ ගන්නවා. කුට්ටම කියන වචනය ගත්තමත් කිට්ටු වීමක් තමයි ඒකෙන් පෙන්වන්නෙ. කිට්ටු + අම - කුට්ටම. අම කියන්නෙ මෘදු බව. මෘදු බවින් කිට්ටු වීම තමයි කුට්ටම කියන්නෙ. හුග දෙනෙක් හිතන් ඉන්නෙ කුටුම්භස්ථානය කිව්වම ඒකෙන් පෙන්වන්නෙ විවාහය විතරයි කියල. නමුත් පවුලේ සියලු දෙනාගෙම සහ දේපල වස්තුවල එකතුව තමයි ඒකෙන් පෙන්වන්නෙ.

ඊළඟට 8 වැන්න මාරකස්ථානය හෙවත් ආයුසස්ථානය කියල හඳුන්වනවා. ඒ කියන්නෙ මරණය කොයි වෙලේ එනවද කියන්න දන්නෙ නෑ. අන්න ඒ වගේ අවස්ථාවක්. හදා ගත්තු ජාති මොහොතක් මොහොතක් පාසා මරණයට පත් වෙනවා. තණ්හාව තමයි ඒකට මූල හේතුව. තණ්හාව කියන්නෙ හැම වෙලේම අසහනයක්. ඒ කියන්නෙ තමන්ට හිමි දෙයක් නැති වෙන කොට නැවත වාරයක් ගොඩ නගා ගන්න හිතෙනවා. ආස්වාදය සඳහා ඇලෙනවා, හා වෙනවා. තමන් ඇලෙන දේට විරුද්ධව සතුරෙක් එන කොට ඒකට ගැටෙනවා. ගැටෙන්නත් ඇලීමක් තියෙන්න ඕන. ඒ කියන්නෙ ලෝභ, ද්වේශ දෙකටම ඇලෙනවා. ඒ සඳහා යම් කිසි තැනකට හා වෙන්න බලනවා.

නමුත් යම් දෙයක් ගොඩ නගා ගත්තට පස්සෙ ඒක කැඩෙන්නෙ බිඳෙන්නෙ නැත්නම් තණ්හා වෙන්න දෙයක් නෑ. කැඩෙන, බිඳෙන වැනසෙන නිසාම තමයි ඒක රකින්න ආසාවක් / තණ්හාවක් ඇති වෙන්නෙ. තැනකට හා වෙන්නෙ ඒකයි. දරුවෙක් අතින් අල්ල ගෙන බදාගෙන ඉන්නෙ දරුව වැටෙන නිසා, දාල යන්න බෑ. ඒ නිසා තණ්හාවෙන් අල්ල ගෙන ඉන්නවා. නමුත් වැඩිහිටි කෙනෙක් එහෙම අල්ල ගෙන ඉන්නෙ නෑ. මොකද වැටෙන්න නැති නිසා. ඒ නිසා එතැනට හා වෙන්න ඕන නෑ. යමක් කැඩිල බිඳිල යන්න හදනව නම් තමයි තණ්හා වෙන්නෙ. කැඩෙන්න බිඳෙන්න වැනසෙන්න යන බව දැක්කම ඊළඟට ඒක රකින්න යනවා, ඒ තැනට හා වෙලා ඉන්නවා. මාරකස්ථානය නිසාමයි ඒක කරන්නෙ. ඒ නිසා තණ්හාවක් හදා ගන්නවා. වේදනාවෙන් තණ්හාව හදා ගත්තට පස්සෙ ඒක විනාසයට තමයි හේතු වෙන්නෙ. සෝකය, භය හට ගන්නෙ තණ්හාව නිසා. තණ්හා ජායතී සෝකෝ තණ්හා ජායතී භයං කියන්නෙත් ඒකයි. මේ විදියට ජන්ම පත්‍රයක ලග්නයෙන් පටන් ගෙන අට වැන්නට එනකල් පෙන්වන්නෙ උපතේ පටන් ගෙනාපු කර්මයන්ගේ අවසාන වෙන මොහොතේ ක්‍රියා කලාපය.

ඊළඟට 9 වැන්න පුණ්‍යස්ථානය හෙවත් ධර්මස්ථානය කියලත් හඳුන්වනවා. මෙතනදි පුණ්‍ය හෙවත් පිං කියන්නෙ හොඳ හෝ නරකින් පිනවන අර්ථයෙන්. මොන දේ කළත්, කොච්චර කල් හිටියත් අන්තිමට මැරෙනවා, වැනසෙනවා. වැනසුනොත් නැවත වාරයක් හදා ගන්නත් ශක්තියක් ඕන. ගෙනාපු දේ වැනසුනාම අවිද්‍යාව තවමත් තියෙන නිසා එතනින් නතර වෙන්නෙ නෑ. ඊට පස්සෙ නැවතත් ගොඩ නගන්න බලනවා. එහෙම අලුත් ශක්තියක් ගොඩ නැගුවොත් තමයි ☞

නැවතත් ඒ වගේ දෙයක් ලැබෙන්නෙ. ඒකට තමයි උපාදාන කරන්නෙ. ලෝකයේ පැවැත්මට අවශ්‍ය දේවල් තමයි උපාදාන කරන්නෙ. ඒ නිසා පිං පවු දෙකටම තණ්හාවෙන් බැඳිල ප්‍රිය මධුර දේවල් කරනවා.

ඒ කියන්නෙ මේ අත් භවයෙදි මෙළොව ඉඳල පිනවන්න කර ගන්න පින් හෝ පවු. නැවතත් මතු අත්බැවක ආරම්භය. පෙර භවයේ පිනෙන් තමයි දැන් මනුස්ස වෙලා ඉන්නෙ. මනුස්ස වෙලා කටයුතු කර ගෙන ගියාට පස්සෙ ඒ පුද්ගලය ඉදිරියටත් වැඩ සලස්ව ගන්නවා. කර ගත්තු දෙයක් තියේ නම් ඒක තමයි පුණ්‍ය කර්ම හෝ පාප කර්ම කියන්නෙ. පෙර අත්භවයේ පුරුද්ද තමයි එතනදි ඇදිල එන්නෙ. පුංචි ළමයෙක් වුනත් පන්සලකට ගිහින් සාදු කියන්නෙ සසර පුරුද්ද නිසා. එතකොට 9 වැන්නෙන් කියන්නෙ පෙර සසර පුරුද්දට එන හොඳ හෝ නරක ගති ලක්ෂණ. ඒ සසර පුරුද්දට මේ අත් භවයේ කරන පිං පවු කටයුතු තමයි ඒකෙන් පෙන්වන්නෙ. ඒ විදියට පිනවන්න කරන පින් පවු තමයි මතු අත් භවයට අරගෙන යන්නෙ. පවක් කර ගත්තොත් ඒක නීචයි, පිනක් කර ගත්තොත් යහපත්. ඒක උපාදානයෙන් තමයි කරන්නෙ. පින වීමට උපාදාන කරගත්තු නිසා පුණ්‍ය ස්ථානය කියල කියනවා. මනුස්සයෙක් වෙලා නැවතත් සුගතිගාමී වෙන්න නම් පිනක් තියෙන්න ඕන. එතකොට මේ පුණ්‍යස්ථානය කියන එකෙන් පින් පවු ඵල දීමක් නෙවෙයි පෙන්වන්නෙ. මොකද පින් පවු ඵල දෙන ප්‍රවෘත්ති විපාක 8 වැන්නට එන කොට මාරකස්ථානයෙන් ඉවරයි. පුණ්‍යස්ථානයෙන් පෙන්වන්නෙ මේ අත්බැවේදි හරි හම්බ කරගන්න, ඊළඟ අත්බැවට යන ඒවා. පවක් නම් විනාසයට යන්නෙ. පිනකින් තමයි සම්පත්තියක් ලැබෙන්නෙ.

ඊළඟට 10 වැන්නෙන් කියන්නෙ කර්මස්ථානය හෙවත් පීතෘ ස්ථානය. එහෙම නැත්නම් භව ගොඩ නගන ස්ථානය, යමක් පිහිටුවා ගත් තැන. ඒකට රැකියා ස්ථානය කියලත් කියනවා. ඒ කියන්නෙ තමන්ගෙ අනාගතය සකස් කර ගන්න අභිවෘද්ධිය නගා ගන්න ස්ථානය, හරි හම්බ කරගෙන එකතු කර ගන්න ස්ථානය. ඒක තමයි අත්තිකම්ම භවෝ හෙවත් කර්ම භව කියල පෙන්වන්නෙ. උපාදාන පච්චයා කම්ම භවෝ. මෙතනදි එන්නෙ උප්පත්ති භව නෙවෙයි, කර්ම භව. යම් කිසි දෙයක් උපාදාන කළාම ඊට පස්සෙ ඒකට අදාල භවය. 9 වැන්නෙන් පිනක් කර ගෙන අවශ්‍ය දේට උපාදාන වුණා. ඊට පස්සෙ ඒකෙන් මෙලොව කර්ම භවයට එකතු කර ගත්ත දේ (10 වැන්නෙන්) පෙන්වනවා. ඒ නිසා මේ ස්ථානයෙන් පුද්ගලයගෙ වත්කම්, ලැබීම්, හරි හම්බ කරගත්තු දේ ආදී වශයෙන් මේ අත් භවයෙදි ලැබෙන සම්පත්තිය පෙන්වනවා. උප්පත්ති භවයෙන් තමයි ඊළඟ භවයට යන්නෙ. ඒ උපත්ති භව පළ දෙන්නෙ කර්ම භවයෙන් උපාදාන කර ගත්තු දේ අනුව.

ඊළඟට 11 වැන්න අයස්ථානය. භව පච්චයා ජාති. භවයෙන් පස්සෙ ගොඩ නැගෙන ප්‍රවෘත්ති ජාති තමයි මේකෙන් පෙන්වන්නෙ. මෙලොවදි හදා ගත්තු ප්‍රවෘත්ති ජාතිය. පටිසන්ධි ජාතිය ලැබෙන්නෙ මරණින් පස්සෙ. මෙතනින් පෙන්වන්නෙ මෙච්චර කලක් එකතු කරගත්තු දේවල්වලින් ලැබෙන ජාති. හෙවත් ප්‍රවෘත්ති ජාති. මෙතනදි දිට්ඨ ධම්ම වේදනීය වශයෙන් එන කර්ම කොටසක් ඊළඟට තියෙනවා. කර්මයක් කළාම විපාකයක් එනවා. ඒකෙන් මෙලොවදි ලැබෙන ප්‍රවෘත්ති විපාකය තමයි මේ පෙන්වන්නෙ. වෙනත් විදියකට කියනව නම් දිට්ඨ ධම්ම වේදනීය කොටස.

උදාහරණ විදියට මෙලොවදි යමක් හරි හම්බ කරගත්ත නම් ඒකෙන් ඒ පුද්ගලය ඒ ජාතිකයෙක් බවට පත් වෙනවා. ගොවිතැන් කරල හොඳ පැත්තට සශ්‍රීකත්වයක් ලැබුවොත් ගොවියා කියන ජාතිය ලබනවා. ලෝකයේ ගොවියා කියල ජාතියක් හට ගැනීම පෙන්වන්නෙ මේ 11 වැන්නෙන්. වෙළඳාමෙන් හරි හම්බ කළොත් වෙළෙන්දා කියල ජාතියක් හට ගන්නවා. හැබැයි හිඟන්නෙකුට වෙළෙන්දෙක් කියන්න බෑ. යමක් විකුණල සල්ලි හම්බ කරන කෙනාට තමයි වෙළෙන්දා කියන්නෙ. අනුන්ගෙන් යමක් ඉල්ල ගත්තොත් ඒක හිඟන ජාතිය. අයස්ථානයේ ඉඳන් මෙලොවදී එකතු කර ගන්න දේ තමයි මේ පෙන්වන්නෙ. ඒක ඒ ජාතියේ නමින් හඳුන්වනවා. මේකට මිත්‍රස්ථානය, ලාභස්ථානය හෙවත් භාවස්ථානය කියලත් කියනවා. ඒ කියන්නෙ ප්‍රවෘත්ති විපාක ජාති. යාළු මිත්‍රාදීන්, ආදායම් ලැබෙන ස්ථානයන් මේකෙන් පෙන්නුම් කරනවා. එකතු කරගත්තු දේ ලාභාංශ කොහාටද අය වුනේ කියල පෙන්වන්නෙ මේ ස්ථානයෙන්. ඒ කියන්නෙ මෙලොව ප්‍රවෘත්ති ජාති පටන් ගත්තු තැන ඉඳල සහජාත විපාක තියෙනවා. 9 වැන්නෙ ඉඳන් ඉදිරියට දිගටම පෙන්වන්නෙ මෙලොව කරන දෙයින් ලැබෙන විපාකයි, මතු විපාකයි. 9 වැන්නෙන් මෙලොවදි කරන වැඩ ආරම්භ කරල, 11 වැන්නෙන් ප්‍රවෘත්ති ජාති, ප්‍රයෝග සම්පත්ති පෙන්වනවා.

ඊට පස්සෙ 12 වැන්න වැයස්ථානය කියන්නෙ කෙළවර වුණා, වැය වුණා කියන එක. ප්‍රවෘත්ති ජාතියේ කෙළවරවීම. ජරාවයි, මරණයයි දෙක තමයි දැන් එන්නෙ. මෙලොවදි හදාගත්තු ප්‍රවෘත්ති විපාකත් එන කොට විනාසයටම තමයි යන්නෙ. ගොවියත් මැරෙනවා, වෙළෙන්දත් මැරෙනවා, කවුරු වෙලා හිටියත් මැරෙනවා. වියදම්, රෝහල් ගතවීම්, සිර ගතවීම් වගේම මෙලොව අකුසල කර්ම විපාකත් මේ ස්ථානයෙන් පෙන්නුම් කරනවා. ජරා, මරණවලින් පස්සෙ ඊළඟට එකක් පෙන්නුම් කරන්නෙ නෑ. අවිද්‍යාව නමැති හේතුව තියේ නම් ඊළඟ අත්භවයට යන්න නැවත එකක් ආරම්භ කරන්න තවත් තැනක ළගිනවා. දැන් අලුත් තැනක ළගින්න බලාපොරොත්තුවක් ඇති වෙනවා. ඒ බලාපොරොත්තු ක්‍රියාත්මක වන තැන හෙවත් ඊළඟට ළගින තැනට උප්පත්ති භව කියල කියනවා.

ඊට පස්සෙ එතනින් නැවතත් ලැගපු තැනට අනුව අළුත් ආරම්භයකට තමයි යන්නෙ. අවිද්‍යාව තිබුනොත් ඒක දිගටම යනවා, නවතින්නෙ නෑ. කෙටියෙන් කියනව නම්, මේ කේන්දරයෙන් පෙන්වන්නෙ මෙලොව හරි හම්බ කර ගෙන ජීවත් වෙලා කාල බීල පවුල් ජීවිත ගත කරල, ඒ ඔක්කොම කටයුතු සිද්ධ කරල පිනක් දහමක් හෝ පවක් කර ගෙන ඒකෙන් යමක් හදා ගෙන, ඊට පස්සෙ ඒකෙන් යන්න හදා ගත්තු තැනේ ස්වභාවය. අන්තිමට මරණය. මේ පෙන්වන්නෙ මේ අත් බැවේ කටයුතු ටිකයි, ඊළඟ අත් බැවට කරගත්තු කටයුතු ටිකයි. පෙර අත්බැවේ සම්බන්ධය තමයි ලග්නයෙන් පෙන්වන්නෙ. එතැන් පටන් මේ ජීවිතය ආරම්භ කර ගෙන අවසානය දක්වා යන හැටි තමයි මේ චක්‍රයෙන් පෙන්වන්නෙ. ඒ නිසා කේන්දරයක අතීත, වර්තමාන, අනාගත කියන තුන් කාලයම අඩංගු වෙනවා. ඒ තුන් කාලයෙම ප්‍රතිඵල තියෙනවා. මේ ලෞකික වශයෙන් කියන ස්ථාන 12, පටිච්ච සමුප්පාද චක්‍රයෙන් කියවෙන අංග 12 ට අනුරූපයි.

**ඒ නිසා කේන්දරය හරියටම දන්න කෙනෙකුට මේ පටිච්ච සමුප්පාද චක්‍රයේ අංග 12 න් පෙර අත් භවයේ ගෙනාපු ගති ලක්ෂණ අනුව මේ අත් භවය විතරක් නෙවෙයි, මතු අත්භවයත් කොයි ආකාරයෙන් සකස් වෙනවද කියල අනුමාන වශයෙන් කියන්න පුළුවන්.** ඒ මතු අත් භවයට යන ලක්ෂණ ලේසියෙන් වෙනස් වෙන්නෙ නෑ. ප්‍රයෝග සම්පත්තියක් කියන විශේෂ යමකින් වෙනස් කළොත් හැර ඒ ක්‍රියාදාමය වෙනස් වෙන්නෙ නෑ. හැබැයි ඒකත් ලේසියෙන් වෙන්නෙ නෑ. මොකද ඒ සඳහා ඊටත්

එහා මහා උත්තමයෙක් මුණ ගැහෙන්න ඒකටත් පිනක් කරල හේතු වාසනා තියෙන්න ඕන. එහෙම හේතු තිබුනොත් ඒක උඩට ඇදල එනවා. එහෙම මුණ ගැහිල තිබුන නම් ඒකත් කේන්දරයෙන් කියවෙනවා. ඉදිරි අනාගතය සකස් කර ගන්න සුදුස්සෙක් මුණ ගැහෙන්න හේතු තියෙනවද කියන කාරණයත් ඒකෙන් බලාගන්න පුළුවන්. ඒ නිසා මොන දේ වෙන්න තිබුණත් ඒක කේන්දරයෙ සටහන් වෙලා තියෙනවා. නමුත් ඒ කාරණය හරියටම බලාගන්න බැරි එක තමයි අද ප්‍රශ්නය වෙලා තියෙන්නෙ. මොකද ඒ සාස්ත්‍රය යටපත් වෙලා.

අපේ මේ භව චක්‍රයම තමයි කේන්දරයෙන් පෙන්වන්නෙ. ඒ නිසා තමයි ඒ භව චක්‍රය බලන්න උපරිම හැකියාව තිබ්බ්ච ලොව්තුරා බුදුන් වහන්සේට, යම් කිසි කෙනෙක්ගෙ ජීවිතය මෙතැන් පටන් ඉදිරි දින 7 ඇතුළත මෙන්න මේ ආකාරයටයි ක්‍රියාත්මක වෙන්නෙ කියල එල්ල කරලම කියන්න පුළුවන්කම තිබුණෙ. විශේෂයෙන් ඥාන සම්බන්ධයක් නැතිව, විශේෂ ආවර්ජනයකින් තොරව තමයි ඒ හැකියාව උන් වහන්සේට තියෙන්නෙ. ඒක උන් වහන්සේට නිරායාසයෙන්ම පිහිටන ස්වභාවයක්. ආවර්ජනය කරල ගන්නව නම් උන් වහන්සේට අසීමාන්තිකව බලන්න පුළුවන්. මෙතැන් පටන් දින 7 ක් ඇතුළත සුප්පබුද්ධ රජතුමා, රජ මාළිගාවෙ උඩු මහලින් පහළට බහින පඩි පෙළේ හරියටම මේ ස්ථානයේදි පොළව පලාගෙන අපා ගත වෙනව කියල උන් වහන්සේ කල් තියාම එල්ල කරලම කිව්වෙ ඒ හැකියාව නිසා. ඒකෙන් රජතුමාට බේරෙන්න බැරිව ගියා. බුදුන් වහන්සේ එහෙම දෙයක් ප්‍රකාශ කළොත් ඒක බොරු නොවන බවත්, ඒ විදියටම සිද්ධ වෙන බවත් රජතුමා දැන ගෙන හිටියා. නමුත් ඒකට උපක්‍රමයකුත් යෙදුවා. බුදුන් වහන්සේ ප්‍රකාශ කරපු විදියට පොළොව පළාගෙන යන්න නම් බිම ඉන්න ඕන. බිම හිටියොත් තමයි ඒ කියපු විදියට වෙන්නෙ. උඩ හිටියොත් ඒ කියපු ස්ථානය අහු නොවන නිසා ඒක වෙන්න විදියක් නෑ. ඒක තමයි රජතුමා ගත්ත තීරණය. ඒ නිසා මොකද කළේ, උඩු මහල් තලයට නැගල දින 7 ක් යන කල් මුර කර ගෙන හිටියා. ඒ කියන්නෙ කිසිම කෙනෙකුට බැරි වෙලාවත් සිහි විකල්ලෙන්වත් එන්න දෙන්න එපා කියල.

මේ අතර රජතුමාට විතරක් මෙල්ල වෙන, වෙන කාටවත් මෙල්ල කරන්න බැරි අශ්වයෙකුත් රජ මාළිගයේ හිටියා. ඉතින් ඔහොම හරියටම දින 7 ක් යන කොට ඒ අශ්වයා කුලප්පු වෙලා රජ මාළිගාව දෙවනත් කරන්න පටන් ගත්තා. ඒ තමයි කර්ම ශක්තිය ඇදිල ආපු හැටි. ඒ වෙලාවෙදි රජතුමාටත් ඔක්කොම අමතක වුණා. අද නේද අර දවස කියල නිච්චි නැතිව ගියා. අශ්වයා කුලප්පු වෙලා රජ මාළිගාව දෙවනත් කරනව කියන ආරංචියට, මුරකරුවන් ඇතුළු සියලු දෙනාටම අර දවස් 7 ක කතාව අමතක වුණා. ඒ නිසා මේ කුලප්පු වෙච්ච අශ්වයා මෙල්ල කරන්න රජතුමා පහළ මාලයට බහින්න සූදානම් වුනයි කියන්නෙ, අර දින 7 අවසානයේ බුදුන් වහන්සේ ප්‍රකාශ කරපු අවස්ථාව ආවයි කියන එක. රජතුමා උඩ ඉඳන් පහළට බහින වෙලාවට මුරකරුවන් සියල්ලටම අමතක වුණා, රජතුමාව නවත්වන්න. ඉතින් පඩි පෙළෙන් බැස්ස විතරයි පොළව පලාගෙන ගියා. එතකොට බුදුන් වහන්සේට කියන්න පුළුවන්කම තිබුණා, ඒකාන්තයෙන්ම ඕනෑම කෙනෙකුට සිද්ධ වෙන දෙයක්. මොකද අපි මොන ප්‍රයෝග සම්පත්තියක් දැම්මත්, අචින්ත්‍ය කර්ම විෂය අති සූක්ෂමයි. ඒක ක්‍රියාත්මක වෙන්නෙ කර්ම වේගයේ තල්ලුවෙන්.

ඉතින් ඒ කාරණය නොදන්න නිසා, අපි යමකට උත්සාහ වීර්ය කරන්න ඕන. මොකද අපි පෙර කරපු දේ තමයි වර්තමානයට හැඩ ගැහිල එන්නෙ. අද කරන දේ තමයි මතු අනාගතයට හැඩ ගැහෙන්නෙ. ඒක අද කරන දේත් එක්ක සම්බන්ධ වෙනවා. දැන් මේ හැඩ ගැහිල තියෙන සිද්ධාන්තය හැදිල තියෙන්නෙ අපි කරපු, කියපු, හිතපු දේවල්වලින්මයි. හැබැයි ඒකෙ ඵලය කරපු, කියපු, හිතපු මොහොතෙදි නෙවෙයි එන්නෙ. දැන් වපුරපු දේ අස්වැන්න දැන් නෙවෙයි එන්නෙ. එතකොට හෙට කන්න තියෙනවද කියල ඇහුවොත්, තියෙනවා. ඒ කොයින්ද ඇහුවොත්, ගිය සැරේ අස්වැන්න තවම තියෙනවා. දැන් ඒ පුද්ගලයා හිතුවොත්, මට හෙට කන්න තියෙනවනෙ, ඒ නිසා මම දැන් නිකං ඉන්නවා, ඒ නිසා මොකටද ගොවිතැන් කරන්නෙ කියල, ඔහොම ඉඳල ඒ සංචිතය ඉවර වෙච්ච දවසට මොකද කරන්නෙ ?

දැන් එතනින් පස්සෙ ආරම්භ කරන්න දෙයක් නෑ. ඒ නිසා හදපු එක කනව වගේම එදා ගොඩනගපු දේ මෑත කාලයෙදි ඉදිරියට ගෙනියන්නත් උපනිශ්‍රය වෙනවා, ඉතිරි වෙනවා. එහෙනම් ඒ ඉතිරිය ගෙනියන්නෙ අපි හිතපු, කරපු, කියපු දේවලින්මයි, ඒකෙ ප්‍රතිඵලයමයි. හැබැයි අද කරපු දේ ප්‍රතිඵල අදම ලබන්න බෑ. අද වපුරල හෙට කන්න බැලුවට හරියන්නෙ නෑ. ඒ නිසා තමයි කියන්නෙ, දිට්ඨ ධම්ම වේදනීය වශයෙන් එන්නෙ ඉතාම මාත්‍රයයි කියල. උපපජ්ජ වේදනීය වශයෙන් ඊළඟ අත්බවයටත් යන කොටස් තියෙනවා. ඒ නිසා ඊළඟ අත්බවය හැදෙන කොටසට මේ අත්බවයෙ මාත්‍රයකට හෝ අනුව අනුරුවක් ගොඩ නැගෙනවා. මේ අත් බැවේ පොඩ්ඩක් වෙනස් කරන්න පුළුවන් වුනත් මහ ලොකු වෙනසක් කරන්න බෑ.

උදාහරණ විදියට කෙනෙක් යම්කිසි විදියකට පාවිච්චි කරපු ඇඳුමක් කොහෙන් හරි අරගෙන එනවා. ඒ ගෙනාපු එක හෝදල ඉරි යන්න මැද ගන්න පුළුවන්. නමුත් ඒක අලුත් ඇඳුමක් කරන්න බෑ. හැබැයි අර විදියට යම් කිසි මට්ටමකට ඔප මට්ටම් කරල පාවිච්චියට ගන්න පුළුවන්. එතකොට ඒ ඔප මට්ටම් කළේ තමන් ගෙනාපු එක. එයින් එහාට බරපතල වෙනසක් ඒකට කරන්න බෑ. තමන්ට අවශ්‍ය නම් නැවතත් ගිහින් වෙන ඇඳුමක් මිලදී ගන්න පුළුවන්. ඒක වෙනම පැත්තක්.

මේ වගේ අපි මේ භවයෙදි හදාපු අලුත් දෙයක් ගෙනියන්නෙ ඊළඟ භවයට. මේ භවයෙදි ගොඩ නගපු දෙයින් එන නිර්මාණය ගත්තට පස්සෙ ඒ නිර්මාණය භුක්ති විඳීම, හරියට අර ගෙනාපු ඇඳුම හෝදල මැදල පොඩ්ඩක් ඔප මට්ටම් කර ගන්නව වගේ. එච්චරයි ඒකට වැඩි දියුණු කිරීම් වශයෙන් කරන්න පුළුවන් වෙන්නෙ. එහෙම නැතුව රතු කමිසය නිල් කරන්න බෑ, සරමක් කමිසයක් කරන්න බෑ. අන්න ඒ වගේ දෙයක් තමයි මෙතනදිත් වෙන්නෙ. ඒ නිසා කෙනෙක් මොකුත් නොකර නිකම්ම ඉන්නව කිව්වොත් හරි යන්නෙ නෑ. ඒකාන්තයෙන්ම අපිට ලැබෙන ඵලය මේකනේ ! අපි මොකටද මහන්සි වෙන්නෙ කියල කිව්වට හරි යන්නෙ නෑ. සමහර විට අපි පෙර කරල තියෙන්න පුළුවන්, අද කරන ක්‍රියා කලාපය උපනිශ්‍රය කරගෙන ඒක වෙනස් වෙන දෙයක්. ඒකෙන් පොඩි පොඩි වෙනස්කම් වෙන්න පුළුවන්. හරියට අර ගෙනාපු කමිසය ඔප මට්ටම් කර ගෙන හදාගත්තොත් හොඳ ගමනක් යන්න පුළුවන් වගේ. නමුත් ඒක ගෙනාපු හැටියෙම ඕන නම් කිළිටි කර ගෙන ඉන්නත් පුළුවන්, ගමනට ගැලපෙන්නෙ නැති කරගන්නත් පුළුවන්. ඒ වගේ අපි එදිනෙදා හිතන, කියන, කරන දේවල් අපි පෙර හදාගත්තු දේ ඵල දෙන්න ප්‍රයෝජනවත් වෙනවා.

(ඉතිරි කොටස ලබන කලාපයෙන්)

*වහරක අභයරතනාලංකාර හිමිපාණන් විසින් දේශිත සැඟවුණ දහම් කරුණු ඇසුරින් සකස් කළේ :*

**නීතිඥ චන්දන සිරිවර්ධන**

# වාස්තු විද්‍යාවේ හේතු ඵල සම්බන්ධය දහම් ඇසින් ....

**2 වන කොටස**

ජ්‍යෝතිෂ විද්‍යාව, වාස්තු විද්‍යාව ආදී පැරණි විද්‍යාවන් ලෝකයට හඳුන්වා දුන්නෙ පෙර හිටපු සෘෂිවරු. සෘෂිවරු කියන්නෙ බුදු, පසේ බුදු, මහ රහත් ආදී පෙරුම් පුරන බෝධි සත්වයින් බව මීට පෙරත් සඳහන් කළා. නමුත් ඒ කාරණය දන්නෙ නැතිව, අද මේ කියන විද්‍යාවන් තුළින් මනුස්සයො ලෞකික වැඩ කටයුතු කරගන්න ගිහින් වැරදුනාම, ඒවා තිරස්චාන විද්‍යාවන් හැටියට බුදුන් වහන්සේ පෙන්වා දීල ඒවට නිග්‍රහ කළායි කියල සමහරු කියනවා. බුද්ධ දේශනාව වැරදියට අල්ල ගෙන ඒවාට පහර ගැහුවත් ඇත්ත කතාව ඒක නෙවෙයි. මේ තිරස්චාන කියන වචනය අද වෙන කොට වරද්දල තේරුම් අරගෙන තියෙන්නෙ අත්තනෝ මත නිසා. ඒ කියන්නෙ තමන්ගෙ පුද්ගලික මත හෙවත් අවිද්‍යා අඳුරෙන් ගොඩ නගා ගත්තු මත. වෙද හෙදකම්, යකැදුරු වැඩ, භූමි විද්‍යාව, ජ්‍යෝතිෂ විද්‍යාව, වාස්තු විද්‍යාව ආදී විද්‍යාවන් පිළිබඳ භික්ෂූන් වහන්සේලාට විනය පිටකයේ පෙන්වා තියෙන කාරණයක් තියෙනවා. හැබැයි මෙතනදි තිරස්චාන විද්‍යාව කියල කිව්වට, විද්‍යාව තිරස්චාන කියන කතාවක් නෙවෙයි මේ කියන්නෙ.

යම් කිසි දෙයක් තිරස්චාන විද්‍යාවට වැටෙනව නම්, බුදුන් වහන්සේ හැම තැනම සඳහන් කරල තියෙන කාරණයක් තමයි, **යම් කිසි භික්ෂූන් වහන්සේ නමක් සැදැහැවෙන් දුන් බොජුන් වළඳල, ඒ කියන්නෙ දායකයන් විසින් සැදැහැ සිතින් දෙන දානය වළඳල ජීවනෝපාය සඳහා මේ මේ දේවල් කරයි නම් ඒවා තිරස්චාන විද්‍යාවට වැටෙන බව.** හරි මග යන්නෙ නැතිව, හරි මගට හරස් කපන විද්‍යාව තමයි තිරස්චාන විද්‍යාව කියන්නෙ. තිරස් අතට යන වැඩ පිළිවෙල තමයි තිරිසන් කියන්නෙත්. භික්ෂූන් වහන්සේලාට තියෙන්නෙ පූර්වේනිවාසානුස්සති, චුතූපපාත, ආශ්‍රවක්ෂය ඥාන කියන ත්‍රිවිද්‍යාවන්. ඒ සඳහා යමෙක් හරස් කපනව නම් ඒක තිරස්චාන වෙනවා. එහෙම නැතුව විද්‍යාව තිරස්චාන වෙන්නෙ නෑ. තිරස්චාන විද්‍යාව කියල අමුතු විද්‍යාවක් නෑ. සියලු අකුසල් තිරස්චානයි. ආර්ය මාර්ගය ගත්තම ඒකට හරස් කපන්න ඒ විදියෙ විද්‍යාවක් ඇසුරු කරනව නම් ඒක තිරස්චාන වෙනවා. යම් කිසි විද්‍යාවක් ඇසුරු කරන්න ගත්තම හරි පාරෙ යන්න බැරිව හරස් අතට යනව නම්, හරි මාර්ගය වැහෙනව නම්, ඒකට බාධා එනව නම් ඒ සියල්ල තිරස්චානයි.



එතකොට සැදැහැවෙන් දුන් බොජුන් වළඳන්නෙ කවුද ? භික්ෂූන් වහන්සේලා. සැදැහැවෙන් දුන් බොජුන් වළඳල උන් වහන්සේලා නිවනට කරගන්න දේ කර ගන්න ඕන. උන් වහන්සේලා ජීවනෝපාය සඳහා මොනව කර ගන්නද ? සිවු පසය ලැබෙනව නම්, තමන්ට ජීවත් වෙන්න අහවල් එක කරන්න ඕන කියල දෙයක් භික්ෂුවට ඉතිරි වෙන්නෙ නෑ. හැබැයි මේ කාරණය දඩමීමා කරගෙන සමහර භික්ෂූන් වහන්සේලා හිතන්න හෝ කියන්න පුළුවන්, අපි අනුන් දෙන දානය වළඳන්නෙ නෑ, අපිම රස්සාවල් කර ගෙන හරි හම්බ කරගන්න ඒවායින් අපි දානෙ හදාගන්නෙ, ඒ නිසා සැදැහැවතුන් දෙන බොජුන් වළඳන අයටනෙ ඕක බලපාන්නෙ කියල. නමුත් ඒ කතාව භික්ෂූත්වයට ගලපන්න බෑ. මොකද භික්ෂූන් වහන්සේ නමක් සැදැහැවතුන් දෙන දානය වළඳනව මිසක් ජීවත් වෙන්න වෙන ක්‍රමයක් නෑ, රස්සාවක් කරනව නම් ඒක ශ්‍රමන පිළිවෙතට විරුද්ධයි. ඒ නිසා භික්ෂූන් වහන්සේ නමක් රස්සාවක් කරල හරි හම්බ කර ගෙන ඒකෙන් යැපෙනව නම් ඒක නියම සඟ පිළිවෙත නෙවෙයි. ඒ වගේ කෙනෙක් භික්ෂු කියන අර්ථයට ගලපන්න බෑ. මේ කාරණය විශේෂයෙන් තේරුම් ගන්න ඕන.

නමුත් අද මේ කාරණය ගිහි වතේ ඉඳන් හරි හම්බ කර ගෙන ජීවත් වෙන අය කරන ඒ වගේ වැඩ කටයුතුවලටත් සමහරු ආදේශ කරන්න උත්සාහ කරනවා. ඒත් බුදුන් වහන්සේ එහෙම දෙයක් පෙන්වා දුන්නෙ නෑ. ඉතින් භික්ෂූන් වහන්සේලා ඒ වගේ කටයුතු කරල හරි හම්බ කිරීම තිරස්චාන විද්‍යාවක් කිව්ව මිසක් ගිහියන්ට එහෙම කිව්වෙ නෑ. මොකද ගිහියන් සැදැහැවතුන් දෙන බොජුන් වළඳල නෙවෙයි ඒ කටයුතුවල නිරත වෙන්නෙ. ඒ නිසා සමහරු වැරදි ආකල්ප අර ගෙන, කොටසක් හංග ගෙන කොටසක් එළියට දාල ඒ කෑල්ල විතරක් අල්ල ගෙන පහර ගහනවා. තමන්ගෙ මතය ගොඩ නගන්න ඒ විදියට තමන්ට වාසි වෙන කොටස විතරක් අරගෙන විවේචනය කරනවා. ඒක හරියට ආඳ මාළුවගෙ උපමා කතාව වගේ. ආඳා, මාළු ළඟට ගිහින් ඔළුව හංග ගෙන වලිගය විතරක් පෙන්වල මාත් උඹල වගෙයි කියනවා. අනිත් සැරේ සර්පය ළඟට ගිහින් වලිගය හංගල ඔළුව පෙන්වල මාත් උඹල වගෙයි කියනවා.

ඒ වගේ අදත් තමන්ගෙ වාසියට තිරස්චාන විද්‍යාව කියල මතයක් හදාගත්තට පස්සෙ, ඒක ඔප්පු කරන්න බුද්ධ දේශනාව වැරදියට අල්ල ගෙන ජ්‍යෝතිෂය, වාස්තු විද්‍යාව වගේ පැරණි විද්‍යාවන්ට පහර ගහනවා. නමුත් පෙර හිටපු සෘෂිවරු මනුස්සයින්ට යහපතින් දිවි ගෙවන්න ප්‍රයෝජනවත් වෙන මේ වගේ විද්‍යාවන් ලෝකයාට හඳුන්වා දුන්නෙ ආවට ගියාට නෙවෙයි. ඒ අයගෙ දිවැසින් / ඥානයෙන් ඒවායේ ☞

තියෙන යම්කිසි හේතුඵල රටාවක් ලෞකික වූ පටිච්ච සමුප්පාදයෙන් දකල. මේ විද්‍යාවන් ඍෂිවරුන්ගෙ මිසක් බමුණන්ගෙ නෙවෙයි. බමුණන්ගෙ තියෙන්නෙ හදාගත්තු මත. ඒ නිසා බුදුන් වහන්සේ ඍෂිවරුන්ට හෝ ඍෂි භාෂිතයන්ට දොස් කියල නෑ. ඒවා ප්‍රයෝජනවත් බව පෙන්වා දීල අවශ්‍ය අයට ඒ ඒ විදියට කරගන්න කියලත් දේශනා කරල තියෙනවා. ලොව්තුරා බුදුන් වහන්සේ ලෝකයට හෙළිදරව් කළ පටිච්ච සමුප්පාදයෙන් කාලයක් යද්දි නෂ්ටාවශේෂ විදියට ඉතිරි වූ ලෞකික කොටස ඇසුරු කර ගෙන ඍෂිවරු පෙන්වා දීපු යහපත් කොටස් තමයි මේ ලෝකයේ පැරණි විද්‍යාවන් විදියට එන්නෙ. ඒ නිසා මේ හැම විද්‍යාවකටම ලෞකික පටිච්ච සමුප්පාදයක් වගේම ඊට අනුරූප වන ලෝකෝත්තර කුසල මූල පටිච්ච සමුප්පාදයකුත් තියෙනවා. ඒ කාරණය දහමින් පැහැදිලි කරන්න පුළුවන්.

මේ කියන විද්‍යාවන්ගෙන් වාස්තු විද්‍යාව ගත්තම, මේ කාලෙ වෙන කොට නිවාස ඉඩම් ආදියෙන් එන විවිධාකාර දෝස නිසා පැන නගින ප්‍රශ්නවලින් මනුස්සයො හෙම්බත් වෙලා ඉන්නෙ. ලෙඩ රෝග, නඩු හබ, ධන හානි, පවුල් ආරවුල්, විවිධ මානසික ව්‍යාකුලතා, අපල උපද්‍රව ආදී විවිධාකාර කරදර බාධක මේ හේතුවෙන් පැන නැගුණත්, අහවල් හේතුව නිසා ඒ ඒ දේවල් සිද්ධ වෙනවයි කියල දැන ගන්න ක්‍රමයක් නෑ. ඒකට ප්‍රධානම හේතුවක් තමයි ජ්‍යොතිෂ විද්‍යාව වගේම මේ වාස්තු විද්‍යාවත් මේ වෙන කොට ගුරුමුෂ්ටි තියාගෙන, ඒ වගේම විවිධාකාර මති මතාන්තරවලින් අවුල් සහගත තත්ත්වයට පත් වෙලා තිබීම.

ඒ නිසා සමහර වෙලාවට එක වාස්තු උපදේශකවරයෙක් පරීක්ෂා කරල බලල කියන උපදෙස් නෙවෙයි තවත් කෙනෙක් කියන්නෙ. ඉතින් මනුස්සයොත්, එන ප්‍රශ්නවලින් බේරෙන්න ඕන නිසා කීයක් හරි වියදම් කරල ඒ අයගෙ උපදෙස් අනුව තමන්ගෙ ගෙවල් දොරවල් කඩනවා, හදනවා, නොයෙක් වෙනස්කම් කරනවා. ඒ වගේම මේ වාස්තු විද්‍යාවෙ තියෙන හේතුඵල සම්බන්ධය හරියට පැහැදිලි නොකිරීමත් මනුස්සයින්ගෙ මේ නොදැනුවත්කමට හේතු වෙලා තියෙනවා. පටිච්ච සමුප්පාද දහමට අනුව හේතුඵල සම්බන්ධය එක්තරා මට්ටමකට හරි පැහැදිලි කරන්න පුළුවන් නම්, මනුස්සයින්ට ඒ සම්බන්ධයෙන් දැනුවත් වෙන්න අවස්ථාවක් ලැබෙනවා. එතකොට නිකං කවුරුවත් කිව්ව පළියටම පිළිනොගෙන, තමන්ගෙ ඥානයට වැටහෙන ප්‍රමාණයට ඒ කාරණාවල සත්‍ය අසත්‍යතාවය තේරුම් ගන්න පහසුවක් වෙනවා.

ඉතින් ඒ විදියට එදිනෙදා ජීවිතයෙදි නිවාස, ඉඩම් ආදිය සම්බන්ධයෙන් බලපාන යම් යම් කරුණු කාරණාවලදි එන වාස්තු විද්‍යාත්මක පැතිකඩ, යම් කිසි ආකාරයකට හේතුඵල දහමට අනුකූලව ගලපල, යම් කිසි දැනුවත් කිරීමක් තමයි මේ ලිපි පෙළින් කරන්නෙ. එතකොට හැම දේකටම අනුන් පසු පස නොයා තමන්ටත් එක්තරා ආකාරයකට ප්‍රයෝග සම්පත්ති යොදල ඒ දෝස මගහරව ගන්න අවස්ථාවක් ලැබෙනවා. ඒ විදියට කෙරෙන යම් කිසි ආකාරයක දැනුවත් කිරීමක් හැර, වාස්තු විද්‍යාව වගේ සංකීර්ණ ගැඹුරු විද්‍යාවක් ඉගැන්වීම මේ ලිපි පෙළේ අරමුණ නෙවෙයි. පසුගිය කලාප කිහිපයකින්ම සඳහන් කළෙත් සාමාන්‍ය කෙනෙකුට ගෝචර කර ගෙන තේරුම් ගන්න පුළුවන් ආකාරයේ විග්‍රහයන් පමණයි. විශේෂයෙන් වහරක අභයරතනාලංකාර හිමියන් ගිහි වතක ඉන්න කොට මේ සම්බන්ධයෙන් ලබපු අත්දැකීම්, ඒ සඳහා යොදා ගත්තු ප්‍රයෝග සම්පත්ති වගේම උන් වහන්සේ විසින් ඥාන ගෝචරව මතු කරන ලද කරුණු කාරණාවලින් තමයි මේ හෙළිදරව් කිරීම් කරන්නෙ.

මේ වාස්තු කියන වචනයෙත් යම්කිසි තේරුමක් තියෙනවා. වාත්තු කරනව කියන වචනයෙන් කියන්නෙ, යම් කිසි විදියකට වැය වෙච්ච දෙයක් නැවත සකස් කරනවා. මොනව හරි වැය වෙලා ගියා නම් ඒක තමයි වා කියන්නෙ. අස්තු කියන්නෙ අත් වූ දේ. එතකොට වැය වූ දේ නැවත සකස් කරල දෙන විද්‍යාව තමයි වාස්තු විද්‍යාව කියන්නෙ.

එතකොට කොහොමද ලෙඩ රෝග, ධන හානි, නඩු හබ, පවුල් ආරවුල් ආදියට මේ වාස්තු විද්‍යාව බලපාන්නෙ. ශරීරයට යම් කිසි රෝගයක් හට ගන්න නම් ඒ සඳහා බලපාන යම් කිසි විස කිරණ තියෙනවා. විශ්වයේ ඉඳන් විස කිරණ එන කොට ඒ කිරණ ස්නායුවල පටන් ගෙන ශරීරයේ ලේ ධාතුව, මාංශ ධාතුව ආදී හැම තැනම විහිදිලා යාම නිසා ශරීරයේ විවිධ ස්ථානවල අපද්‍රව්‍ය එකතු වෙන්න පටන් ගන්නවා. ඒවායින් ශරීරයේ පිච්චීමක්, දැවීමක් ඇති කරනවා. ජානවල විකෘති ඇති කරනවා. එතකොට ඒක විශේෂයෙන් මොළයටත් බලපානවා. ඒ නිසා මනස ක්‍රියාත්මක වෙන්නෙත් විකෘති විදියට. බලපෑවෙ යම් විදියකටද ඊට අදාලව තමයි ඵලය ලැබෙන්නෙත්.

දැන් එතකොට අපි ඉන්න මේ භෞතික ලෝකයත් එක්ක අපට නොපෙනෙන කිරණ ලෝකයක් තියෙනවා. **අපි කරන කියන කටයුතුවල ප්‍රතිඵල හරියට ග්‍රහණය කර ගන්න හදා ගත්තු භෞතික වස්තුව තමයි ගෘහය කියන්නෙ. ඒ වගේම ගෑවෙන අය දරන නිසා තමයි ගෙදර කියන්නෙ. ඒ කියන්නෙ තමන් ළඟින් ඇසුරු කරන අය, තමන්ගෙ බඩු මුට්ටු ආදී වත්කම් ඔක්කොම ගෑවී ගෑවී දරාගෙන ඉන්න තැන.** නමුත් ඉස්සර නම් ගැරහිය යුත්තන් ඉන්න නිසා ගෘහය / ගෙදර කියල කිව්වා. ඒ කියන්නෙ ආදි බ්‍රහ්ම කල්පික මිනිස්සු ඒ විදියට ළං වෙලා එකට ගෑවී ගෑවී ඉඳීම ගැරහිය යුතු දෙයක් විදියට තමයි සැලකුවෙ. වෙනම වෙන් වෙලා හුදෙකලාව වාසය කිරීමට තමයි බ්‍රහ්ම කල්පික මිනිස්සු ප්‍රිය කළේ.

ඊළඟට නිවස කියල කියන්නෙ නිදහස්ව වාසය කරන්න හදා ගත්තු තැන. බාහිරට ගමන් බිමන් යන කොට හොඳට ඇඳල පැළඳල හැඩ වැඩ වෙලා, වෙස් අර ගෙන තමයි යන්න වෙන්නෙ. නමුත් ඒක නිදහසට බාධාවක්. හැබැයි නිවස තුළ ඉන්න කොට මොනව හරි සැහැල්ලු විදියට ඇඳල වෙසක් නැතිව නිදහස්ව වාසය කරන්න පුළුවන්. ඒ විදියට වෙසකින් නික්මිලා වාසය කරන තැන තමයි නිවස කියන්නෙ. මේ නිවස කියන වචනය අද සාමාන්‍ය අය වාසය කරන ගෙදර / ගෘහය හඳුන්වන්න භාවිතා කළත්, ඇත්ත වශයෙන්ම උපාසක උපාසිකා පිරිස් වෙසකින් නික්මිලා නිදහස්ව වාසය කරන්න හදා ගත්තු තැන තමයි නිවස කියන්නෙ. ඒ අය සාමාන්‍ය පෘතජ්ජන අය වගේ ග්‍රහණය කර ගෙන නෑ. ඒ නිසා නිවස සහ ගෙදර / ගෘහය අතර වෙනසක් තියෙනවා. නමුත් ලෝක සම්මත ව්‍යවහාරයේ අද පොදුවේ නිවස කියල භාවිතා කරනවා.

මේ විදියට ගෘහය, ගෙදර කියන මේ නම්වලින් කියවෙන තමන් ග්‍රහණය කරගත්තු, අල්ල ගත්තු දේවල් වගේම නිදහස්ව වාසය කරන්න හදාගත්තු නිවසත් ඵල දෙන ස්වභාවයක් තියෙනවා. හැබැයි ඒක ඵල දීම හරියට ග්‍රහණය කර ගන්න නම් කිරණ ලෝකයෙන් එන හොඳ කිරණ ඇදල ගන්නත්, විස කිරණ පළවා හරින්නත් ඊට ගැළපෙන විදියට ගෘහය හෝ නිවස තියෙන්න ඕන. මොකද නිතරම වාසය කරන ස්ථානය හරහා තමයි ඒ කිරණ ලෝකය මනුස්සයින්ට ක්‍රියාත්මක වෙන්නෙ. ඒ නිසා යම් කිසි ගෘහයක් / නිවසක් කිරණ ලෝකයට නොගැලපෙන විදියට හදල තියෙනව නම් එතැන අසමතුලිතතාවයක් ඇති වෙනවා.


උදාහරණ විදියට ගෙදර

මුදුන් යට ලීයෙ දෝසයක් තිබුණොත් ඒක බලපාන්නෙ හිසට. අඩිතාලමේ දෝසයක් නම් ඒක බලපාන්නෙ පයට. බිත්තිය බලපාන්නෙ බඳට. ප්‍රධාන උළුවස්ස සම්බන්ධ වෙන්නෙ මුඛයට. ගෙදර පිටිපස්සෙ දොර බලපාන්නෙ මනුස්සයගෙ අධෝ මාර්ගයට. ගේ ඉස්සරහ උළුවස්ස උඩින් දෙපැත්තට තියෙන කැලි දෙකට (උඩැලිපතේ දෙකොණ) කියන්නෙ කන් දෙක කියල. ඒ දෙපැත්ත තමයි මනුස්සයගෙ කන් දෙකට බලපාන්නෙ. ජනේලයක හෝ දොරක උළුවස්සක උඩ දෙපැත්තට වෙන්න අඟල් 2 - 3 ක කැලි 2 ක් ඉතිරි කරනවා. ඒ හැම එකක්ම කන් දෙක හා සම්බන්ධයි. ජනේලයක හෝ දොරක උළුවස්ස මුඛයට සම්බන්ධ ක්‍රියාවලියට බලපානවා. ඒ නිසා මනුස්සයින්ගෙ මුඛයට උළුවස්ස සහ කනට ඒවායේ උඩ දෙපැත්ත (උඩැලිපත) බලපානවා. මේ කන් දෙක නැතිව හදන උළුවහුවලින් ඒ ගෙදර වාසය කරන අයගෙ කන් ආශ්‍රිතව දෝස එනවා. එතකොට හරියට කන් නැති මිනිස්සු වගේ. ඒ වගේම උළුවස්සෙ උඩ දෙපැත්තෙ කන් දෙකට ඇතුලින් මූට්ටු දෙකට සුදුසු ඇණ දෙකක් ගහනවා. ඒ තමයි ඇස් දෙක. කන් දෙකට මැදි වෙලා තියෙන ඇස් දෙක හරියට මනුස්සයෙක් වගේ. නමුත් උළුවස්සකට ඒ ක්‍රමය හොඳ නෑ කියල වෙනස් කරල අද කාලෙ ඒ මූට්ටුවට උඩින් සමහරු ලොකු කුඤ්ඤයක් ගහනවා. එතකොට ඒකෙන් එන දෝසය නිසා ඇස් දෙකට බාධා එනවා. නමුත් ඒ කාරණය දන්නෙ නෑ. ඒ නිසා ඒ ඇණවල ප්‍රමාණය ඕනවට වඩා ලොකු පුංචි කරන්නෙ නැතිව උළුවස්සට ගැලපෙන ප්‍රමාණයෙන් ගන්න ඕන. ඒ වගේම උළුවස්සක පළල වගේ දෙගුණයක් තමයි උස ගන්න ඕන.

මෙන්න මේ විදියට වාසය කරන ගෙදරත්, වාස්තු විද්‍යාවෙදි හරියට අපේ ශරීරය හා සමානව ක්‍රියාත්මක වෙන්නෙ. ගේ ඉදිරිපස ඉඳන් බලන කොට හරියට මනුස්සයෙක් හිට ගෙන ඉන්නව වගේ තමයි ඒ ඒ අංග ඊට සමානව වැඩ කරන්නෙ. එහෙම ඉන්න කොට කකුල් දෙක තමයි ගෙයි අඩිතාලම කියන්නෙ. වහලය තමයි ඔළුව. ගෙයි දකුණු පැත්ත දකුණු අත. වම් පැත්ත වම් අත. ඉස්සරහ පැත්ත ශරීරයේ ඉදිරිපස. ගේ පිටුපස ශරීරයේ පිටුපසට සමානයි. මේ වගේ, ගෙදරකට තියෙන්නෙත් මනුස්සයෙක්ගෙ ස්වභාවයක්. ඒ නිසා වාස්තු විද්‍යාව මිනිහෙක් හා සමානව තමයි පෙන්වන්නෙ.

වාස්තු මිනිසා කියල කියන්නෙත් ඒකයි. ඔළුව, අතපය, බඳ ආදී වශයෙන් කැලි වෙන් කරල ගෙවල් හදන ක්‍රමයකුත් තියෙනවා. ඒක වෙනම ක්‍රමයක්. ගෙදරයි, මනුස්සයයි කිව්වම, දෙකටම එක හා සමාන අන්‍යෝන්‍ය සම්බන්ධයක් තමයි තියෙන්නෙ. ඒ නිසා යම් කිසි ගෙයක් වාස්තු විද්‍යානුකූලව හදල නැත්නම් ඒ ඒ දෝස එනකොට, මේ කිව්ව ක්‍රමයට ගෙදර ඒ ඒ තැන්වල වෙනස්කම් ඇති වෙන කොට, ඒ ගෙදර ජීවත් වෙන මනුස්සයින්ගෙ ශරීරයෙත් ඊට අනුරූප ස්ථානවලටමයි බලපාන්නෙ.

මේ සම්බන්ධයෙන් වහරක අභයරතනාලංකාර හිමියන් ගිහි වතක ඉන්න කොට ලබපු අත්දැකීමක් උන් වහන්සේ මේ විදියට එළිදරව් කළා. ''මේක




මම දැනුවත්ව වෙච්ච සිද්ධියක්. මම දන්න කියන හිතවත් මහත්තයෙක්ගෙ නෝන, කාලයක් තිස්සෙ ඒ ගෙදර හිටියෙ නිකං ඔල්මාදෙන් වගේ. මනස ක්‍රියාත්මක වුනේ හැම තිස්සෙම බිය මුසුව. ඒ නිසා නිකං ගෙදර හිටියත් අහුමුලුවල හැංගෙනවා. ඉතින් මේ මානසික ව්‍යාකූලත්වය නිසා හටගත්තු රෝගවලට ඒ නෝන වෙනුවෙන් මහත්තය බෙත් කොච්චර නම් අරගෙන දීල තිබුනද කියනව නම්, අඩි 1 1/2 ක් විතර උසට කම්බි කූරක ගහල ඒ ගත්තු බෙත්වල තුණ්ඩු තිබුණා. ඒත් අසනීප තත්වය හොඳ වෙලා නෑ. මේ සිද්ධිය බලන්න මමත් දවසක් ඒ ගෙදරට ගියා. ඒක පල 4 ක පැරණි ගෙයක්. බලන කොට අඩි 3 - 4 ක පුංචි මුදුන් යට ලීයක් තමයි තිබුණෙ. ඒක තමයි දෝසය. වාස්තු විද්‍යානුකූලව මුදුන් යට ලීය ගෙහිමියාගෙ උසට වඩා දිගින් වැඩි වෙන්න ඕන. ඊට වඩා අඩු වුනොත් ඒ පුද්ගලයගෙ මනසට ඒක බලපානවා. මේ කියන නෝනගෙ නමට තමයි ඒ ඉඩමයි ගෙදරයි දෙකම තිබුණෙ. ඒ නිසා ඒක කෙලින්ම ඒ පුද්ගලයට බලපානවා. ස්වාමි පුරුෂයටත් එහෙමයි. කරන කියන එක වැඩක්වත් ඔළුවක් ඇතිව කරන්න බෑ. කිසිම දෙයක් නියම විදියට පාලනය කරන්න බෑ. පිස්සුත් නැති පිස්සුවක් තමයි ඒ නෝනට තිබුණෙ. ගෙදරට කවුරු හරි ආවොත් දුවල ගිහින් හැංගෙනවා.

දවසක් අපි යන කොට පැනල දිව්වා. බලන කොට ගිහින් හැංගිලා. මහත්තය කිව්ව අන්න කුස්සියට ගිහින් හැංගිලා ඉන්නව කියල. බලන කොට දොර මුල්ලෙ. හරියට පුංචි ළමයි හැංගි මුත්තම් සෙල්ලම් කරනව වගේ. අපි ඇවිත් කතා කරන කොටම පැනල දිව්වා. ඊළඟට කුස්සියෙ පුටුවක් අස්සෙ ඔළුව ගහගෙන ඇස් දෙක පියාගෙන කුදු ගැහිල හෙල්ලෙන්නෙ නැතුව ඉන්නවා. පස්සෙ ඒ මහත්තය ගිහින් කතා කළාම තවත් ටිකක් ඇතුලට රිංග ගත්තා. මේ විදියට මහ පුදුමාකාර මානසිකත්වයක් තිබුණෙ. ඉතින් මම කිව්වා, අර වහලෙ තියෙන මුදුන් යට ලීයෙ දෝසය ඉක්මනින් හදන්න කියල. ඒ පාර වහල ගලවල මුදුන් යට ලීය වෙනස් කරල හැදුවා. බෙත් මුකුත් දුන්නෙ නෑ ලෙඩේ එතනින්ම ඉවරයි. ඊට පස්සෙ ඒ තිබිච්ච ප්‍රශ්න මුකුත් ආවෙ නෑ.''

**ඒ කියන්නෙ වහලක මුදුන් ලීය කෙලින්ම හිසට බලපානවා. හිස් මුදුන කල්පනාවට සම්බන්ධයි. මුදුන් යට ලීය කොට වීම, කෙනෙක්ගෙ කල්පනාව කොට වෙන්නත් බලපානවා. මුදුන් යට ලීය හරියට මොළයට සම්බන්ධයි. මොකද මුදුනට තමයි කිරණ ශක්තිය ඇදල ගන්නෙ. ඕනම දෙයක මුදුනට අදින විශේෂ කිරණ ශක්ති තියෙනවා. මුදුන් යට ලීයත් ඒ වගේ තැනක්. ඒ නිසා මුදුන් යට ලීය ඕනවට වඩා කොට වුනොත් ඒ කිරණ ශක්තිය අදින්න ඉඩ මදි වෙනවා. එතකොට ඒ ගෙදරට එන කිරණ ශක්තියේ අඩුවක් වෙලා නිවැසියන්ගෙ මනසටත් ඒක බලපානවා.**

මුදුන් යට ලීයෙ හරි මැද කියන්නෙ මොළයෙ හරි මැද. ඒ කියන්නෙ මනුස්සයගෙ කල්පනා ශක්තියේ සහ ජීව ශක්තියේ අග්‍රස්ථානය. ඒ හරි මැද අල්ලල බැරි වෙලා හරි පරාල දෙකක් ගැහුවොත් හිර වෙනවා. මූට්ටුවක් දැම්මොත් හිරවෙනවා. මූට්ටුවේ හරහට පසාරු වෙන්න ඇණයක් ගැහුවොත් මරණය හෝ සිහි නැතිවීම කියන තත්ත්වයකට පත් වෙන්න හේතු යෙදෙනවා. ඒ

තරම් ලොකු බලපෑමක් වෙන්නෙ. එහෙම වෙච්ච අවස්ථා ඕන තරම් තියෙනවා. හතුරුකම් කරන සමහර පැරණි බාස්ලා සමහර අවස්ථාවල පඩි දුන්නෙ නැති වුනාම මේ වගේ නොසන්ඩාල වැඩ කරනවා. ඒ අය සද්ද නැතිව ඉඳල ගෙහිමියාගෙ කටහඬ අල්ලල ඒ හරි මැද ස්ථානයට තියල පසාරු වෙන්න එකපාරටම ඇණයක් ගහනවා. ඊට පස්සෙ වැඩිකල් නොගිහින් ඒ ගෙදර ප්‍රශ්න ඇතිවෙනවා. ඒ නිසා යම් කිසි මුට්ටුවක් යෙදිල ඇණ ගහන්න ඕන වුනොත්, හරි මැද පන්නල වෙන තැනකින් ගැහුවට ගැටළුවක් නෑ. මේ වගේ පළිගැනීමක් නොවුනත්, වැරදීමකින් වෙච්ච ඒ හා සමාන සිදුවීමක් සම්බන්ධයෙන් අභයරතනාලංකාර හිමියන් ගිහි වතක ඉන්නකොට ලබපු තවත් අත්දැකීමක් තමයි මේ.

''කලගෙඩිහේන ප්‍රදේශයේ ඒ දවස්වල මම නැවතිලා ඉන්නකොට ගෙවල්වල දොස් අරින්න ඔය කට්ටල් දානව කියන පැරණි ගුප්ත ක්‍රමයක් එක්තරා විදියට සිද්ධ කළා. ඒ පැත්තෙ තිබ්ච්ච ගෙදරක සාමාන්‍ය මට්ටමේ කරදර දෝස තිබුණා. ඒ දොස් අරින්න මුදුන් ලීය මැද රන් ආලේපිත තහඩුවක් සම්බන්ධ කරන්න ඕන. රිදී සමග රත්රන් මිශ්‍ර කරල ගත්තමත් ඒක හරියනවා. ඒ තහඩුව හරියට මුදුන් ලීය උඩ මැදින් තියන්න ඕන. ඒ දෝසය අරින එක ක්‍රමයක් තමයි මේ. මෙතනදි ස්වර්ණ (රත්රන්)වල විශේෂ ගුණයක් තියෙනවා. ස්ව කියන්නෙ තමන්. රණ කියන්නෙ සටන. අරණ කියන්නෙ සටනක් නෑ. එතකොට ස්වර්ණ කියන්නෙ තමන් තුළ සටනක් නෑ, කම්පනයක් නෑ, සමාධියක් තියෙනවයි කියන එක. ඒ නිසා ස්වර්ණ ගත්තම කම්පා නොවන විශේෂ ශක්තියක් ලැබෙනවා. ඒ වගේම රිදීවලින් සෑද්ධිමය ගුණය ඇති කරනවා. මෙන්න මේ ශක්තිය ස්වභාවිකව ඇදෙන්නෙ නැති නිසා බාහිරින් ඇදල ගන්න රත්රන් රිදී කියන මේ දෙක උපකාර වෙනවා. උදාහරණ විදියට යම්කිසි ගුවන් විදුලි යන්ත්‍රයකට බාහිර තරංග, ස්වභාවයෙන්ම ඇදෙන්න බලය මදි නිසා ඒ සඳහා කන්ඩෙන්සර්, ඇහැසි ආදී විවිධ උපාංග සවි කරනවා. එතකොට ඒ තරංග වේගයෙන් ඇදල ඇවිත් යන්ත්‍රය හොඳින් ක්‍රියාත්මක වෙනවා. ඒ වගේ ඒ රන් රදී තහඩුවෙන් විශ්වයේ තියෙන බාහිර ශක්තිය ඇදල අරගෙන මුදුන් යට ලීය හරහා ගෙදරට ලබා දෙනවා. ඒ ශක්තිය හැම කෙනෙක්ගෙම යහපතට අවශ්‍යයි.

ඉතින් මේ ගෙදර ඒ තහඩුව තියන්න ඔක්කොම කටයුතු ලෑස්ති කරල, මාත් එක්ක ඒ කාලෙ වැඩ කරපු තවත් පිරිසකට ඒ කටයුත්ත භාර දීල මම ඒ ළඟ තිබ්ච්ච තවත් ගෙදරකට ගියා. ටික වෙලාවකින් ඒ ගෙදර හිටපු අම්ම දුවගෙන අඬාගෙන ආවා. අනේ මහත්තයෝ මොකක් වුනාද දන්නෙ නෑ, මේ ළමයි දෙන්න මරා ගන්න හදනවා, කවදාවත් මෙහෙම දෙයක් වෙලා නෑ, මූණට මූණ දැක්ක ගමන් දෙන්නම ඇණ ගන්නවා, ගහ මරාගන්න හදනවා කියල මෙහෙම ආදෝනාවක් නගන්න ගත්තා. පස්සෙ මම හොයල බැලුවා. මම ආවට පස්සෙ වෙනස් වෙනව නම් වෙනස් වෙන්න තියෙන්නෙ එක අවස්ථාවයි. ඒ තමයි අර තහඩුව. ඉතින් මම ඇහුව අපේ පිරිසගෙන්, අර තහඩුව වෙනස් කළාද කොහොමද ගැහුවෙ කියල. බලනකොට මම කියපු ක්‍රමය වෙනස් කරල තමයි ගහල තිබුණෙ. ඒ කියන්නෙ තහඩුව දෙපැත්ත ගන්න දිග මදි නිසා, මේ අය ඒ තහඩුව තියල මදි ටිකට හරක් හමක් තියල ඇණ ගහල. ඉතින් මම එවෙලෙම කිව්වා දැන්ම ගිහින් ගලවන්න කියල. තහඩුව මැදට හරක් හමක් ගැහුවම මීහරක් වගේ ඇණ ගන්න එක පුදුමයක් යැ ! ඒක ගලවල අලුත් තහඩුවක් දැම්ම විතරයි අර ළමයි දෙන්න හිනාවෙලා අත්වැල් අල්ලගෙන කරට අත දාගත්තා. ඒ විදියටම ක්ෂණික වෙනස් වීමක් තමයි මෙතන ක්‍රියාත්මක වුනේ. ඒක මහ පුදුම දෙයක්. හොඳ අත්දැකීමක්. මේ ගෙදර හොඳට හිටපු සහෝදරයො දෙන්නා. ඒ අයටත් හිතාගන්න බෑ වෙච්ච දේ. අර වෙනස්වීම ඇරිය විතරයි ඒ දෝසයත් නැතිව ගියා. නමුත් අද ඉන්න අය මෙහෙම දේවල් වෙනව කියල දන්නෙ නෑ.

හරකෙක් කියන්නෙ කිසිම විදියකින් මොළේ මෙහෙයවල වැඩ කරන්න පුළුවන් සතෙක් නෙවෙයි. මිනිස්සුත් ඒ වගේ වැඩ කරන කොට, හරක් වැඩ කරනවයි කියන්නෙත් ඒකයි. හරකෙක්ගෙ ගති ලක්ෂණය තමයි ඇණගෙන මරා ගන්න දඟලීම. හරක් හමක්, රන් රිදී තහඩුවට උඩින් සම්බන්ධ කළාම ඒ තහඩුවේ ශක්තිය අභිබවා හරකට අදාල ගති ලක්ෂණයට හිමි ශක්තිය උඩට එනවා. හරක් හම තහඩුවට යටින් තිබුන නම් ඒ තරම් ප්‍රශ්නයක් නෑ. ඒ නැතත් හරක් හමක් කොහොමත් ඒ වගේ තැනකට ගැලපෙන්නෙ නෑ. තහඩුවට උඩින් තියපු නිසා ඒක අභිබවා ගිහින් හරකට අදාල කිරණ ශක්තිය තමයි ඇදිල ඇවිත් ළමයින්ට බලපෑවෙ. මේ සඳහා උපමා කතාවක් තියෙනවා. දුර්වල වෙලා ඉන්න හරකෙක් හරක් ගාලක දොරටුව ළඟ ඉන්න කොට, දොරටුව ඇරියම කොච්චර දුර්වල වුනත් ඌ තමයි ඉස්සෙල්ලම එළියට එන්නෙ. හයි හත්තිය තියෙන අනිත් එවුන් දුව ගෙන එන කොට දොරටුව ළඟ හිටපු සතා කොච්චර දුර්වල වුනත් ඌ එළියට පැනල ඉවරයි. ඒ වගේ හරක් හම, රන් රිදීවලට වඩා බල අඩු වුනත්, රන් රිදී තහඩුව උඩින් තිබ්බොත් ඒකෙ බලය පළවෙනි වෙලා හරක් හමට අදාල ශක්තිය තමයි ඉස්සෙල්ලම ඇදල එන්නෙ. එතකොට හරකගෙ ගති ලක්ෂණය ඒ ගෙදර අයටත් බලපානවා. එහෙම දෙයක් තමයි මෙතනදිත් සිද්ධ වුණේ.''

මේ චතුජ කය කියන ශරීරය කර්ම, චිත්ත, ඍතු, ආහාරජ කියන ඒවායින් තමයි හැදිල තියෙන්නෙ. මේවායින් කර්ම, චිත්ත දෙකෙන් හට ගත්තොත් සියුම් කිරණ ත්‍රිජ කාය කියන අවස්ථාවට අහු වෙන්නෙ. ශරීරයේ සූක්ෂම මනෝ කාය (ඇස්ට්‍රල් බොඩි) අහුවෙන්නෙත් ත්‍රිජ කායට. සියුම් චතුජ කයත් ඒකෙ තිබුණට මූලිකම සියුම් කොටස අහුවෙන්නෙ ත්‍රිජ කායට. ඒ සියුම් කොටස් හැදිල තියෙන්නෙ කිරණවලින්. ඒ කිරණවලින් මනුස්ස-යෙක්ගෙ රූපය හැදෙන්න කිරණ විහිදවෙන්න ඕන. කිරණ විවිධත්වයක් තිබුණොත් තමයි ඒක වෙන්නෙ. හරියට එකම පාටකින් මනුස්සයෙක්ගෙ රූපය ඇන්දොත් ඒ මනුස්සයගෙ ලාංඡනය වැටෙනව මිසක් නියම මනුස්සයගෙ හැඩයක් ගන්න බෑ වගේ. ඒ නිසා වර්ණ කරන්න ඕන. මේ වගේ, මනුස්සයින්ගෙ ස්වභාවය යම්කිසි තැනකදි කිරණවලින් පෙන්වන්න ඕන නම් විවිධ කිරණ වර්ග ඕන. එතකොට ඇසට බලපාන කිරණ වර්ග වෙනයි, ඇහේ කළු ඉංගිරියාවට බලපාන කිරණ වර්ග වෙනයි, සුදු ඉංගිරියාවට බලපාන කිරණ වෙනයි.

මනුස්සයින්ගෙ සූක්ෂම මනෝ කායෙත් ඊට අනුරූප හැම තැනක්ම හැදිල තියෙන්නෙ විවිධ කිරණ වර්ගවලින්. එක ජාතියක කිරණ ඒ ජාතියේ කිරණවලට සම්බන්ධයි. පටිච්ච කියන්නෙත් ඒකයි. ඒ කියන්නෙ හැම එකක්ම පටිච්ච වෙන්නෙ නෑ. ඇහේ කිරණ කනේ කිරණවලට පටිච්ච වෙන්නෙ නෑ. කනේ කිරණ නාහෙ කිරණවලට පටිච්ච වෙන්න නෑ. පටිච්ච කියන්නෙ එකට ගැලපිලා බැඳෙනවා කියන එක. ඒ ගැලපිලා බැඳීම එක හා සමානව එන්නෙ නෑ. යම්කිසි තැනක සමාන එකට සමාන එකක් ආවොත් තමයි ඒක වෙන්නෙ. හැබැයි එකක් ගත්තම ඒකෙත් කොටස් දෙකක් තියෙනවා. එකක් සම කරපු එක. අනික විසම කරපු එක. යම්කිසි වැඩක් කරනකොට ඒක හොඳට කරන්නත් පුළුවන්, නරකට කරන්නත් පුළුවන්. යම් කෙනෙකුට පිනක් වෙන්නත්, පවක් වෙන්නත් වැඩක් කරන්න පුළුවන්. හරියට එකම ජාතියක ඇතුල් පැත්තයි පිට පැත්තයි වගේ. ඒකෙත් හොඳ නරක දෙකක් තියෙනවා. ඒ වගේ යහපත්

පැත්තකුත් අයහපත් පැත්තකුත් තියෙනවා. හරියට දූලි පිහියක් වගේ. දූලි පිහිය හරියට පාවිච්චි කළොත් රැවුල් හිසකෙස් කපා ගන්න පුළුවන්. වැරදියට පාවිච්චි කළොත් විනාසයක් වෙන්න පුළුවන්. මේ හැදිල තියෙන හැම දේකම එහෙම ස්වභාවයක් තියෙනවා. මෙන්න මේ ක්‍රමය නිසා අපි යමක් හදන කොට / කරන කොට හොඳ පැත්තට ගත්තොත් ඒක ප්‍රයෝග සම්පත්තියෙන් තමයි ගන්න ඕන. නැත්නම් පෙර කරපු පාප කර්මයක් අහු වුනොත් එහෙම, ඒකෙන් මෙහෙය වෙන්න බලනවා. ඒ නිසා තමයි කල්‍යාණ මිත්‍ර සම්පත්තිය පළවෙනි වෙනවයි කියන්නෙ. ඒ කියන්නෙ ප්‍රයෝග සම්පත්තියක් වුනත් තනියෙන් ගන්න බෑ. ඒකට කල්‍යාණ මිත්‍ර සම්පත්තිය මූලික වෙන්න ඕන. එතනින් තමයි යමක් කියල දෙන්නෙ. ඊට අනුව වැඩ කළොත් ප්‍රයෝග සම්පත්තියේ පිහිටන්න පුළුවන්. එතකොට අර විසම බව එන්නෙ නෑ.

උදාහරණයක් විදියට කෙනෙකුට සතුරෙක් කරදර කරන කොට, ඒකෙන් බේරෙන්න ඒ පුද්ගලයට උපක්‍රම කිහිපයක් තියෙනවා. සතුරගෙ සතුරුකම නැති කරන්න ක්‍රමයක් යොදන්න පුළුවන්. එහෙම නැත්නම් සතුරව පන්නා දමන්න ඕන. ඒ සඳහා යම්කිසි බලයක් තියෙන්න ඕන. එහෙම නැත්නම් සතුරා මිතුරු කරගන්න ඕන. එහෙමත් නැත්නම් සතුරට එන්න තියෙන ඉඩ ප්‍රස්තාව නැති කරන්න ඕන. මේ එකක්වත් නොකළොත් සතුරගෙන් කරදර එනවා. මෙන්න මේ විදියට සතුරො ඉන්නව වගේ තමයි, වැරදි ආකාරයට හදපු ගෙයක් කියන්නෙ. ඒ වැරදි ක්‍රමය මග හැරල ගේ හැදුවොත්, සතුරට තියෙන ස්ථානය නැති කළා වෙනවා. එහෙම නැත්නම් සතුරගෙන් බේරෙන්න බලවත් මුරකාරයෙක් දාන්න පුළුවන්. එතකොටත් සතුරා දෙවෙනි වෙනවා. නමුත් කරදර එන්න තියෙන හේතුව තවම තියෙනවා. හැබැයි අර බලය නිසා එන්න විදියක් නෑ. කට්ටල් දානව කියන්නෙත් මෙන්න මේ වගේ ක්‍රමයක්. එතනදි බලවත් එකක් දාල අර විස කිරණ පලවා හරිනවා. එතකොට ගෙයක් කඩල නැවත හැදීමක් අවශ්‍ය වෙන්නෙ නෑ.

තවත් උදාහරණයකින් පැහැදිලි කරනව නම්, රටක ජනාධිපතිට ආරක්ෂාව අවශ්‍යයි. එතනදිත් ක්‍රම දෙකක් තියෙනවා. ජනාධිපති වෙලා ඉන්නකල් විරුද්ධවාදියො මරන්න බලාගෙන ඉන්න පුළුවන්. ඒ නිසා පොලිසියෙන් හමුදාවෙන් ආරක්ෂාව දෙනවා. ඒ ආරක්ෂාව නිසා බේරිලා ඉන්නවා. ඒක නැත්නම් සතුරු කරදර එන්න පුළුවන්. අනෙක තමයි ජනාධිපති ධූරයෙන් ඉවත් වීම. එතකොටත් අර වගේ ආරක්ෂාවක් ඕන නෑ. ඒකෙනුත් බේරුමක් තියෙනවා. මෙන්න මේ වගේ දෙයක් තමයි ගෙයක් හදනකොටත් සිද්ධ වෙන්නෙ. හැබැයි ගේ හැදුවට පස්සෙ දෝස ආවොත් ඒක කඩල දාල නිකන් ඉන්න බෑ. ඉන්න හිටින්න ඒ ගේ අත්‍යවශ්‍යයි. ඒ නිසා ඒක පවතින්නත් ඕන. හදපු ගෙයක් කඩල අලුතින් හදනවයි කියන්නෙ ලක්ෂ ගණන් වියදම් යන වැඩක්. ගෙදර තියෙන සියලු දෝස ඉවත් කරන්න ගේ කඩල අලුතින් හදන්න ගියොත් කොච්චර නම් වියදම් යනවද ? ඒක මහ කරදරයක්. මේ වගේ අවස්ථාවකදි කට්ටල් දැමීම කියන්නෙ අර මුර භටයො දැම්ම වගේ එක ක්‍රමයක්. ඒ දෝස ඒකෙන් අරින්න පුළුවන්. ඒ සඳහා දෝස එන තැන් බලාගන්න ක්‍රමයක් දැන ගන්න ඕන. එහෙම දැනගෙන ඒ දෝසය වැහුවම එතනින් විස කිරණ ඇදෙන්න විදියක් නැති නිසා ශරීරයට වදින්නෙත් නෑ.

ඊළඟට ධන හානියටත් මේ වාස්තු



දෝස බලපානවා. ධන හානි කිව්වම ඒකටත් විවිධ පැති බලපානවා. උදාහරණ විදියට ගෙදරට ලැබෙන මුදල් නිකරුණේ වැය වෙන්න හේතු යෙදෙනවා. එක්කො ඒ පුද්ගලයගෙ මානසිකත්වය තුළ ඒ මුදල් තියා ගන්න හිතෙන්නෙ නෑ. ඒ විදියට මනස හැඩ ගැහෙනවා. ඒ අර කිරණ වැදීම නිසා තමයි එහෙම වෙනසක් එන්නෙ. ස්නායු පද්ධතියට ඒක බලපානවා. ඒ වගේම සමහර අයට, මට ඕන නෑ මේ මුදල් කියල එහෙම අදහස් එනවා. එහෙම නැත්නම් නිෂ්ඵල දේවල්වලට වියදම් කරන්න පුද්ගලයට විවිධ අදහස් එනවා. එතකොට වියදම් කරන්න හිතෙන්නෙ වැනසෙන දේවල්වලට. මෙතනදි පැහැදිලිව තියෙන ක්‍රමවේදයක් තමයි පුද්ගලයගෙ කර්ම ශක්තියයි, අර බාහිර දෝසයි සියල්ල එකතු වෙලා තමයි ඒ වගේ අදහස් එන්නෙ. ඒ නිසා වෙලාවකට ඒ වගේ අදහස් එන්න පටන් ගන්නවා. වැඩක් නැති දේකට වියදම් කරන්න, කිසිම අරපිරිමැස්මක් සැලැස්මක් නැතිව වියදම් කරන්න අදහස් එනවා. ඒක තමන්ට තේරෙන්නෙත් නෑ. හරියන්න කියල හිතාගෙන වැරදි විදියට වියදම් කරනවා. අර දෝස නිසා මොනවහරි ක්‍රමයක් යෙදිල වියදම් කරන්න හිතෙනවා. එතකොට ධනය වැය වෙන්න පටන් ගන්නවා. හැබැයි නිකන්ම වැය වෙනව නෙවෙයි. මොකක් හරි හේතුවක් යෙදෙනවා.

මීට කලින් ලිපියකින් විග්‍රහ කළා වගේ ප්‍රේත පාදයට අහුවෙන්න රන්, රිදී, මුදල් ආදිය තැන්පත් කළාම ඒවාට තියෙන හිමිකම නැතිව යනවා. මනුස්ස, දේව පාද දෙකට අහුවෙන්න ඒවා තැන්පත් කරන්න කිව්වෙ ඒකයි. නැත්නම් ඒවාට ප්‍රේත ආදී බැල්ම වැටිල අහිමි වෙන්න පුළුවන්. මේ වගේ අවස්ථාවලදි සම්පූර්ණ මනසම ඒකට ක්‍රියාත්මක වෙනවා. **කිරණ කය මනසත් එක්ක සම්බන්ධයි. හැම වෙලේම ගෙදරක තියෙන සැලැස්ම භෞතික මස් ලේ කයට බලපාන්න පෙර, කිරණ කයට තමයි මුලින්ම බලපාන්නෙ. ඒක විශේෂම දෙයක්. ඒ නිසා මනෝ කය තමයි ඉස්සෙල්ලම ලෙඩ වෙන්නෙ.** කර්ම රෝග නිසා එන දෝසත් ඉස්සෙල්ලම බලපාන්නෙ සූක්ෂම මනෝමය කයට. ඊට පස්සෙ ඒ මනෝ කය හා සම්බන්ධ මස් ලේ කයේ ඉන්ද්‍රියන්ට දෙවනුව ඒ කාරණය බලපානවා. මොකද මනෝමය කයේ ආකෘතිය තමයි මස් ලේ කය කියන්නෙ. මනෝමය කයට අයිති යම් කිසි තැනක කලු පාට විස ගුලියක් හැදුනොත්, ටික කලක් යන කොට මස් ලේ කයෙත් මොනව හරි දෝසයකින් ඊට අදාළ තැන ගෙඩියක් වගේ එනවා. ඒකට බාහිර හේතු නෑ. තව කලක් යනකොට සමහර විට පැසවන ගෙඩියක් හෝ පිළිකා තත්ත්වයට පත්වෙන්නත් පුළුවන්. මොන හේතුවෙන්ද ආවෙ කියල බාහිරින් හොයන්න බෑ.

හුග දෙනෙක් මේ කාලෙ ඉඩම්වල ප්‍රමාණය අඩු නිසා, ලේසි ක්‍රමවලට ගේ ඇතුලෙ අත්තිවාරම මැද්දෙ වලක් කපල ඒක වහල උඩින් හොඳට පිඟන් ගඩොල් අල්ලල වැසිකිළිය හදනවා. අපද්‍රව්‍ය ආදිය පිරුනම පිට කරන්න එක පැත්තකින් පුංචි සිදුරක් තියාගන්නවා. දැන් වැසිකිළි වල ගේ ඇතුලෙ අත්තිවාරම මැද. මෙතනදි වැසිකිලියෙ හෝ නාන කාමරයක අනෙක් අංගෝපාංග පාදම උඩ තිබීම ගැටළුවක් නෑ. වැසිකිළි වල පාදමට ☞

සම්බන්ධ වුනොත් තමයි ගැටළුව එන්නෙ. මෙහෙම ගෙවල් හැදුවොත් ඒ ගෙදර පුද්ගලයින්ට විවිධ දෝස එනවා. එක්කො පය ගහපු තැන, එහෙම නැත්නම් තට්ටම තියපු තැන, තුනටිය ප්‍රදේශය වගේ, ඉඳ ගත්තම පොළොවට ස්පර්ශ වෙන්නෙ කොතැනද ඒ සියල්ලටම බලපානවා, ඒ තැන් සියල්ලම අහුවෙන්නෙ අත්තිවාරමට. මොකද ගේ පිහිටන්නෙ අත්තිවාරම උඩ. ගේ පොලොවත් ඒකට අයිතිවෙනවා. එතකොට ශරීරයේ ඒ ස්පර්ශ වෙන සීමාවෙ මොනව හරි ලෙඩක් එනවා. ඒ නිසා මේ වගේ අපිරිසිදු වලවල් ගෙදර අත්තිවාරමට සම්බන්ධ කර ගැනීම කොහෙත්ම ගැළපෙන්නෙ නෑ. ඒ වගේ වලක් වෙනම එළියෙන් තියනව මිසක්, ගේ පාදමට ගෑවෙන්නවත් තියන්න සුදුසු නෑ. ඒ දෝසය ගෘහ මූලිකයට විතරක් නෙවෙයි, ගෘහ මූලිකය ප්‍රධාන කරල මුළු පවුලටම විවිධාකාරයෙන් විවිධ අංශවලින් බලපාන්න පුළුවන්.

උදාහරණ විදියට ගෙදර ප්‍රධාන දොර අහුවෙන්නෙ ගෘහ මූලික පිරිමියට. පැලි දොර භාර්යාවට ප්‍රධාන වශයෙන් බලපානවා. කාමරවල ජනෙල් ගෙදර දරුවන්ට බලපානවා. ඉස්සරහ කාමරය පිරිමි දරුවන් ඉන්නව නම් ඒ අයට. ඇතුළු කාමර ගැහැණු දරුවන්ට. ඒවායේ යම්කිසි ජනෙල් ආදියක් තියේ නම් ඒවායින් එන ආලෝකය පවා ඒ අයට බලපානවා. ඒ සියල්ලම පටිච්ච සමුප්පන්නයි. හේතුවට අනුකූලයි ඵලය. ඒ නිසා ගෙදර සහ පවුලෙ අයගෙ ස්වභාවයත් ඒ වගේ. යම්කිසි විදියකට ගෙදර පෝරණුවක් තියේ නම් ඒක විශේෂයෙන්ම ඒ ගෙදර ගෘහණියට බලපාන්නෙ. උයන පිහනකොට පෝරණුවෙන් යන දුම වහලෙ ලීයකට වදිනව නම්, ඒ හේතුවෙන් එතැන රත් වීමක් වෙලා හොඳ කරන්න බැරි හිසේ කැක්කුමක් ඒ ගෘහණියට එන්න පුළුවන්. ඒ දෝසය අරින්න නම් ලීයට දුම් වැදීම නවත්වන්න ඕන. මෙතනදි වහලය හෝ වහලයට සම්බන්ධ පරාලත් හිසට බලපාන නිසා ඒකට සම්බන්ධ ලීයක් ස්වභාවික නොවන විදිහට කෘතීමව රත් වුනොත් එතන විස කිරණක් හැදිල ඒ බලපෑම එනවා. පෝරණුවෙ රස්නය වැදිල රත්වීමක් කියන්නෙ ස්වභාවික රත්වීමක් නෙවෙයි. මේ තමයි ඒ කිරණ බලපාන ක්‍රම.

ඒ වගේම ජනේලයක් එහා පැත්තෙ වැසිකිලි වලක් තියේ නම් ඒවා වෙනම ආරක්‍ෂා කරන්න ඕන. මොකද ඒවායින් එන කිරණ පාර රත්වෙච්ච ආලෝකයත් එක්ක ළමයින්ගෙ ශරීරයට බලපානවා. හැබැයි මෙතනදි ආලෝකය කියල කියන්නෙ අපේ මේ මස් ලේ ඇහැට පේන භෞතික ආලෝකය නෙවෙයි. මේ කියන්නෙ සියුම් කිරණ පැත්ත. ඒක මනෝ කයට බලපාන්නෙ. ඒ වගේම වැසිකිලි වලක් කියන්නෙ අමනුස්සයින්ගෙ නිදහස් ආහාරස්ථානයක්. යම් කිසි පවුලක පෙර හිටපු උදවිය මියගිහින් විවිධ ප්‍රේත, ගන්ධබ්බ අත් බැව්වල ඉන්න කොට ඒ අයගෙ මිනිස් ඥාතීන් තවමත් ජීවත් වෙලා ඉන්නව නම්, ඒ අය ඇසුරෙ මොනව හරි දෙයක් කාල බීල තමයි ඒ අය ජීවත් වෙන්නෙ. නමුත් ඒ ඥාති පරම්පරාවත් මියගිහින් ඒ පරපුර ඉවර වුනාට පස්සෙ ඒ ගන්ධබ්බ ප්‍රේතයො අනාථ වෙනවා. එතකොට ඒ වගේ අය පහසුවෙන්ම ගෙවල්වල වැසිකිලි, කුණු වළවල්, දර මැහි ආදියට සම්බන්ධ වෙලා ඒවා ඇසුරු කර ගෙන භුක්ති විඳිනවා. කර්ම වේගයට වෙන කන්න බොන්න දෙයක් නැති නිසයි එහෙම කරන්නෙ. මේ වගේ ප්‍රේතයො, අමනුස්සයො ඉන්න කොට ඒ ගෙදර අයටත් ඒ බැල්ම වැටෙනවා. විශේෂයෙන් කාමරයක ජනේලයක් ඉදිරියෙන් වැසිකිලි වලක් හැදුවොත්, ඒක ඇසුරු කර ගෙන ඉන්න අමනුස්සයින්ට හැම වෙලේම ඒ කාමරය ඇතුල පේන්න ගන්නවා. ඒ නිසා ආකර්ශනයක් බැල්මක් වැටෙන කොට ඒ කාමරයෙ ඉන්න ළමයින්ටත් ඒ අමනුස්ස බලපෑමයි, අර විස කිරණවල බලපෑමයි දෙකම එනවා.

දැන් සමහර භෞතිකවාදී උදවිය තර්ක කරන්න පුළුවන්, එතන වැසිකිළි වලක් තිබුණම මොකද වෙන්නෙ කියල. ඒ අය ඇහැට පේන භෞතික පැත්ත විතරයි දකින්නෙ. මේ භෞතික කය දිහා විතරයි ඒ අය බලන්නෙ. අධ්‍යාත්මික පැත්තෙ කිසිම සම්බන්ධයක් ඒ අයට තේරෙන්නෙ නෑ. ඒ නිසා ඒක කොහොමද බලපාන්නෙ කියල ඒ අය අහනවා. මෙතනදි ඇහැට නොපෙනෙන දේවල් බලපාන හැටි විශේෂයි. ඒ බලපෑමක් ඇති කිරණ තමයි එතකොට වෙනස් වෙන්නෙ. මේ මුළු විශ්වයම කිරණ පද්ධතියක්. මේ කාරණය දැන ගන්න අභයරතනාලංකාර හිමියන්ට ලැබිච්ච අත්දැකීමක් තමයි මේ.

''අපි මේ කටයුතු කරන වහරක අරිය චින්තාශ්‍රමය කියන පන්සල හදන මුල් කාලවල මම කල්පනා කළා, කොහොමද ඒකෙ අංගෝපාංග ආදිය සැලසුම් කරන්නෙ කියල. මේ ස්ථානය මේ විදියට හදල, චෛත්‍යය මෙහෙම හදල, බෝධිය අහවල් තැන අහවල් විදියට රෝපණය කරල ... ආදී වශයෙන් මම හිතෙන් චිත්‍රයක් ඇඳ ගත්තා. හැබැයි කාටවත් කියන්න ගියේ නෑ. මේ අතර යම් කිසි කිරණ ශක්තියකින් යම් යම් ගුප්ත දේවල් ප්‍රකාශ කරන්න පුළුවන් මහත්තයෙක් හිටියා. ඉතින් දවසක් මේ පන්සලට එන උපාසක මහත්තයෙක්, ඒ කිරණ ශක්තියෙන් වැඩ කරන මහත්තය මුණ ගැහිල මේ පන්සල ගැනත් විස්තර අහල තිබුණා. අහන කොට ඒ මහත්තය මගේ හිතේ ඇඳිච්ච අර චිත්‍රයට අනුකූලව පන්සල ගැන විස්තරයක් කළා.

ඒ ස්ථානයේ මෙන්න මෙහෙම බෝධියක් රෝපණය කරල, මේ විදියට චෛත්‍යයක් හදල .... ආදී වශයෙන් විස්තර කරන කොට, අර පන්සලට එන උපාසක මහත්තය කිව්ව නෑ නෑ එහෙම දේවල් මේ පන්සලේ නෑ කියල. ඉතින් ඔය සිද්ධිය මට දැනගන්න ලැබුනම මම කිව්වා, දැන් භෞතිකව පේන්න නැති වුනාට මගේ හිතේ ඇඳිච්ච චිත්‍රය ඕකයි කියල. ඉතින් ඒ විදියටමයි පසු කාලීනව මේ පන්සල ගොඩ නැගුනෙත්. එතකොට මම හිතෙන් චිත්‍රය අඳින කොට ඒත් එක්කම සිතිවිලි වැඩ කරල කිරණ චිත්‍රයක් ඇඳෙනවා. අන්න ඒ කිරණ චිත්‍රය තමයි අර මහත්තයගෙ කිරණ ශක්තියට අහුවුනේ. එතකොට ඒ කිරණ චිත්‍රය ඔහු නොදැක කිව්ව නෙවෙයි. භෞතික ලෝකෙ නැති වුනාට කිරණ ලෝකෙ එහෙම දෙයක් ඇඳිල තියෙනවා. **අපි යමක් හිතන කොටම කිරණ ලෝකෙ ඊට අනුරූපවම ඒක හැදෙනවා. ඒ වගේම භෞතික ලෝකෙ ඒක හදන කොට ඒක භෞතිකවත්, කිරණ මාධ්‍යයක් වශයෙනුත් දෙකෙන්ම හැදෙනවා.**

මේ විදියට මනුස්සයින්ගෙ මානසිකත්වයට කිරණ බලපාන විවිධ ක්‍රම තියෙනවා. ඒ අනුව ලැබෙන්න තියෙන ක්‍රම, වැනසෙන්න තියෙන ක්‍රම වෙනම තියෙනවා. ඒ ක්‍රමයකට ආවම මනස බලපාන්නෙ ලැබීමට හෝ වැනසීමට හේතු වන ආකාරයට. තමන් විසින් හදාගත්තු දේ බලපාන්නෙ ඒ විදියට. කෙනෙක් නඩු හබවලට පැටලෙන්නත් ඒක බලපානවා. මෙතනදි විඤ්ඤාණ පච්චයා නාම රූපං කියන්නෙ එකක්. නාම රූප පච්චයාපි විඤ්ඤාණං කියන්නෙ ඒකෙ අනික් පැත්ත. මේ කාරණය ත්‍රිපිටකයේ පෙන්වා තියෙනවා. ඒ කියන්නෙ විඤ්ඤාණ ප්‍රත්‍යයෙන් නාම රූප හැදෙනවා, නාම රූප ප්‍රත්‍යයෙනුත් විඤ්ඤාණ හැදෙනවා. ඉස්සෙල්ලම විඤ්ඤාණයෙන් නාම රූප හදනවා. ඊට පස්සෙ ඒ නාම රූප ඇසුරු කරල ඒ ප්‍රත්‍යයෙනුත් විඤ්ඤාණ හදනවා. ඒ දෙවෙනි වතාවට. ඒක තමයි අඤ්ඤ මඤ්ඤ පටිච්ච සමුප්පාදය කියන්නෙ. ඒකෙන් තමයි අපිට මේ බලපෑම් එන්නෙ. විඤ්ඤාණ පච්චයා නාම රූපං කිව්වම අභ්‍යන්තර සහ බාහිර නාම රූප 2 යි. නාම සහ රූප කියන වචනවලත් අර්ථ තියෙනවා. අභ්‍යන්තර නාම රූපවලින් හිත හට ගන්නවා. බාහිර නාම රූපවලින් නම්‍යතාවය සහ රුප්පනය ඇති කරනවා. යමක් රුප්පනය නිසයි ඔප් නැංවිලා පේන්නෙ. රුප්පතීති රූපං කියල ඒ ☞

කාරණය දහමෙ තෝරල තියෙනවා. නමුත් අද ඕකට කැඩෙන බිඳෙන නිසා රූප කියනව කියල සිංහලට තෝරල තියෙනවා. හැබැයි ඒ අදහස අරන් තියෙන්නෙ පද නිරුක්තියෙන් නෙවෙයි, පසුව හදා ගත් අත්තනෝමතික ලෝක සම්මත ආචාර්ය වාදයකින්. කැඩෙන බිඳෙන නිසා රුප්පනය කියල කිව්වට, කඩ්ඩති බින්දතීති රූපං කියල කොතනකවත් සඳහන් වෙලා නෑ. රුප්පතීති රූපං කියලයි පෙන්වල තියෙන්නෙ.

රූ ඔප් නැංවෙනවා. රූ කියන්නෙ යම් කිසි ආකාරයකට භ්‍රමණ චක්‍රයක්. භ්‍රමණ චක්‍රයකින් ඔප් නැංවෙන්නෙ යමක්ද ඒ රූප. ඒක හේතු ඵලයක්. භ්‍රමණයක් නැත්නම් රූපයක් හැදෙන්නෙ නෑ. ඉස්සෙල්ලම කිරණ භ්‍රමණයක් වෙන්න ඕන. ඒක මූලධර්මයක්. ඒ භ්‍රමණයට අනුකූලව සතර මහා භූත භ්‍රමණය වෙනවා. ඒවා සනීභවනයෙන් ඊට අනුකූල විවිධ ජාතිවල රූප ඔප් නැංවෙනවා. භ්‍රමණය නැවතුනොත් රූප බිඳෙනවා. රුප්පතීති රූපං කිව්වෙ ඒකයි. එතකොට කැඩෙනව බිඳෙනව විනාස වෙනව කිව්වම, අපේ සිතිවිලි කැඩෙන්නෙ බිඳෙන්නෙ නැද්ද? එක වෙලාවකට තරහ හිතක් එනවා, තව වෙලාවකට මිතුරු හිතක් එනවා. ඒ කියන්නෙ හිතත් කැඩෙනවා, බිඳෙනවා. කැඩෙන බිඳෙන නිසා රූප කියනව නම් ඇයි හිතට රූප කියන්නෙ නැත්තෙ? තර්ක වාදයෙන් බැලුවොත් ධර්මයට බහා බලන කොට, සූත්‍රයට බහා බලන කොට බහා හිටින්නෙ නෑ. බහා හිටින්නෙ නැත්නම් ඒක බැහැර කරන්න කියලයි බුදුන් වහන්සේ දේශනා කළේ. (බැහැ + අර - බැහැර - අර ගන්න බැහැ කියන අදහස) ඒක දැන ගන්න තමයි ඒ වගේ ක්‍රමයක් දීල තියෙන්නෙ. කැඩෙන බිඳෙන නිසා රූප වෙනව කියන කාරණයත් ඒ ක්‍රමයට දාල බලන්න ඕන. මොකද බුදුන් වහන්සේ නෙවෙයි ඒක පෙන්වල තියෙන්නෙ අත්තනෝ මත ඉදිරිපත් කරපු අය. ඒ අය පෙන්නුව දෙයක් වුනත් බුදුන් වහන්සේගෙ ක්‍රමයට දාල බැලුවම ඒකෙ තියෙන සත්‍ය අසත්‍යතාවය එළි වෙනවා. මොකද මේක හේතුඵල ධර්මයක්.

දැන් මේ වගේ වාස්තු විද්‍යාවෙත් එක්තරා ආකාරයකට පරාලයක පිහිටීම ගැන පෙන්වල තියෙනවා. ඒ කියන්නෙ යම් කිසි ගෙයක් කොහොම හැදුවත් ඒ ගෙයි පරාලය දිහා බැලුවම ඒක පිහිටල තියෙන ආකාරයෙන්, ඒ ගේ හදන්න ගත්තෙ අසාධාරණ විදියට හම්බ කරපු මුදල්ද නැද්ද කියල බලාගන්න පුළුවන්. ඒ පරාලයේ පිහිටීම ඒ විදියට තිබුණොත්, අසාධාරණයෙන් හම්බ කරපු මිල මුදල් ඒකට සම්මිශ්‍රයි. ඒක පැරණි ඍෂිවරු පෙන්වපු දෙයක්. හැබැයි ඒ පිහිටීම එන විදියට ඒ අය හිතල මතල නෙවෙයි ඒක හදන්නෙ. නමුත් පටිච්ච සමුප්පන්න නිසා ඒක එහෙම වෙනවා. ඒ වගේ හිතා මතා නොකරන, හේතු නිසා සිද්ධ වෙන දේවල් හරියට තියෙනවා.

උදාහරණයක් විදියට බුදුන් වහන්සේ පාරමිතා පුරපු සාරාසංඛ්‍ය කල්ප ලක්ෂයක් කියන්නෙ කොච්චර නම් එහා කාලයක්ද ? එදා දීපංකර බුදුන් වහන්සේ



පළවෙනි නියත විවරණය දෙන කොට පෙන්නුවා, මෙයින් සාරාසංඛ්‍ය කල්ප ලක්ෂයකට පස්සෙ මේ විදියෙ සුද්ධෝදන කියන පියෙකුට දාව, මහාමායා දේවිය කියන මවකගෙ කුසින් සිදුහත් ගෝතම නමින් බෝසතාණන් වහන්සේ උපදිනව කියල. එතකොට ඒ විවරණයෙන් සාරාසංඛ්‍ය කල්ප ලක්ෂයකට පස්සෙ ඒ සුද්ධෝදන, මහාමායා, සිදුහත් කියන නම් දැම්මෙ ඒ විවරණ කතාව අහලද ? නෑ. ඒ කාලෙ වෙන කොට බුදුවරයෙක් ගැන එහෙම නාම මාත්‍රයක කතාවක්වත් දන්නෙ නෑ. එදා හිටපු බමුණො තමයි ඒ නම් දැම්මෙ. රාහුල කියන පුතෙක් උපන් දවසෙ ගිහි ගෙයි හැර යනව කිව්වා. කවුද ඒ නම දැම්මෙ ? ඒ කාලෙ හිටපු කවුරුහරි දාපු නමක්. නමුත් අර දීපංකර බුද්ධ විවරණය අහගෙන නම දැම්ම නෙවෙයි. හිතට ආපු නමක් දැම්මා. හැබැයි අන්තිමට බලන කොට දාල තියෙන්නෙ එදා දීපංකර බුදුන් වහන්සේ ප්‍රකාශ කරපු නම්.

එතකොට එදා උන් වහන්සේ ප්‍රකාශ කරපු නම්, මේ නම් දාපු බමුණන්ගෙ හිතට ආවෙ කොහොමද ? සිදුහත් කුමාරයට නම් තියන්න ඉස්සෙල්ලම බමුණො 108 ක් ගෙන්වල එයිනුත් හොඳම දක්ෂ 8 දෙනෙක් තෝරල, ඒ අය තමයි අන්තිමට නම් දාන්න ගත්තෙ. ඒ විදියට තෝරල ගත්තු බමුණන්ට ආපු අදහසත්, අන්තිමට බලන කොට අර හේතුඵල අදහසට ගැළපෙන්න තමයි ඇවිත් තියෙන්නෙ. එතකොට එදා හිටපු දීපංකර බුදුන් වහන්සේ ප්‍රකාශ කරපු නම් ගම් ඒ විදියටම ආවෙ කොහොමද ? අපි හිතුව කියල කිව්වට එහෙම ලේසියෙන් ඒ වගේ දෙයක් හිතන්න බෑ. ඒ සිතිවිලි ලේසියෙන් වෙනස් කරන්නත් බෑ. ඒ නිසා තමයි මහ බලවත් සිතිවිලි නරක පැත්තට වෙනස් කරන්න නම් අසත් පුරුෂයෙක්ගෙ ආධාරයක් ඕන වෙන්නෙ. ඒ වගේම හොඳ පැත්තට පිහිටියොත් ඒ සත් පුරුෂ ඇසුර නිසාමයි. මේ දෙක තමයි ප්‍රයෝග විපත්තිය සහ ප්‍රයෝග සම්පත්තිය කියන්නෙ. මේ දෙකෙන් තමයි කෙනෙක් වෙනස් වෙන්නෙ. එහෙම නැතිව කෙනෙකුට තනියෙන් වෙනස් වෙන්න බෑ. ඒක විශේෂයි.

කෙනෙකුට තනියෙන් අසත් පුරුෂයෙක් වෙන්නත් බෑ, තනියෙන් සත් පුරුෂයෙක් වෙන්නත් බෑ. අසත් පුරුෂ ඇසුරට වැටුනොත් තමයි ඒ හේතුවෙන් ඒ පුද්ගලය අසත් පුරුෂයෙක් වෙන්නෙ. සත් පුරුෂ ඇසුරට වැටුනොත් තමයි සත් පුරුෂයෙක් වෙන්නෙ. ඒ නිසා තමයි මේ සාසනය 100% ක්ම සත් පුරුෂයන් නිසා පවතිනව කියල බුදුන් වහන්සේ දේශනා කළේ. යමෙක් අසත් පුරුෂයෙක් වෙන්නත් හේතුව අසත් පුරුෂ සංසේවනය. පුද්ගලයට අවිද්‍යාව තිබුණත් අසත් පුරුෂ සංසේවනය මුල් වෙනවා. එහෙම නැතිව අවිද්‍යාව තිබුණ පළියට නිකම්ම අසත් පුරුෂ වෙන්නෙ නෑ. ඒක උපනිශ්‍රය වෙනවා. මේ නිසා ප්‍රයෝග සම්පත්තිය හෝ ප්‍රයෝග විපත්තිය තුළින් තමයි කෙනෙක් හොඳ හෝ නරක බවට හැඩ ගැහෙන්නෙ. එහෙම නැතිව තනියෙන් කවදාවත් ඒ ටික කෙනෙකුට කර ගන්න බෑ. සත් පුරුෂ ඇසුරෙන්ම තමයි කෙනෙක් යමක් හදා ගෙන දියුණු වෙන්නෙ හෝ අළුත් වෙන්නෙ. වාස්තු විද්‍යාවත් ඒ වගේ ක්‍රමයක්.

(ඉතිරි කොටස ලබන කලාපයෙන්)

සටහන
**නීතිඥ චන්දන සිරිවර්ධන**

# අර්ථ පටලවා ගත් ප්‍රාණ ඝාතය සහ පර පණ නැසීම අතර වෙනස ...

*(පසුගිය කලාපයෙන් - සිය දිවි නසාගැනීම සම්බන්ධයෙන් වැඩිදුර පැහැදිලි කිරීම්...)*

ප්‍රාණාතිපාතා ... කියන සිඛ පදය අද වෙන කොට අර්ථ පටලවා ගෙන තිබීමත්, සිය දිවි නසා ගැනීම පර පණ නැසීමක් කියල අදහස් ගන්න එක හේතුවක් වෙලා තියෙනවා. මෙතනදි සිද්ධ වෙලා තියෙන්නෙ පර පණ නැසීම සහ ප්‍රාණ ඝාත කියන කාරණා දෙක පටලවා ගැනීමක්. බුදු දහම අනුව සිය දිවි නසා ගැනීම පර පණ නැසීමක් නොවුනට, ප්‍රාණ ඝාත අකුසල කර්මයක් වෙන සමහර අවස්ථා තියෙනවා. ප්‍රාණ ඝාතය කිව්වම මස් ලේ කය ඝාතනය, හිත ඝාතනය (ලෝභ, ද්වේශ, මෝහයන්ට යොමු කිරීමෙන් හිත දූෂ්‍ය කිරීම) සහ චරිත ඝාතනය කිරීම කියන කාරණා 3 ම අයිති වෙනවා. හැබැයි එතනදි ප්‍රාණ ඝාතය කියන කාරණය, වචනවල එල්ලිලා ඉන්නෙ නැතිව හරියට තෝර ගන්න ඕන. එහෙම නැතිව නිකම්ම පර පණ නැසීමක් කිව්වොත් වැරදි අර්ථයක් තමයි එන්නෙ. පර පණ නැසීම සහ ප්‍රාණ ඝාතය කියන්නෙ කාරණා 2 ක් වුනත්, අද මේ දෙකම එකක් විදියට තමයි හුඟක් අය හිතාගෙන ඉන්නෙ. ඒ නිසා මේ කාරණය විග්‍රහ කර ගන්න ඕන.

සමාජයේ චරිත ඝාතනය කියල දෙයක් තියෙනවා. ඒකත් ප්‍රාණ ඝාතයට වැටෙන්නෙ. කෙනෙක් තමන්ගෙම චරිතය ඝාතනය කරගත්තොත් ඒකත් ප්‍රාණ ඝාතයක්. ඒක කොහොමද වෙන්නෙ කියල කෙනෙකුට ප්‍රශ්නයක් එන්න පුළුවන්. කෙනෙකුට තමන්ගෙ චරිතය ඝාතනය කර ගන්න තනියම බෑ. තවත් කෙනෙක් සම්බන්ධ වෙන්නෙ ඕන. ඒ කියන්නෙ එහෙම හිතක් එන්නත් අසත් පුරුෂ ඇසුරක් තියෙන්න ඕන. චරිත ඝාතනය කියන්නෙත් දස අකුසලයට වැටෙන දෙයක්. දස අකුසලයෙන් තමයි සියලු පවු විග්‍රහ වෙන්නෙ. කයින්, වචනයෙන් මනසින් සිද්ධ වෙන පවු තමයි මේ දස අකුසල් කියල 10 කට බෙදල තියෙන්නෙ. ඒවායින් ප්‍රාණ ඝාතය, අදත්තා දානය, කාම මිච්චා චාරය කියන්නෙ කායික අකුසල්. මුසාවාදා, පිසුනා වාචා, පරුසා වාචා, සම්පප්‍රලාප කියන්නෙ වාචසික අකුසල්. අභිධ්‍යා, ව්‍යාපාද, මිථ්‍යා දෘෂ්ටි කියන්නෙ මානසික අකුසල්. මේ තුන් පොලින් තමයි යම් කිසි පාපයක් කෙරෙන්නෙ. දැන් තමන්ගෙ චරිත ඝාතනය මේ දස අකුසලයට වැටෙන ප්‍රාණ ඝාතයක් වෙන්නෙ කොහොමද කියල කෙනෙකුට ගැටළුවක් එන්න පුළුවන්.

උදාහරණ විදියට යම් කිසි කෙනෙක් තමන්ගෙ ගෙදර කවුරුවත් නැති වෙලාවක කාමරයක ඉඳන් තනියම කුණුහරුපෙන් මහ පොළවට හරි කාට හරි බනිනව කියල හිතුවොත්, ඒ අවස්ථාවෙදි ඒක අහගෙන ඉන්න මනුස්සයෙක් නෑ. දැන් ඒ පුද්ගලය හිතන් ඉන්නෙ, මම කාටවත් ඇහෙන්න බැන්නෙ නෑ, කවුරුවත් අහගෙන හිටියෙ නෑ කියල. නමුත් මේ වගේ අවස්ථාවකදි පුද්ගලයෙක්ගෙ ශරීරය හරියට විකාශන කුළුණක් වගේ ක්‍රියාත්මක වෙන්නෙ. අපිට පේන්නෙ නැති වුනාට කෙනෙක් සිතිවිල්ලක් හිතන කොටම ඒක වේගයෙන් විශ්වයට විහිදිලා යනවා. කාට හරි කුණුහරුපෙන් බැන්නයි කියන්නෙ එතන ද්වේශ - මෝහ සම්බන්ධයි. එතකොට විශ්වයට විසක් පැතිරෙව්වොත් ඒකෙන් මුළු මහත් ලෝකයටම වරදක් වෙනවා. අනිත් අයට බැන්නොත් කොහොමත් ඒ අයගෙ හිත් රිදෙන නිසා පාපයක් වෙනවයි කියන කාරණය අමුතුවෙන් කියන්න ඕන නෑ.

මේ කොයි විදියට බැන්නත් තමන් තමන්ගෙම චරිතය තමයි ඒකෙන් ඉස්සෙල්ලම ඝාතනය කර ගන්නෙ. තමන් කියන්නෙත් ප්‍රාණියෙක් නිසා ඒකත් ප්‍රාණ ඝාතයක් වෙනවා. කෙනෙක් තවත් කෙනෙක්ගෙ චරිතය ඝාතනය කළොත් ඒක අන්‍ය ඝාතනයක්. හැබැයි අන්‍ය කෙනෙක්ගෙ චරිතය ඝාතනය කරන කොට ඒකෙන් තමන්ගෙ චරිතයත් ඉබේටම ඝාතනය වෙනවා. කෙනෙක් වචනයෙන් කරන අකුසල්වලින් මොනව හරි දෙයක් ප්‍රකාශ කළොත් ඒක ලෝභ, ද්වේශ, මෝහ තුනෙන් ප්‍රකාශ කරන දෙයක් වෙනවා. විහිළුවට හරි නිකං කියව කියව ඉන්න ගියත් ඒකත් ප්‍රලාපයක්, තමන්ගෙම චරිතය කෙළසා ගැනීමක්. චරිතයෙන් වැඩ ගන්න තියෙන වැදගත් කාලය, වැදගැම්මකට නැති දේකට යොදවනව කියන්නෙ ඒකත් එක්තරා ඝාතනයක්. එතනදි අල්ප සාවද්‍ය, මහා සාවද්‍ය කියල අවස්ථා 2 ක් තියෙනවා. ඒක වෙනම කතාවක්. නමුත් කොහොම කළත් ඝාතනයක්.

මේ චරිත ඝාතනය කියන වචනය අද සමාජයේ බොහෝ කොටම කතා කරනවා. ඒකට චරිත ඝාතනය කියනව මිසක් චරිත මැරීම කියන්නෙ නෑ. මේ ඝාතනය කියන වචනයේ, මැරීම කියන වචනයට වඩා විශේෂත්වයක් තියෙනවා. ''ඝා'' කියන්නෙ බිඳ හැරීම / වෙන් කිරීම. සංඝ කියල මහප්‍රාණයෙන් කිව්වමත් ''සං'' කියන එකතුවෙන් වෙන්වීම තමයි අදහස් වෙන්නෙ. ඝා + තැන තමයි ඝාතනය බවට පත් වුනේ. ඒ කියන්නෙ තැන බිඳ හැරියා. ''මේ මගේ තැන, දැන් මට තැනක් නෑනෙ ! මම කොහෙද ඉන්නෙ ? මේකා මගෙ තැන කෑවා. මගේ නම්බුව කෑවා'' පෙළක් අය මෙහෙම කියනවා. ඒ කියන්නෙ මාන්නය කෑව කතාවක් නෙවෙයි. මම හොඳ පිරිසිදු සුචරිත කෙනෙක් විදියට හිටියා, මගේ තැන නැති කළා, තැන බිඳ හැරියා කියන එකයි මේ කියන්නෙ. චරිතය කියල අදහස් කරන්නෙ පිරිසිදු බව, සුචරිතය. ඒකෙ විරුද්ධ පැත්ත තමයි දුෂ්චරිත කියන්නෙ. කොටින්ම කියනව නම් චරිතය ඝාතනය කළා, චරිතයට හිමි තැන බිඳ හැරියා.

පාණාතිපාතා වේරමණී ... කියන සිඛ පදය අද හදාගෙන තියෙන්නෙ ප්‍රාණ ඝාතයෙන් වෙන්වීම කියල වුනත්, ඒකට දැනට අර්ථ දීල තියෙන්නෙ, පර පණ නැසීමෙන් වෙන්වීම කියල. නමුත් මේ සිඛ පදයේ නියම අර්ථය ගත්තොත්, **බහා තැබූ දඬු මුගුරු ඇතිව, බහා තැබූ අවි ආයුධ ඇතිව, බහා තැබූ දැල් උගුල් ආයුධ ඇතිව, පාපයට ලැජ්ජා ඇතිව බිය ඇතිව, දයානුකම්පාවට පැමිණ සියලු ප්‍රාණීන් කෙරෙහි හිතානුකම්පීව වාසය කරන්නේය** ... යනාදී වශයෙන් කියන කොට, අනුන්ට හිංගි හිංසා කිරීම ඇතුළු තමන්ගෙ චරිත ඝාතනයත් අයිති වෙනවා. හැබැයි ඒකට පර පණ නැසීම කියල කිව්වොත් එන්නෙ වෙන අදහසක්. සතෙක්ගෙ ජීවිතය විනාස කිරීම විතරයි එතකොට අදහස් වෙන්නෙ. මෙතනදි පාපයට ලැජ්ජා ඇතිව බිය ඇතිව වාසය කරන්නේය කිව්වම තමන්ගෙ චරිත ඝාතනයෙන් වෙන්වීමත් ඒ කොටසට අනිවාර්යෙන්ම ඇතුළත් වෙනවා. මොකද පාපයට ලැජ්ජාවක් බයක් තියෙන කෙනෙකුට තමන්ගෙ චරිතය ඝාතනය කරගන්න බෑ. එහෙම කළයි කියන්නෙ, අර කලින් කිව්ව වගේ ලෝකයට විසක් ☞

පැතිරෙව්වයි කියන එක. ඒ වගේම සියලු ප්‍රාණීන් කෙරෙහි හිතානුකම්පීව වාසය කරන කෙනෙකුටත් එහෙම දෙයක් කරන්න බෑ. හිතානුකම්පාව පූර්ණ නම් මේ දස අකුසලයෙන්ම කාටවත් වරදක් කරන්න බෑ. එක ශික්ෂා පදයක් ගත්තම ඒකට සියලු පවු කොටු වෙනවා. ඒ නිසා පාණාතිපාතා කිව්වම කය ඝාතනය විතරක් නෙවෙයි, සියලු ඝාතනයන් අයිති වෙනවා. මේ සිඛ පදය කියන කොට ප්‍රාණ ඝාතය කියල සරලව අද කතාවට කිව්වට, පර පණ නැසීම, හිංගි හිංසා කිරීම ඇතුළු චරිත ඝාතනයත් ඒකෙන් කියවෙනවා. මේ සිඛ පදයයි, පංච දුෂ්චරිතවලින් වළකින සතුන් නොමරමි (පර පණ නැසීමෙන් වැළකීම) කියන කාරණයයි අද එකම කාරණයක් විදියට තමයි අර්ථ දක්වන්නෙ. නමුත් සිඛ පදය එකක්, පංච දුෂ්චරිතයෙන් වෙන්වීම තව එකක්.

**පර පණ නැසීම සහ ප්‍රාණ ඝාතය කියන්නෙ කාරණා 2 ක් බව ''පාණං නහානේ නව ඝාතයෙයිය හණ තං පරේසං නචානු සෙයිය'' කියන බුද්ධ දේශනාවෙන් පැහැදිලි වෙනවා.** පාණං නහානේ - ප්‍රාණය හණ කරන්නෙ නෑ. හණ කියන්නෙ නසනවා, වනසනවා කියන එක. නහානේ කියන්නෙ නසන්නෙ නෑ. ඒ කියන්නෙ පණ නසන්නෙ නෑ. ඒ එක කාරණයක්. එතකොට නච ඝාතයෙයිය කියල තව එකක් තියෙනවා. ඒ කියන්නෙ ඝාතනය කරන්නෙ නෑ. පාණං නහානේ කියල කියන කොට ඝාතනය කියන කාරණයත් කියවුනා නම්, නච ඝාතයෙයිය කියල තව විදියකට කිව්වෙ මොකක්ද ? ඒ තව කාරණයක්. හණ තං පරේසං නචානු සෙයිය - මරන්නා වූ අනෙකෙකුට අනුබල දෙන්නෙ නෑ. පර පණ නසන්නෙ නෑ, ඝාතනය කරන්නෙ නෑ, නැසීමට අනුබල දෙන්නෙ නෑ කියන කාරණා 3 ක් මෙතන කියවෙනවා.

ඒ නිසා මෙතන අදහස් 3 ක් තියෙන බව පැහැදිලියි. පර පණ නැසීමෙන් වැළකීම, ඝාතනයෙන් වැළකීම, අනුබල දීමෙන් වැළකීම කියන්නෙ කාරණා 3 ක්. ඒ නිසා ඝාතනය කියන වචනයේ වෙනම අදහසක් තියෙන බව ඔප්පු වෙනවා. පර පණ නැසීම තමයි හණ කිව්වෙ. නච ඝාතෙයිය - ඝාතනය කරන්නෙ නෑ කියල තව අදහසක් තියෙනවා. නමුත් පසු කාලෙක පාණං නහානේ නව ඝාතයෙයිය කියන කොටසට පොත්වල අර්ථ පෙන්වල තියෙන්නෙ, මරන්නෙ නෑ, මරවන්නෙ නෑ කියල. නමුත් මේ කොටසින් මරවන්නෙ නෑ (අනුබල දෙන්නෙ නෑ) කියල අර්ථයක් කියවෙන්නෙ නෑ. හණ තං පරේසං නචානු සෙයිය කියන කොටසින් තමයි මරවන්නෙ නෑ කියන අර්ථය එන්නෙ. ඒකත් පටලවල තියෙන්නෙ. ඝාතනය කියන වචනයේ අදහස වැහිල ගිහින් ඒ වෙනුවට සම්මත අදහසක් පසු කාලීනව අරගෙන තියෙන්නෙ.

ඒ වගේම පාණාතිපාතා වේරමණී .... කියන කොට, ප්‍රාණ ඝාතයෙන් වැළකීම කියන අදහස පෙර පටන් ආවා. නමුත් පසුකාලීනව ඒක පර පණ නැසීම කියල අදහස වෙනස් වුණා. අන්තිමට පර පණ නැසීම කියන කාරණය ප්‍රාණ ඝාතය බවට පත් වුණා. පර පණ නැසීමේ අර්ථය ඝාතනය විදිහට අදහස් ගත්තා. එතකොට ඝාතනය කියන එකේ නියම අර්ථය වැහිල ගියා. මේ කියන ඝාතනයට තමන්ගෙ චරිත ඝාතනයත් අහු වෙනවා. නමුත් අද ප්‍රාණ ඝාතය කියල කතා කරන්න විදියක් නෑ. කතා කළොත් පර පණ නැසීම කියල අදහස් ගන්නවා. එතකොට ප්‍රාණ ඝාතයට අපිත් අයිතියි කිව්වොත්, එහෙනම් පර පණ



නැසීමටත් අයිතියි කියල වචන පටලව ගන්නවා. කොටින්ම කිව්වොත්, ප්‍රාණ ඝාතය කිව්වම සතුන් මැරීම විතරයි අද කතා කරන්නෙ. නමුත් ඒක පසුව හදාගත් අත්තනෝ මතයක් මිසක් පෙළ දහමෙ හෝ අටුවාවල හෝ පර පණ නැසීමෙන් වෙන්වීම කියල පාලි වචනයක්වත් නෑ.

ඒ නිසා පර පණ නැසීම එකක්, ප්‍රාණ ඝාතය තව එකක්. ප්‍රාණීන් නසන්නෙ නෑ, එක කාරණයක්. ඝාතනය කරන්නෙ නෑ, තව කාරණයක්. මේ දෙවන කාරණයට චරිත ඝාතනය ඇතුළු සියල්ලම අයිති වෙනවා. ප්‍රාණ ඝාතයෙන් වැළකීම කිව්වම තමන්ගෙ චරිත ඝාතනයයි, අනුන්ගෙ චරිත ඝාතනයයි දෙකෙන්ම වැළකීමත් කියවෙනවා. පාණං නහානේ කිව්වෙ අනුන්ගෙ ජීවිතයක් නසන්නෙ නෑ කියන එක. කවුරුවත් කැමති නෑ තමන්ගෙ ජීවිතය නසනවට. නසනවට කැමති නැති පුද්ගලය නැහෙන්නෙ මොකද ? කෙනෙක් අන්තිම මැරෙන මොහොතෙ පවා, කවුරු හරි මරන්න ආවොත් බයේ කෑ ගහනවා. ස්වභාවිකව මැරෙන එක වෙනම කතාවක්. නමුත් මරනවට බයයි. තමන් යම්කිසි විදියකට මැරෙන්න තියෙනව නම්, ඊට වඩා වෙන හේතුවකින් මරන්න ආවොත් ඒකට කැමති නෑ. එතකොට අනිකෙකුට කියන්න පුළුවන්කමක් නෑ, ඒ පුද්ගලය මැරෙන්න කැමතියි කියල. ඒකට අනාවරණ ඥානය තියෙන ලොව්තුරා බුදුන් වහන්සේම ඕන, ඇත්ත වශයෙන්ම ඒ පුද්ගලය මැරෙන්න කැමතිද නැද්ද කියල දැන ගන්න.

යමෙක් සිය දිවි නසා ගන්නෙ කැමැත්තෙන් කියල කිව්වොත්, එතකොට තව කෙනෙක් කිව්වොත්, තමන් මැරෙන්න කැමති නම් ඒ වගේ අනිත් කෙනත් මැරෙන්න කැමතියි කියල, කවුද ඒක හරියටම එහෙමයි කියල දන්නෙ ? යමෙක්ගෙ හිතේ ස්වභාවය හරියටම දන්නෙ ලොව්තුරා බුදුන් වහන්සේ විතරයි. ඉතින් හිතේ ස්වභාවය දන්නෙ නැති කෙනෙක්, අහවලා මැරෙන්න කැමති ඇති, ඒ නිසා මම ඔහුව මරන්නම් කිව්වොත් ඒක ගලපන්න බෑ. ඒ නිසා තමයි අනුන් නැසීම පර පණ නැසීමට අහු වෙන්නෙ. **තමන්ගෙ සිය දිවි නසා ගැනීම පර පණ නැසීමට අහු නොවෙන්න හේතුව, තමන් මැරෙනව නම් මැරෙන්නෙ ජීවිත ආසාව දෙවෙනි කරල තමන්ගෙ කැමැත්තෙන්. එතකොට ඒක ලෝභ, ද්වේශ, මෝහයන්ගෙන් කළොත්, පාණාතිපාතා කියන කාරණයට අහුවෙනවා.** ඒ කියන්නෙ ඒ අවස්ථාවෙදි ඒ පුද්ගලය ගන්න උපක්‍රමය මොකක්ද කියල බලන්න ඕන. ඒක ලෝභ, ද්වේශ, මෝහවලට අයිති නම් විතරක් ප්‍රාණ ඝාතයට අහු වෙනවා, චරිත ඝාතනයටත් අහු වෙනවා. මොකද ලෝකයාට අවැඩක් වෙන නිසා. හැබැයි ඒක පර පණ නැසීම නෙවෙයි. පර පණ සහ තමන්ගෙ පණ වෙනස් කරල පෙන්වන්න හේතුව ඒකයි.

භික්ෂූන් වහන්සේ නමක් මිනිස් ප්‍රාණියෙක් නැසුවොත් ඒක පාරාජිකා වෙන්න හේතුවක් වෙනවා. එතකොට මිනිස් ප්‍රාණියෙක් නැසීම පාරාජිකයි කියල, භික්ෂූන් වහන්සේ නමක් තමන්ගෙම පණ නසාගෙන ඒක පර පණ නැසීමට අයිති වෙනවයි කිව්වොත්, ඒ මොහොතෙම පාරාජිකා වෙන්න ඕන. නමුත් පාරාජිකා වෙච්ච කෙනෙකුට ඒ සම්මතයෙ ඉඳල මග ඵල ලබන්න බෑ. එතකොට බුදුන් වහන්සේ වැඩ ඉන්න කාලෙදි තමන්ගෙ බෙල්ල තමන්ම කපාගෙන ඒ මොහොතෙදිම අරිහත් ඵලයට පත් වෙච්ච භික්ෂූන් වහන්සේලාත් වැඩ හිටියා. ☞

ඒ නිසා කෙනෙක් මැරෙන්න (සිය දිවි නසා ගන්න) කැමතියි කිව්වම අහන්න ඕන ඇයි කැමති, මොකක්ද ප්‍රශ්නය කියල. එතකොට ඒ පුද්ගලය තමන්ට තියෙන ප්‍රශ්නය කියනවා. ''මම යාළු වෙලා හිටිය ළමය තරහ වුණා, වෙන කෙනෙක් එක්ක ගියා. මට තිබිච්ච ඉඩම දුන්නෙ නෑ, අම්ම තාත්ත මට විරුද්ධකම් කළා'' මේ වගේ මොනව හරි ප්‍රශ්නයක් උඩ තමයි මැරෙන්න කැමතියි කියන්නෙ. ඒ කියන්නෙ ඒ පුද්ගලයට ලෝභ, ද්වේශ, මෝහ කියන කාරණා නිසා ආපු දුකක් තමයි මැරෙන්න හේතු වෙලා තියෙන්නෙ. දැන් කිව්වොත්, හොඳයි ඒ ප්‍රශ්නය විසඳල දෙන්නම් මොකද කියන්නෙ කියල? දැන් මැරෙන්න කැමති නෑ . අදහස වෙනස් වෙලා. අර තරහ වෙච්ච ළමය යාළු වුනා නම්, ඉඩම ලියල දුන්න නම් දැන් මැරෙන්න කැමති නෑ. එහෙනම් ඒ පුද්ගලයට මරණ බයක් තිබිල තියෙනවා. ඒකයි දැන් මැරෙන්න කැමති නැත්තෙ. නමුත් ඒක අර ප්‍රශ්නය නිසා දෙවැනි තැනට පත් වුණා. එහෙම නැතිව මරණ බය නැති වෙලා නෙවෙයි මේ මැරෙන්න කැමතියි කියන්නෙ.

මේ කාරණය උදාහරණයකින් පැහැදිලි කළොත්, කෙනෙකුට රත්රන් මුද්දක් තියෙනවා. ඒ පුද්ගලය මුද්දට කැමතියි. දැන් ඒ පුද්ගලය කෙනෙකුට ණය වෙච්ච මුදලක් බේරන්නෙ නැතිව ඉන්න කොට, ණය හිමියා ඒ මුද්ද හිලව්වට ගන්න ඒ පුද්ගලයගෙ ඇඟිල්ල කපන්න එනවා. දැන් ඒ පුද්ගලය කැමතියි මුද්ද ණය හිමියට දෙන්න. හැබැයි කැමැත්තෙන් දෙනව නෙවෙයි. නොදී බැරි කමට දෙනවා. ඒ කියන්නෙ ඇඟිල්ල කපල දැම්මොත් ඊට වඩා පාඩුවක් වෙයි කියල රත්රන් මුද්දට තියෙන කැමැත්ත දෙවෙනි කරනවා. එහෙම නැතිව කැමැත්ත නැති කරල නෙවෙයි. දැන් අපොයි මට වෙච්ච දේ කිය කියා හූල්ල හූල්ල ඒක විඳ දරාගෙන ඇඟිල්ල බේරගන්න මුද්ද දෙනවා. එතකොට ඒක දෙන්නෙ කැමැත්තෙන් නෙවෙයි, අකමැත්තෙන්. නමුත් සම්මතයේ කතා කරන කොට කැමැත්තක් කියල දෙයක් මතු පිටින් පේනවා. ඒකට තියෙන ආසාව දෙවෙනි කරලයි ඒ කැමතියි කියන්නෙ. එහෙම නැතිව ඇත්තටම කැමති වෙලා නෙවෙයි.

හොඳයි දැන් අවංකවම ඒ ණය පියවන්න කවුරු හරි ඒ පුද්ගලයට පරිත්‍යාගයක් හැටියට ඒ ණය මුදලේ වටිනාකමට සමාන මුදලක් දුන්නොත් සහ ඒ නිසා දැන් මේ රත්රන් මුද්ද මට දෙනවද කියල තවත් කවුරු හරි ඇහුවොත් ඒකට කැමතිද? අපොයි ඒක නම් කරන්න බෑ කියනවා. ඒ කියන්නෙ ඒ පුද්ගලයට ඒකාන්තයෙන්ම රත්රන් මුද්දට කැමැත්තක් තිබිල තියෙනවා. කලින් ඇඟිල්ල කපන්න එන කොට රත්රන් මුද්ද කැමැත්තෙන් දෙන්න හැදුවෙ නෑ. කැමති වුනේ කර ගන්න දෙයක් නැතිකමට. දැන් හොරේ අහු වෙනවා. නමුත් මෙච්චර කල් ඒ කාරණය සැඟවිලා තිබුණෙ. අන්න ඒ සැඟවීමේ කාරණයත් අනාවරණ ඥානයට අහු වෙනවා. ඒ හැඟවෙච්ච කාරණයත් කෙලින්ම දකින්නෙ ලොව්තුරා බුදුන් වහන්සේ නමක් විතරයි. ඒ නිසා තමයි උන් වහන්සේ දේශනා කළේ, කෙනෙක් කැමැත්තෙන් මැරෙන්නෙ නෑ කියල. සැඟවීමට අනුශයක් තියෙනවා. ජීවත් වෙන්න තියෙන ආසා අනුශයත් බින්දම ඒ පුද්ගලය නැවත උපදින්නෙ නෑ.

සබ්බේ තසන්ති දණ්ඩස්ස - සබ්බේ භායන්ති මච්චුනෝ - සියලු සතුන් දඬුවමට බයයි, මරණයට බයයි. එහෙනම් මරණයට කැමති එක සතෙක්වත් නෑ. හැබැයි රහතන් වහන්සේ කියන්නෙ සත්ව නෙවෙයි. සත් තත්ත්වය ඉක්මවූ කෙනෙක්. ඒ නිසා උන් වහන්සේට මේ කාරණය අදාල නෑ. සත්ව කියන්නෙ පංච උපාදානස්කන්ධය සමග ඉන්න නිසා, ඇලෙන නිසා. රහතන් වහන්සේට පංච උපාදානස්කන්ධයක් නෑ. ඒ නිසා රහතන් වහන්සේට කැමති / අකමැති දෙකම නෑ. මැරෙන්න කැමතියි කියන්නෙත් නෑ, අකමැතියි කියන්නෙත් නෑ. කැමතියි කියනව නම් ඒ පුද්ගලය යමක් බලාපොරොත්තු වෙනවා. රහතන් වහන්සේට බලාපොරොත්තු නෑ. හැබැයි රහතන් වහන්සේ නමුත් දුකට කැමති නෑ. රහත් වෙන්නෙ දුකට අකමැති නිසා. දුකට කැමති නැති නිසා ජීවත් වෙන බලාපොරොත්තුවකුත් නෑ. මොකද ජීවිතයේ තියෙන දුක පූර්ණ වශයෙන් දකල ඉන්නෙ. සැපයි කියන ඒවත් දුකයි කියල ප්‍රඥාවෙන් දැක්ක නිසා උන් වහන්සේ සැපයි කියල අනෙක් ලෝකයා අල්ලන දේවල් අල්ල ගන්නෙ නෑ. හැබැයි මරණය දුකක්, වෙහෙසක් නිසා ඒකට කැමති නෑ.

ඒ නිසා තමයි මුගලන් මහ රහතන් වහන්සේව හොරුන් මරන්න එන කොට තුන් වතාවක් මග හැරල බේරුණේ. හැබැයි ඒ මරණ බයටවත්, ජීවත් වෙන්න කැමැත්තක් තිබුන නිසාවත් නෙවෙයි. මරණ කොට එන කායික වේදනාව දරා ගන්න බැරි නිසා. ඒක දුකක්. අන්තිමට හතර වෙනි වතාවට එන කොට ඒකට මුහුණ දුන්නෙ, වළක්වන්න බැරි කර්ම වේගයක් තියෙනව කියල දැන ගත්ත නිසා. **මෙතනදි රහතන් වහන්සේටත් දුක දැනෙනව කියන්නෙ, සාමාන්‍ය ලෝකයාට දැනෙන දුක නෙවෙයි. මතු විපතක් ගෙන දෙන්න හේතු වන සැප, දුකක් විදියට තමයි උන් වහන්සේ ප්‍රඥාවෙන් දකින්නෙ.** ඒ දුක උන් වහන්සේට දැනෙනවා. ඒ නිසා සංඛාර දුක්ඛ, දුක්ඛ දුක්ඛ, විපරිණාම දුක්ඛ කියන දුක් 3 ම දකිනවා. එතකොට පංචස්-කන්ධයත් මේ දුක් තුනෙන් යුක්තයි. දුක් 3 කින් යුත් පංචස්කන්ධය දරා ගෙන ඉන්න කොට දුකට කැමති නැති නිසා උන් වහන්සේ පංචස්කන්ධයට කැමති නෑ. හැබැයි කවුරු හරි ඒ පංචස්කන්ධය උපක්‍රමිකව මරන්න හැදුවොත් එතනදි කායික වේදනාවකින් එන දුකක් තියෙනවා. ඒකට කැමති නැති නිසයි ඒකෙන් බේරෙන්න උත්සාහ කරන්නෙ. එහෙම නැතිව සාමාන්‍ය ලෝකයා වගේ ජීවත් වෙන්න කැමැත්ත නිසා නෙවෙයි.

''මට වෙච්ච පාඩුව මට දරන්න බෑ. මට හරි වේදනයි. ඉවසන්න බෑ. ඒ නිසා මට මැරෙන්න ඕන. මම මැරෙන්න කැමතියි. අනේ මම ඉක්මනට මැරිල ගියා නම් මේ දුක් විඳින්නෙ නෑනෙ.'' සාමාන්‍ය උදවිය කොච්චරවත් මේ වගේ කතා කියනවා. තමන්ට එන දුක දරා ගන්න බැරි වුනාම තමයි මෙහෙම අදහස් ගන්නෙ. නමුත් මැරෙන්න කැමතියි කියල සම්මතයෙ කතාවට කිව්වට, ඒ ප්‍රශ්නයට විසඳුමක් දීල දුක් වේදනාව නැති කළොත් ? දැන් මැරෙන්න කැමතිද ඇහුවොත්, අනේ බෑ කියනවා. ඒ කියන්නෙ පුද්ගලය දෘෂ්ටියක් හදා ගෙන තියෙනවා, මම මළොත් ඒ වේදනාව දුක එන්නෙ නෑ කියල. ඉතින් ඒ අවස්ථාවෙදි ඒක දරන්න බැරි නිසා, මැරුනොත් මේ දුක වේදනාව නෑ කියල තීරණයක් ගන්නවා. එතකොට දරන්න බැරි වේදනාව තියෙන්නෙ ජීවත් වෙලා ඉන්න කල්නෙ කියල අදහස් ගන්නවා. මරණින් පස්සෙ ඔක්කොම ඉවරයි කියල තමයි හිතාගෙන ඉන්නෙ. මෙහෙම අදහස් අරගෙන ඒ පුද්ගලය ජීවත් වෙන ආසාව දෙවෙනි කරනවා. නැති කරනවා නෙවෙයි. නැති කරන්නෙ රහතන් වහන්සේ විතරයි, ඊට මෙහා ඉන්න කවුරුවත් ඒක නැති කරල නෑ. හැම වෙලේම ජීවිත ආසාව දෙවෙනි කරල, දරා ගන්න බැරි කමට තමයි සිය දිවි නසා ගන්න පෙළඹෙන්නෙ. ඒ නිසා කෙනෙක් මැරෙනව නම් මැරෙන්නෙ, යම් බලාපොරොත්තුවක් ඉටු කර ගන්න බැරි වීම නිසා ජීවිතය දෙවෙනි කිරීමෙන්. ඒ සිය දිවි නසා ගැනීම, ප්‍රාණ ඝාත අකුසල කර්මයක්ද නැද්ද කියල තීරණය වෙන්නෙ, ලෝභ ද්වේශ මෝහ කියන කාරණා 3 උඩ.

***වැහරක අභයරතනාලංකාර හිමිපාණන් විසින් දේශිත සැඟවුණ දහම් කරුණු ඇසුරින් සකස් කළේ :***

**නීතිඥ චන්දන සිරිවර්ධන**

# කට හඬේ ගොතය යථා තත්ත්වයට පත් කර මිහිරි කට හඬ ඇති කරන ප්‍රත්‍යක්ෂ ඔසුවක්...

වහරක අභයරතනාලංකාර හිමියන්ට බේත් සමාධියෙන් හසු වූ තවත් වටිනා ඖෂධයක් තමයි මේ හෙළිදරව් කරන්නෙ. සමාජයේ සමහර අය වචන කතා කරන කොට පැටලෙනවා, ගොත ගැහෙනවා, බොහොම අමාරුවෙන් තමයි කතා කරන්නෙ. පෙළක් අයගෙ කට හඬ එන්නෙම නෑ. එහෙම්ම හිර වෙලා තියෙනවා. මේ හේතුව නිසා සමාජය ඉදිරියේ ඒ අය බොහොම අපහසුතාවයට පත් වෙන අවස්ථාත් තියෙනවා. උගුරෙ තියෙන ග්‍රන්ථිවල ආබාධ හිටියම ඒ වගේ තත්ත්වයන් එනවා. කන් පෙත්ත අග තද කළාම ඇතුල් පැත්ත කම්මුලට හිටින ස්ථානයේ තමයි මේ හා සම්බන්ධ නිල පිහිටන්නෙ. ඒ වගේ නිල ස්ථාන දෙකක් කන් දෙක දෙපැත්තෙම පිහිටනවා. අන්න ඒ නිල දෙක තමයි මේ සම්බන්ධයෙන් බලපාන්නෙ. මේ ස්ථානයේ ඒ නිල පිහිටල තියෙන බවට සාක්ෂියක් තමයි කන් පෙත්ත අග කම්මුලට තියල තද කළාම එක පාරටම උගුර හිරවීමක්, කැස්සක් වගේ තත්ත්වයක් ඇතිවීම.

කතා කරන කොට කන්වල සම්බන්ධයත් එක්තරා මට්ටමකට බලපෑම් ඇති කරන බව ඔප්පු කරන්න පුළුවන් අවස්ථාවක් තමයි, යම් විදියකට උපතින්ම ගොළු අය, එහෙම නැත්නම් ආබාධයකින් ගොළු බවට පත්වෙච්ච අයගෙ කන් ඇසීමත් අඩුයි, එහෙම නැත්නම් ඇහෙන්නෙම නෑ. කන සහ උගුර අතර සම්බන්ධයක් තියෙන බව එයින් තහවුරු වෙනවා. මේ නිල ස්ථාන දුර්වල වීම නිසා කතා කරන්න අවශ්‍ය ඉන්ද්‍රිය පද්ධතියෙත් දුර්වලතා ඇති වෙනවා. එතකොට ඒවායේ තියෙන අපද්‍රව්‍ය සුද්ධ වෙන්නෙ නැතිව හිර වෙනවා. මෙන්න මේ නිල දෙක ක්‍රියාත්මක වුනාම එක්තරා හෝමෝනයක් නිපදවෙනවා. ඒ හෝමෝනයෙන් ඉන්ද්‍රිය පද්ධතිය නැවතත් සක්‍රීය කරනවා. එතකොට නැවතත් කට හඬ ප්‍රකෘති වෙනවා, දිව කට ප්‍රාණවත් වෙනවා, ග්‍රන්ථි යථා තත්ත්වයට පත් වෙනවා. හැබැයි මේ තත්ත්වය සුළු ලෙඩක් වුනාට, ස්නායු ප්‍රබෝධ කරන්න හේතු වෙන ග්‍රන්ථි හඳුනන්නෙ නැතිකමින් මේ කාලෙ වෙන කොට මේක මහ ලෙඩක් බවට පත් වෙලා තියෙනවා.

ශරීරයේ තියෙන හුඟක් හෝමෝන නිපදවෙන්න නිර්නාල ග්‍රන්ථිවලින්. ඒ ග්‍රන්ථි කොහේ තියෙනවද කියල හොයන්න බෑ. අති සියුම් තැන්. ඒ ස්ථාන උත්තේජනය වුනාම තමයි ඒ ග්‍රන්ථි ක්‍රියාත්මක වෙලා හෝමෝන නිපදවෙන්නෙ. ඒ ඒ ඉන්ද්‍රියන් ප්‍රබෝධමත් කරන්න නම් ශරීරයේ හෝමෝන නිපද වීමක් සිද්ධ වෙන්න ඕන. ඒවා ශරීරයේ තැනින් තැන පිහිටල තියෙනවා. කට හඬට සම්බන්ධ වෙන ග්‍රන්ථිය පාලනය වන නිල



ස්ථාන තමයි අර කන් පෙත්ත අග තද කළාම කම්මුල් දෙපැත්තෙ පිහිටනව කිව්වෙ.

යම් කිසි ආකාරයකට සමහරුන්ගෙ කන සැත්කමකට භාජනය කළාම මේ නිල ස්ථාන සම්බන්ධ වන ස්නායු කැපෙන්න පුළුවන්. එතකොට කටේ පැත්තක් පණ නැති වෙනවා, කන් මුලේ ඉඳන් ඒ පැත්තම පණ නැති වෙන්න පුළුවන්. දිවේ පැත්තක් පණ නැති වෙනවා. කම්මුලේ මස් පිඩු එල්ලෙන්න ගන්නවා, පාලනය කර ගන්න හරි අමාරුයි. මොකද සැත්කම්වලදී සියුම් තැන් නොපෙනෙන නිසා කැපිල යන්න පුළුවන්. ඒ වගේ අවස්ථාවකදි ස්නායුත් හුඟක් වෙලාවට කැපිල යන්න පුළුවන්. ඒ ඉන්ද්‍රිය විතරක් නෙවෙයි, ඒ ආශ්‍රිතව තවත් ඉන්ද්‍රියන් තියෙනවා. ඒවා මුහුණෙ මස් පිඩුවලටත් සම්බන්ධයි. ඒ ස්නායු කැපුනොත් තොල් පොට ඇද වෙනවා, කට ඇද වෙනවා, ඇස් පියවන්න බැරි වෙනවා. අංශ භාගය හැදුනමත් මේ ඉන්ද්‍රිය අක්‍රිය වීම නිසා තමයි කට හඬ ගොත වෙන්නෙ. සමහර අයට කන සම්බන්ධ සැත්කම්වලට භාජනය වෙද්දි ඒ වගේ තත්ත්වයක් ඇති වෙන්න පුළුවන්. ඒ නිසා කනේ ආබාධ තිබ්බ්ච අයගෙ අති සියුම් ස්නායු හිර වෙන තරමට ඔඩු දුවල තිබුනෙ නැත්නම්, ඒ වගේ ආබාධ දුරු කරන්නත් මේ වටිනා පුංචි බේත ප්‍රත්‍ය වෙනවා.

මේ බේත හදන්න ගන්නෙ කෝපි දළු සහ එඬරු තෙල්. කෝපි දළු කිලෝ ග්‍රෑම් එකකට එඬරු තෙල් මිලි ලීටර් 350 ක් තමයි අනුපාතය විදියට ගන්නෙ. නමුත් තමන්ට එච්චර ප්‍රමාණයක් හොයා ගන්න බැරි නම් සහ අවශ්‍ය නැත්නම්, ඒ අනුපාතය එන විදියට අමු ද්‍රව්‍ය අඩු කරල කැමති ප්‍රමාණයකින් ගන්න පුළුවන්. මෙතනදි කෝපි දළු එඬරු තෙල්වලින් අඹරල ඒ රොඩ්ඩත් එක්කම එන ද්‍රාවණය මඳ ගින්නෙන් තරමක් උකු වෙනකල් රත් කර ගන්න ඕන. වායු උදුනක රත් කර ගත්තත් ගැටළුවක් නෑ. දැන් මේක තමයි ඖෂධය වෙන්නෙ. හැබැයි වැඩිපුර හදල හුඟක් කල් තියා ගන්නව නම් විතරයි මේ විදියට හදාගන්න ඕන. තමන්ට විතරක් එවෙලෙම පාවිච්චි කරන්න ගන්නව නම් මේ විදියට අනුපාතයක් ඕනත් නෑ, රත් කරන්න ඕනත් නෑ. කෝපි දළු, එඬරු තෙලින් අඹරගෙන ලාටුව වගේ හදා ගත්තම පාවිච්චි කරන්න පුළුවන්. ශීතකරණයක දාල දින ගණනාවක් තියා ගන්නත් පුළුවන්.

දැන් මේක පාවිච්චි කරන ක්‍රමයක් තියෙනවා. කනට වඩා අඟල් 2 ක් විතර ලොකු පිරිසිදු රෙදි කෑල්ලක් අර ගෙන කන් පෙත්ත ඇතුල් කරල පිටතට ගන්න පුළුවන් ප්‍රමාණයට සිදුරක් ඒ රෙදි කෑල්ලෙ කපා ගන්නවා. ඊට පස්සෙ ඒ සිදුර වටා රෙදි කෑල්ලෙ අර බේත් හොඳින් ආලේප කරල ඒක කන වටේට ප්ලාස්ටරයක් වගේ දා ගන්නවා. මෙතනදි කනට ඉහළින් ☞

වටේට තියෙන කෙස් ටිකක් බූ ගාල ඉවත් කළොත් බේත ප්‍රත්‍ය වෙන්න වඩාත් පහසු වෙනවා. මොකද එතනින් එන හෝමෝන, චක්‍ර විදියට තමයි කන වටේට ක්‍රියාත්මක වෙන්නෙ. එහෙම ගිහින් තමයි අර නිල ස්ථාන උත්තේජනය කරල කට හඬ යථා තත්ත්වයට පත් කරන්නෙ. මේ විදියට දවසකට වරක් උදේ බේත ගල්වල අවම වශයෙන් පැය 5 ක් විතර තියෙන්න ඕන. ඊට වඩා වැඩි වුනාට කමක් නෑ. ඊට පස්සෙ ඒක ඉවත් කරල නා ගන්න හෝ හෝද ගන්න පුළුවන්. ඒ විදියට කන් දෙකටම එක විට මේ බේත ගල්වන්න ඕන. එහෙම මාසයක් විතර එක දිගටම කළාට පස්සෙ ඒ තිබිච්ච ආබාධ තත්ත්වයන් දුරු වෙලා කට හඬ යථා තත්ත්වයට පත් වෙනවා. කන් ඇසීමේ දුර්වලතා තිබුණ නම් ඒවත් සුව වෙනවා.

සටහන

**නීතිඥ චන්දන සිරිවර්ධන**

# හෙළ බොදු පියුම දහම් සඟරාවේ 42 වන කලාපය සඳහා ශ්‍රමය හා මූල්‍යමය දායකත්වය සැපයූ පිංවතුන්

**ශ්‍රම දායකත්වය** -

♦ ධම්මික සේනාධීර මහතා - නෙක්මෝ කම්පියුටර්ස් ආයතනය - මාලබේ ♦ අසංග මංජුල කුමාර මහතා - හෝමාගම ♦ සමන් සිල්වා මහතා - කළුතර ♦ චන්දන සිරිවර්ධන මහතා - අලපලාදෙනිය ♦ ෆික්රි ඉස්මයිල් මහතා - ගොතටුව ♦ එස්.එම්. ජයසේකර මහතා - මාලබේ ♦ පර්ෆෙක්ට් කම්පියුටර් ආයතනයේ කාර්ය මණ්ඩලය - පිටකෝට්ටේ ♦ ඉමාෂි මුද්‍රණාලයේ අධිපතිතුමා ඇතුළු කාර්ය මණ්ඩලය ♦ නන් අයුරින් දායක වූ පින්වතුන්

**මූල්‍යමය දායකත්වය** -

♦ සමන් සිල්වා මහතා - කළුතර - රු. 20,000/- ♦ ප්‍රියනාත් ආරියරත්න මහතා ඇතුළු පවුලේ සැම - කුරුණෑගල - රු. 10,000/- ♦ තුසිත නාකන්දල මහතා, සරූපා නාකන්දල මහත්මිය, දෙවින්යා දුව - ගල්කිස්ස - රු. 10,000/- ♦ අමිත් හඳුගොඩ මහතා ඇතුළු පවුලේ සැම - අත්තිඩිය - රු. 5,000/- ♦ ගයාන් පුෂ්පික ඉන්ද්‍රජිත් ලොකුමාන්න මහතා, ඉරෝෂා ලොකුමාන්න මහත්මිය, සෙනුත් ලොකුමාන්න පුතා - ගල්කිස්ස - රු. 5,000/- ♦ සොනාලි සමරදිවාකර මෙනවිය - මහරගම - රු. 5,000/- ♦ සුභාෂ් රණසිංහ මහතා - මගලෙගොඩ - රු. 5,000/-♦ අරුණ ජයසේකර මහතා - තිඹිරිගස්යාය - රු. 5,000/- ♦ අමිල සල්ගාදු මහතා - බෝමිරිය - රු. 5,000/- ♦නිර්මලා මල්කාන්ති මහත්මිය, රංජිත් පුෂ්පකුමාර මහතා සහ දුවින්දි ඔපේකා දුව - අළුත්ගම - රු. 5,000/- ♦දුෂ්මන්ති සපරමාදු මෙනවිය ඇතුළු පවුලේ සැම - කොච්චිකඩේ - රු. 5,000/- ♦ ජනක රුවන් මහතා - ගරාඬුව, මාතර - රු. 4,000/- ♦ ඩබ්. උපුල් පරාක්‍රම සිල්වා මහතා - මාරවිල - රු. 4,000/- ♦ ජනක හපුආරච්චි මහතා ඇතුළු පවුලේ සැම - ගිනිගත්හේන - රු. 3,000/- ♦ කරගම්පිටිය ශාස්ත්‍රානන්ද පිරිවෙන් විහාරස්ථානයේ සදහම් වැඩසටහනට සහභාගි වන පින්වතුන් - රු. 3,000/- ♦ කේ.එම්. සමන්ත ප්‍රදීප් මහතා - කඹුරුගමුව - රු.3,000/- ♦ ටී.ටී.පී. සිල්වා මහත්මිය - නාගොඩ කළුතර - රු.2,500/- ♦ ඔස්ටින් ප්‍රනාන්දු මහතා - පොල්ගහවෙල - රු. 2,000/- ♦ ජයනාත් සුහසිංහ මහතා - හෝමාගම - රු. 2,000/- ♦ ඩිලානි ඩයස් මහත්මිය ඇතුළු පවුලේ සැම - නාවින්න - රු. 2,000/- ♦ පසන් දිලීතා අනුසරී මෙනවිය, චම්පා එරන්දතී මහත්මිය - ශාන්ත ගේබ්‍රියල් බා.ම.වි. හැටන් - රු. 2,000/- ♦ නෙසඳු නිදුවර පුතා සහ දසිත්මා අනුසරී දුව - හෝමාගම - රු. 2,000/- ♦ මීගොඩ පියුමි නිරෝෂා ගුරුසිංහ මහත්මියට පින් පිණිස - රු. 2,000/- ♦ අයිරාංගනී තිලකරත්න මහත්මිය - නාවල - රු. 1,500/- ♦ ඩී.ඩී. විතාරණගේ මහතා ඇතුළු පවුලේ සැම - නුගේගොඩ - රු.1,500/-♦ සකුන්තලා ඒකනායක මහත්මිය - බත්තරමුල්ල - රු.1,500/- ♦ සිසිර චන්ද්‍රරත්න මහතා - පිළියන්දල - රු. 1,500/- ♦ කොළඹ 3 හේමාස් ආයතනයේ රංග, මනෝජ්, ගයාන්, ප්‍රියන්ත යන මහත්වරුන් - රු.1,300/- ♦ රිකිල්ලගස්කඩ සහ දිඹුල්කුඹුර ගම්වාසීන් - රු. 1,100/- ♦ ගයාන් ගුණරත්න මහතා ඇතුළු පවුලේ සැම - ගොතටුව - රු. 1,000/- ♦ රේණුකා ගුණරත්න මහත්මිය ඇතුළු පවුලේ සැම - ගොතටුව - රු. 1,000/- ♦ ඉන්ද්‍රානි විසාකා ජයසිංහ මහත්මිය - බොරලැස්ගමුව - රු.1,000/- ♦ වයලට් වික්‍රමාරච්චි මහත්මිය - කටුබැද්ද - රු. 1,000/- ♦ ඉරේෂා ඇන්ඩෘ මහත්මිය, ප්‍රනීෂා නයෝමි මහත්මිය සහ සරත් චන්ද්‍රසිරි ඇන්ඩෘ මහතා - හෝමාගම - රු. 1,000/- ♦ ෂවීන් ශ්‍රී ජයවර්ධන පුතා ඇතුළු පවුලේ සැම - මාලබේ - රු. 1,000/- ♦ ශ්‍යාමල් බණ්ඩාර මහතා - කුරුණෑගල - රු. 1,000/- ♦ නදීශා හර්ෂනී ලියනගේ මෙනවිය - කළුබෝවිල - රු.1,000/- ♦ එරංග ලියනගේ මහතා සහ බිසන්තිකා ගුණසේකර මහත්මිය - කළුබෝවිල - රු. 1,000/- ♦ නිහාල් ලියනගේ මහතා සහ චිත්‍රා ශ්‍රේරු මහත්මිය - කළුබෝවිල - රු. 1,000/- ♦ අමිත් සමරනායක මහතා - බෙල්ලන්තර - රු.1,000/- ♦ නිශාන්ත නානායක්කාර මහතා - පාමංකඩ - රු. 1,000/- ♦ එස්. ප්‍රසන්න ප්‍රියදර්ශන සිල්වා මහතා - ගල්කිස්ස - රු. 1,000/- ♦ නුවන් යාපා අමරසේකර මහතා - රදාවාන - රු. 1,000/- ♦ සී.එම්.පී.සී. ලක්රුවන් මහතා - කළුතර - රු. 1,000/- ♦ අසංග සෙනරත් අඹගල මහතා - රදාවාන - රු.1,000/- ♦ රත්න පෙරේරා මහතා ඇතුළු පවුලේ සැම - කැස්බෑව - රු. 1,000/- ♦ චන්ද්‍රා පෙරේරා මහත්මිය සහ ඉසුරු උදාන වික්‍රමසූරිය මහතා - පානදුර - රු.1,000/- ♦ කසුන් තාරක වික්‍රමසූරිය මහතා සහ සිතුමිණි ප්‍රබෝධා මහත්මිය - පානදුර- රු.1,000 ♦ චන්දිම දාස්වත්ත මහතා - දොම්පෙ - රු.1,000/- ♦ ෂෙහානි බස්නායක මහත්මිය - මත්තෙගොඩ - රු.1,000/- ♦ ඩබ්. සුසිල් ආනන්ද මහතා - පාදුක්ක - රු.1000/- ♦ එච්.ඒ. ගුණවතී මහත්මිය - පිටිපන - රු.1000/- ♦ පී.ඒ. ආරියතිලක මහතා - හොරණ - රු.1000/- ♦ කේ.ඒ.පී. නිශානි කළුබෝවිල මහත්මිය - වේයන්ගොඩ - රු.1000/- ♦ අසංක ප්‍රේමතිලක මහතා - මරඳගහමුල - රු.1000/- ♦ වෙරංග තරිඳු පෙරේරා මහතා - පිළියන්දල - රු.1000/- ♦ මාලිනී සිරිමාන්න මහත්මිය - රදාවාන - රු.1000/- ♦ ශානිකා තුෂාරි වලිසිංහ මහත්මිය - රු.1000/- ♦ පී. රුවිනා දීපානි මහත්මිය - පිටකෝට්ටේ - රු.1000/- ♦ දයා ගමඇතිගේ මහත්මිය ඇතුළු පවුලේ සැම - පිටකෝට්ටේ - රු.1000/- ♦ ඉෂාන් උඩුවන මහතා - හෝමාගම - රු.1000/- ♦ උදිත රුහුණගේ මහතා - හෝමාගම - රු.1000/- ♦ වික්‍රමසිංහගේ ශාලිකා හර්ෂනී මහත්මිය - ඇඹිලිපිටිය - රු.1000/- ♦ දර්ශන පෙරේරා මහතා - පිළියන්දල - රු.1000/- ♦ කේ.ඒ. උදිත පෙරේරා මහතා - කොළොන්නාව - රු.1000/- ♦ කුසුමා වාහලතන්ත්‍රී මහත්මිය - දිගන, මහනුවර - රු.1000/- ♦ ඒ.ජී.ඩී.එම්. තිලකරත්න මහතා - ගොඩකවෙල - රු. 1000/- ♦ ඩබ්. චන්ද්‍රරත්න මහතා - පාදුක්ක - රු.1000/- ♦ ගාමිණී ලියනගේ මහතා සහ නයෝමි ලියනගේ මෙනවිය - නැදිමාල - රු.1000/- ♦ ඉෂාන් විමුක්ති දසනායක පුතා - උඩුවන - රු.1000/- ♦ එම්.ජී. අනෝමා ප්‍රියදර්ශනී මහත්මිය, රන්දුනු වාල්මිකී රූපසිංහ මහතා, තප්ති කනකාංජලී රූපසිංහ මෙනවිය - නාරාහේන්පිට - රු.1000/- ♦ නවිනි මහත්මිය - හුළංදාව - රු. 1,000/- ♦ එම්.ඩී. ඇලෝසියස් මහතා, මේරි බියට්‍රිස්

මහත්මිය, එල්. ටී. විජේමුනි මහතා, හයසින්ත් ශ්‍රියාලතා මහත්මිය, දුලිප් ප්‍රනාන්දු මහතා, අජිත් රෝහණ මහතා - ජාඇල - රු.6,000/- ♦ රංජිත් වික්‍රමසිංහ මහතා, පද්මාවතී වික්‍රමසිංහ මහත්මිය, පී.එම්. ගමගේ මහත්මිය, සුභාෂිනි දිසානායක මහත්මිය - කඩිගමුව, උපුල් විජේනායක මහතා - මාවනැල්ල, මනෝජ් ජයසූරිය මහතා, උදාන ආරියවංශ මහතා - මහරගම, ඉසුරු සම්පත් මහතා - කළුතර, චන්දිම ගුණදාස මහතා - මොරටුව, දුමින්දා සංජීවනී මහත්මිය - නිට්ටඹුව, කුමාරි ගොඩවිට මහත්මිය, හෙසඳ සත්කුමාර පුතා - කුරුණෑගල, ශ්‍රී රංජිත් සිංහ මහතා - කැළණිය, යමුනා උඩුමලගල මහත්මිය - පිළියන්දල, රසික තුශාන්ත මහතා - හෝමාගම, චතුර මල්වාන මහතා - කෑගල්ල, රංජිත් පතිරණ මහතා - කුරුණෑගල, එම්.ආර්. බන්දුල සේනාරත්න මහතා- රඹුක්කන, සිසිර කුමාර සමරදිවාකර මහතා - එල්ලක්කල, තිස්ස අතාවුද මහතා - ජාඇල, එස්. පද්මලතා මහත්මිය - යටවක, චතුර සම්පත් ධනංගල මහතා - ගලගෙදර, ඩී.කේ. විජේසූරිය මහතා - අළුබෝමුල්ල, එම්.ඩී. තිලකරත්න මහතා - වැලිපැන්න, ජී. ජයලත් මහතා - පන්නිපිටිය, ආරියවතී මල්වත්ත මහත්මිය - ඇල්පිටිය, දමයන්ති පෙරේරා මහත්මිය - අත්තිඩිය, යසස්මි සිරිවර්ධන දුව සහ පසන් සිරිවර්ධන පුතා, දමයන්ති ලියනගේ මහත්මිය - කිඹුලපිටිය - රු. 11,400/- ♦ එකතු වූ සියලු මුදල් පරිත්‍යාග- රු. 180,300/- ♦ පළමු පිටපත් 10000 සඳහා මුද්‍රණ වියදම රු. 232,500/- ♦ අනෙකුත් වියදම් - 21,370/- ♦ සම්පූර්ණ වියදම - රු. 253,870/- මුද්‍රණ කටයුතු සඳහා ගිය හිඟ මුදල සඟරා අලෙවියෙන් පියවා ගන්නා ලදී. සඟරා අලෙවියෙන් ලැබෙන ඉතිරි සියලු මුදල් නැවත මුද්‍රණ කටයුතු ඇතුළු දහම් කටයුතු සඳහා යොදවනු ලැබේ.

**ඉහත නම් සඳහන් පිංවත් පිරිස ඇතුළු ආධාර උපකාර කළ සියලු දෙනා සිදු කරගත් මේ පුණ්‍ය කුසල ආශිර්වාද හේතු කොටගෙන, අනන්ත සසරේ පටන් මේ දක්වා තම තමන් අතින් අවැඩ, අසාධාරණ, වැරදි, ප්‍රමාද දෝෂවලට ලක් වූ සියලු දෙනාට මෙන්ම උදව් උපකාර කළ සැමටත්, මියගිය සතර වරිගයක ඥාති මිත්‍රාදීන්ටත් මේ පුණ්‍ය කුසල ආශිර්වාද විහිදී පැතිරී පිහිටා සුඛිත මුදිත වෙත්වා, සුගතිගාමීව තම තමන්ගේ පැතුම් පරිදි නිර්වාණාවබෝධයටද හේතු වාසනා වේවා! එම ආධාර උපකාර කළ පිංවත් පිරිස් ඇතුළු සිය පවුල්වල සැමටත්, කරන කියන යහපත් රැකී රක්‍ෂා ව්‍යාපාර ආදියෙන් සියලු ජයග්‍රහණයන් අත් වේවා. දූ දරුවන්ගේ අධ්‍යාපන ආදී කටයුතුවලින් විශිෂ්ඨ ජයග්‍රහණ අත් වී සුචරිත පිරිසක් වී සියලු අභිවෘද්ධිය උදා වේවා!**

## සියවස් ගණනාවකට පෙර සැඟව ගිය නිමල බොදු මග යළි පුබුදුවමින්,

**හෙළ බොදු පියුම දහම් කරුණු ඔබ වෙත රැගෙන එන්නේ, බුදු පියාණන් වහන්සේ අනුදැන වදාළ, අග්ගඤ්ඤ සූත්‍රය, නිරුත්තිපථ සූත්‍රය සහ අරණවිභංග සූත්‍රය යන සූත්‍රාන්තයන්ට අනුව, දහම් පදවල සැඟවුණු දහම් අරුත් මතු කරන පද නිරුක්ති සහ අතීතය, වර්තමානය, අනාගතය හඟවන තුන්කල් නිරුක්ති සහිත ව්‍යවහාර ශබ්ද නිරුක්ති ක්‍රමවේදය අනුව මිස, උන්වහන්සේ අනුමත නොකළ ලිඛිත භාෂා රීති සහිත බමුණන්ගේ ත්‍රිවේද නිරුක්ති මත නොවන බව සලකන්න.**

**පින්වත් ඔබ වෙනුවෙන් එළි දැක්වූ දහම් ගබඩාවන්...**

www.hiddendhamma.net mp3.hiddendhamma.net www.helabodhupiyuma.net www.aaryadharma.org
විද්‍යුත් ලිපිනය: webmaster@helabodhupiyuma.net දු.අ:- 071 3046895

**දම් සභා ගුවන් හඬ** - www.waharaka.com වෙබ් අඩවිය ඔස්සේ පුර සහ අමාවක පොහොය දිනයන්හි උදෑසන 8.00 සිට සවස 5.00 දක්වා

**සැඟවුණු බොදු මග යළි විවර කරමින් වහරක අරිය චින්තාශ්‍රම බෞද්ධ විහාරස්ථානයේ සදහම් වැඩසටහන් පැවැත්වෙන කාල හෝරාවන්:**

සෑම පුන් පොහෝ දිනකම සහ සෑම අමාවක පොහොය දිනකම උදෑසන 8.00 සිට සවස 5.00 දක්වා - පෙහෙවත් සමාදානය, දහම් සාකච්ඡා සහ විශේෂ පුණ්‍යානුමෝදනාව.

ගමන් මාර්ගය: නිට්ටඹුව - රුවන්වැල්ල ප්‍රධාන මාර්ගයේ ගෝණගල්දෙනිය හන්දියේ සිට වහරක අතුරු මාර්ගයේ මීටර 350 ක් පමණ දුරින් දකුණු පස.

## හෙළ බොදු පියුම දහම් සඟරාවේ පසුගිය කලාපයන් ඇතුලු සියලු කලාපයන් දැනට ලබාගත හැකි ස්ථාන:

1. ඩී. සී. ආර්. ඇක්සස් මුද්‍රණාලය - 33, තලවතුගොඩ පාර, පිටකෝට්ටේ
2. නෙක්මෝ කම්පියුටර්ස් ආයතනය - මාලබේ.
3. නිව් පියුමි කොමිනිකේෂන් - පීරිස් මාවත, කළුබෝවිල - 0773742023
4. තුෂාරා ෆැෂන් - හයිලෙවල් පාර, හෝමාගම.
5. පිනැකල් නෙට් - ශානි ඉන්ස්ටිටියුට් - හයිලෙවල් පාර, ගොඩගම
6. තුෂාරි සාරි සෙන්ටර් - කොළඹ පාර, පාදුක්ක.
7. සුජය ෆාමසි - කටුබැද්ද හංදිය, මොරටුව.
8. ගේට්වේ අධ්‍යාපන ආයතනය - කලේගාන, ගාල්ල.
9. සමනල පොත්හල - නෙළුව.
10. නිව් මෙට්‍රෝ කම්පියුටර්ස් - කාලිදාස මාවත, මාතර
11. මෝලෙ කඩේ - මුදුන, වලස්මුල්ල.
12. කේ. පී. ස්ටෝර්ස් - ගන්තුන, කෑගල්ල.
13. ලසන් ට්‍රේඩ්සෙන්ටර් - 8, අලුත්ගොඩ පාර, තිස්සමහාරාමය - 0718523556
14. නුගේගොඩ නාලන්දාරාම විහාරස්ථානයේ සදහම් වැඩසටහනින් (ඉරිදා උදේ 9.00 සිට සවස 2.00 දක්වා පමණි.) (0773742023)
15. දෙහිවල කරගම්පිටිය ශාස්ත්‍රානන්ද පිරිවෙන් විහාරස්ථානයේ සදහම් වැඩසටහනින් (සෙනසුරාදා උදේ 8.30 සිට සවස 2.00 දක්වා පමණි) (දෙහිවල පොලිස් ස්ථානය අසල) - 0713228571
16. සරසවි පොත්හල - 330/ඒ, ගාලුපාර, අළුත්ගම - 0773474081

**තැපෑලෙන් ගෙන්වා ගැනීම සඳහා විමසන්න - ඩී. සී. ආර්. ඇක්සස් මුද්‍රණාලය - අංක 33, තලවතුගොඩ පාර, පිටකෝට්ටේ - 0777794676**

***ඉහත ආයතන හිමි පින්වතුන් මෙම සද් කාර්ය ඉටු කරනු ලබන්නේ කිසිදු වෙළඳ ලාභයකින් තොරව සාසනික කටයුත්තක් වශයෙන් පමණි.***



# දුලබව දකින නිරිඳෙකු හමු විය එතෙරින්...









දුක්පත් කිවත් ලෝ සම්මත යස ඉසුරින්
දැක්මක් තිබුණි ඔහු දුටු මේ ලොව කතරින්
ඉක්මන් නොවී බලයට ධනයට ඇසුරින්
නික්මුණු පුවතකිය ජන නිරිඳෙකු එතෙරින්

දන් පින්වලට තම වැටුපද යෙදූ පුවත
ඉන් ජන මනස දම් රංජනයට යවත
රැන්දුව සරල බව ගොවියෙකු ලෙස වචත
දැන් හැම දෙනද ඔහු කියවිය යුතු නැවත


මුල අමතක කරන රජවරු නොදුටු තුටු
මිල වැඩි දිවි පෙවෙත දුක්පත් ලෙසට දුටු
කුල මළ ධනය බලයද නිල තලද කටු
පළ විය ඔහුගෙ මුවගින් ලෙස ගලක කෙටු

තම වැඩ තමන් කරගෙන දැසි දසුන් නොදා
ගමනට අවැසි පමණට රැකවලුන් යොදා
සැමටම ධනය සම්පත එක ලෙසින් බෙදා
නිම කළ ධූරය කදිමයි යහ දමින් මෙදා

තිර නැති නැවතුමක හිඳ රජකම් කළද
මරණය එන විටදී එයි කළ කම් එලද
අරගෙන යන දෙයක් මතු නැති නම් වැළඳ
සැරසිය යුතුය හරිනට ලොකුකම් මළද

ජන මන රංජනය කරනා රජ නාමේ
දැන ගෙන හිටිය විලසකි දහමට පේමේ
බණ මහ මුනිඳු නොවුවත් එරටෙහි සාමේ
දිනවන මගක් විය මතු නිවනට යැමේ

පැත්තක් නොගෙන සැලකිය යුතු මෙවැනි පුවත්
ඇත්තක් වෙනම් පැසසිය යුතු තැනකි තවත්
නැත්තෙක් නොවී නැති එකෙකුන් විලස ගෙවත්
පොත්තක් ලෙසට දුටු රජකම දහම දෙවත්



“මා ලෝකයේ දුප්පත්ම ජනාධිපති කියල හැඳින්වෙනවා. නමුත් මම ඊට එකඟ නෑ. දුප්පත් මිනිස්සු කියන්නෙ මිල අධික ජීවන ක්‍රමයක් පවත්වාගෙන යන්න තව තවත් මුදල් කියමින් හරි හම්බ කිරීමට වෙහෙසෙන අයට කියලයි මම විශ්වාස කරන්නෙ. ඔබ සතුව බොහෝ දේ නැත්නම්, ඒවා සතු කරගෙන පවත්වා ගෙන යන්න ජීවිතය පුරාම වහලෙක් වගේ වැඩ කරන්න අවශ්‍ය නෑ. එතකොට ඔබ වෙනුවෙන් යොදා ගන්න ඔබට ඕනෑ තරම් කාලය තියෙනවා.”

උරුගුවේ ජනාධිපති - හෝසේ මුජිකා

පබැඳුම
නීතිඥ චන්දන සිරිවර්ධන

# දිය හැලියේ සැණකෙළියේ...



පස් කම් සැපයෙහි රස    විඳිනා
දස් කම් ලෙස තරඟෙට    හැඳිනා
හිස් වෙයි කෙටි කලකදි    නොදිනා
දොස් මැයි ලොව ගත් විට    සොඳිනා



ලොව නම් දිය හැළියකි    රත් වේ
තව මොහොතින් මරණෙට    පත් වේ
භවයෙන් භවයට සත    මත් වේ
සුව ලෙස ගත හොත් දුක    අත් වේ



නැටුවට කම් නැත දැන    එලය
වැටුනම රත් වෙයි දිය    කළය
කැටුවම මරණෙට යන    තලය
දුටුවෙද රත්  ජලයෙහි    බලය



කකුළුවෙකුගෙ රඟ දිය    හැළියේ
දැකුමට හැකි නම් නැණ    එළියේ
ලොකුවට කරනා ලොව    කෙළියේ
විකුමන් නැති වෙයි භව    සුළියේ

සැණකට කෙළිනා සැණ    කෙළියෙන්
මනසට ලැබුනද සුව    කලියෙන්
වනසට යන විට මර    බිලියෙන්
තැනකට ගෙන යයි කම්    සුළියෙන්

රත් වූ භව කතරෙහි    නටනා
මත් වූ නරයින් දෙන    සටනා
අත් පා ආයුධ ලෙස    ගටනා
පත් වී මරණෙට යළි    කොටනා

දිග කල විඳ විය යුතු    දුකටා
වග නැති ලෙස බැඳි කෙටි    සැපටා
මගදිම අහු වෙන මරු    කටටා
සැඟවිය නොහැකිය පෙර    ලෙසටා

සැණකෙලියක් ලෙස දකින    සැපා
වැනසෙත් යෙදුවත් කුමන    උපා
බණ දම් නැති ලෙස සිටිනු    එපා
දින දින යයි පහළටම    අපා



පබැඳුම
නීතිඥ චන්දන සිරිවර්ධන

නීතිඥ චන්දන සිරිවර්ධන විසින් නුගේගොඩ ගංගොඩවිල වනාත පාරේ අංක 96/A දරණ ස්ථානයේ පිහිටි ඉමාෂි මුද්‍රණාලයේ මුද්‍රණය කර ප්‍රසිද්ධ කරන ලදී.